ධර්ම දානය පිණිසයි

# මුල් බුදු සමය සොයාගත්තෙමි

සම්පාදක

පූජ්‍ය බෙල්ලන්විල ධම්මානන්ද හිමි

# මුල් බුදු සමය සොයා ගත්තෙමි

බෙල්ලන්විල ධම්මානන්ද හිමි

ප්‍රථම මුද්‍රණය : 2021

# මුල් බුදු සමය සොයා ගත්තෙමි

ධර්ම දානය පිණිසයි!

**වළගම්බා සෙනසුන**

ඊරියාව

අඹන්පොළ

කුරුණෑගල

දුරකථන : - 0713808220 valagamba.net

මුද්‍රණය:

SRIDEVI

**ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් ප්‍රයිවෙට් ලිමිටඩ්**

27, පැපිලියාන පාර, නැදිමාල.

දෙහිවල.

දුරකථන : 0112716709

## පිං පැමිණවීම

මෙම කෘතිය සකස් කළේ 2021 වස්කාලය තුළයි. වළගම්බා සෙනසුනෙ නිහඩ පරිසරය තුළදීයි. වස් කාලය තුළ සෙනසුනෙ කටයුතු පවත්වා ගෙන යමින් වැඩසිටි මාවතගම ගුණානන්ද හිමියන් විශේෂයෙන් සිහිපත් කළයුතුය. උන්වහන්සේ නිසා අපට වඩාත් විවේකයක් ලැබුනා.

සිව්පසයෙන් උපස්ථාන කළ ඊරියාව ගමේ හා අවට දායක පිරිසත් විශේෂයෙන් මතක් කරනවා. ඔවුන් උතුරුකුරු දිවයිනේ වැසියන් වගේ කියලා මෙහි වැඩසිටි ස්වාමීන් වහන්සෙ නමක් කිව්වා. මේ වසංගත කාලෙ සිව්පසයෙන් කිසි අඩුපාඩුවක් වුනේ නෑ. ටයිප් කරන්න උපකාරී වූ ගාමිණී සූරියබණ්ඩාර පවුලේ අයටත් බොහොම පිං.

දහම් ග්‍රන්ථයක් සකසන බව දැනගත් වේලාවෙම එහි බරපැන දරන්නට උත්සුක වී මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණයෙන් සහාය වූ වෛද්‍ය ලසිත මලලසේකර මහතාත් සෝදුපත් බලාදුන් තුසිත මලලසේකර මහතාත්, අනෝජා හසන්ති මැතිනියටත් මෙම කුසලය නිවන් පිණිසම වේවා!

තේජක අමිල, චමින්ද සේරසිංහ, මහින්ද වික්‍රමරත්න යන මහත්වරුත් කැනඩාවේ පදිංචි පතිරාජ පවුලේ සියලු දෙනාත් බෙල්ලන්විල ජයන්තා පද්මසීලි මැණියන් හා එම පවුලේ අයත්, තිස්ස කොතලාවල පියාණන්ට පිං පිණිස විනෝද් කොතලාවල මහතාත්, සරත් ප්‍රනාන්දු පියාණන්ට පිං පිණිස සංජීව ප්‍රනාන්දු මහතාත් මෙම කුසලයට මුද්‍රණ වියදමින් දායක වුණා.

ඒ අයගේ සියලු සම්‍යක් ප්‍රාර්ථනා සඵල වේවා! මෙම කුසලය නිවන් පිණිසම වේවා!

මෙය මුද්‍රණය කරදුන් ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් ආයතනයටත් විශේෂ ස්තුතිය පිරිනමනවා.

**බෙල්ලන්විල ධම්මානන්ද හිමි**

2021.10.04

# පෙරවදන

මේ පොත ලියනකොට මට මුලින් සිතුනා පොතේ නම ලෙස සබ්බධම්ම මූලපරියාය හෝ පරමාර්ථ කියන වචනය යොදන්න. පරමාර්ථ කියන වචනය ඇහෙනකොට සමහර කෙනෙක්ට කළු හැඟීමක් එනවා. සමහර කෙනෙකුට ගැඹුරු හැඟීමක් එනවා. ''මුල් බුදු සමය සොයා ගත්තෙමි'' කිව්වම කෙනෙක් භය වෙන්නත් පුළුවන්.

බුදු දහමින් නිරාමිස සුවයක් ලබන පින්වත් ස්වාමින් වහන්සේලා, මෙහෙණින් වහන්සේලා, උපාසක, උපාසිකාවො, බොහෝ ඇති. නිහඬ නිසල පරිසරයක උතුම් අධ්‍යාත්මික සුවයක් ලබන උත්තමයෝ ලෝකේ ඕනතරම් ඇති. ඒ අයත් බුදු සසුනේ සැබෑ අර්ථය සොයාගත් අය.

මේ පොත අවසානය දක්වා කියෙව්වොත් ඔබට හිතේවි දාපු නම සාධාරණයි කියලා. අවසාන භාගයේ තියෙන කරුණු තේරුම් ගන්න යම් අභිධර්ම දැනුමක් තිබ්බොත් පහසු වේවි. අභිධර්මය ඉගෙන ගන්න අයට සමහර අප්‍රකට රූපාකාර ගැන අලුත් කෝණයකින් විස්තර කිරීමක් මේ කෘතිය තුල සිද්ධ වෙනවා. රූප ප්‍රවෘත්ති ක්‍රමය සිද්ධ වන ආකාරය පිළිබඳ වෙනස් අර්ථ කථනයක් මෙය තුළ අඩංගුයි.

මේ කෘතියෙහි, අනිත්‍යතාවය මෙනෙහි කිරීම සම්බන්ධව ඇති දුර්මත විවරණය කර ඇත. විදර්ශනා භාවනාවේ මූලික පදනමක්වන අනිත්‍ය සංඥාව වඩන්නේ කෙළෙසදැයි, පාඨකයන් වෙත යම් මාර්ගෝපදේශයක් ඉදිරිපත් කිරීම අපගේ ප්‍රධාන අරමුණ විය.

# පටුන


| | |
|---|---|
| සත්ව පුද්ගල දැක්ම | 01 - 05 |
| පංචස්කන්ධ විදර්ශනාව | 06 - 10 |
| රූප බෙදීම හා රූප විවිධත්වය | 11 - 19 |
| සංසාර කරකැවිල්ල හා මෝහ සිත | 20 - 22 |
| දෘෂ්ටිවල පදනම | 22 - 25 |
| වචන භාවිතය | 26 |
| මූලපරියාය සූත්‍රය | 27 - 32 |
| මඤ්ඤනා කිරීම | 33 - 35 |
| අනිත්‍ය මෙනෙහි කිරීම | 36 - 37 |
| ධර්මවල ඒකත්වය හා නානත්වය | 38 - 39 |
| අනාත්ම ලක්ෂණය | 40 |
| රහතන් වහන්සේ ලෝකය දකින හැටි | 41 - 43 |
| අභිධර්මය | 44 |
| අනිත්‍ය මෙනෙහි කිරීම | 45 |
| පරමාර්ථ | 46 - 57 |
| නාම රූපවල වෙනස | 52 - 53 |
| පරමාර්ථවල ආයුෂය | 56 |

| | |
|---|---|
| බුදු දහමේ ලොකු රූප | 58 - 63 |
| රූප කළාප | 64 - 66 |
| සළායතන විදර්ශනාව | 67 - 71 |
| රූපයක ආයු කාලය හා ක්ෂණ භංග | 71 - 77 |
| ජරතා රූපය | 78 - 81 |
| සමුදයවය සහ උප්පාදක්ඛණ භංගක්ඛණවල වෙනස | 82 - 86 |
| අලුතෙන් රූප හැදෙන හැටි | 87 - 94 |
| විඤ්ඤාණවාදය | 95 - 113 |
| පඤ්ඤත්ති වචනය අවභාවිතය | 97 - 104 |
| රූපය යනු සිතේ මැවීමක්ද | 104 - 109 |
| ඇස කන ආදි රූප සිත සමග පහළ වී සිත සමග බිඳී යයිද? | 109 - 112 |
| පුද්ගලයින් හඳුනාගැනීම | 113 - 114 |
| අවසානය | 114 - 116 |
| අධෝ ලිපි | 117 - 131 |

# නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

අදින් අවුරුදු 2600 කට පෙරාතුව ලෝකේ මහා ආශ්චර්යක් සිද්ධ වුණා. මහා මුනිවරයෙක් බිහිවෙලා, කවදාවත් ඇසූ විරූ නැති පුදුම සහගත ධර්මයක් දේශනා කරන්න පටන්ගත්තා.

ඒක අහපු මිනිස්සු අලුත් විධියකට ජීවිතය ගැන කල්පනා කරන්න පටන් ගත්තා. ජීවිතය ගැන අලුත් දැක්මක් ඇතිවුනා. ඒ දර්ශනයත් එක්ක සියළු දුක් නැතිකරන මාර්ග යක් උදාවුණා. උතුම් සැනසීමක් විමුක්තියක් දෙව් මිනිසුන් අත්විඳින්න පටන් ගත්තා. ජීවිතයේ සියළු ප්‍රශ්න වලට විසඳුමක් ලැබුණා. ඒ නිසා දෙව් මිනිසුන් බුදුරජාණන් වහන්සේ සරණ ගියා.

ඒ විමුක්තියට ප්‍රතිපදාවක් ඒ මුනිවරයා දේශනා කළා. ඒ ප්‍රතිපදාවේ යද්දි ලෝකය ගැන කල්පනා කළ යුතු ආකාර තුනක් පෙන්වා වදාළා. ලෝකය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙස දකින්නටයි බුදු රජාණන් වහන්සේ අනුශාසනා කලේ නිතරම.

මේ ත්‍රිලක්ෂණය ගැන බෞද්ධයන් නිතර කථා වෙනවා. බුද්ධ කාලෙන් ශතවර්ෂ කිහිපයකට පස්සේ මිලින්ද රජතුමයි නාගසේන මහ තෙරුන් වහන්සෙයි අතර මෙයින් අනාත්ම ලක්ෂණය පිළිබඳ ගැඹුරු සංවාදයක් ඇතිවුණා.

එක පැත්තක අසූ දහසක් භික්ෂුන් වහන්සේලා අනික් පැත්තේ දහසක් ග්‍රීක අමාත්‍යවරු. පිළිසඳර කථාව යන

අතරේ රජතුමා අහනවා ඔබවහන්සේගේ නම මොකක්ද කියල.

'' 'නාගසේන කියලා' දෙමව්පියන් නම්කලා. නාගසේන කියලා අනෙක් භික්ෂූන් මාව හඳුන්වනවා. ඒක නාම මාත්‍රයක් විතරයි. මෙතන පුද්ගලයෙක් විද්‍යමාන වෙන්නෙ නෑ.''

එහෙම කිව්වා විතරයි රජතුමා පටන් ගත්තා ප්‍රශ්න මාලාවක්.

ඉඳින් පුද්ගලයෙක් විද්‍යමාන වෙන්නෙ නැත්නම් කවුද සිල් රකින්නෙ? කවුද භාවනා කරන්නෙ? කවුද මාර්ගඵල සාක්ෂාත් කරන්නෙ? කවුද පස්පව් කරන්නෙ? . . . .එහෙමනම් කුසලයකුත් නෑ, අකුසලයකුත් නෑ, කුසල අකුසල කර්ම කරන්නෙක් නෑ,......ස්වාමීනි නාගසේනයනි, එවිට ඔබවහන්සේට ආචාර්යවරයෙක් නෑ, උපාධ්‍යයන් නෑ, උපසම්පදාවත් නෑ.

නාගසේන කියලා අනෙක් භික්ෂූන් ඔබව හඳුන්වනවා යැයි යමක් කීවේද, කුමක්ද එතන නාගසේන කියන්නේ ?

නාගසේන කියන්නේ කෙස් ද ?

නාගසේන කියන්නේ ලොම්ද, නියද ..... මසද, නහරද, අස්ථිද ....?

නාගසේන කියන්නේ රූපයද

නාගසේන කියන්නේ වේදනාවද, සංඥාවද, සංස්කාරද විඥ්ඥාණයද ?

එහෙම නැත්නම්

නාගසේන කියන ශබ්දයද නාගසේන කියන්නේ ?



සත්ව පුද්ගල දැක්ම

ඥාණය සොයාගෙන යනකෙනාට මේක රසවත් කථාවක්. සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවද නැද්ද ඒක ගැනයි මේ ප්‍රශ්නේ. අනාත්ම ස්වභාවය ගැනයි මේ කථාකරන්නේ. මේක රස කථාවක් විතරක් නෙමෙයි ලෝකය ගැන ජීවිතය ගැන ගැඹුරින් සිතන්න හොඳ තැනක්.

මේ අහපු ප්‍රශ්න ටික තමන් වෙත යොමු කරලා බලන්න ඕනැ. 'මම' කියන්නේ ඇත්තටම මොකක්ද කියලා.

'මම' කියන්නේ මේ ශරීරයද? තමන්ගේ ශරීරය අනිත් අයගේ වගේ නෙවෙයි. තිරිසනකුගේ වගේ නෙවෙයි. ගැහැණු හෝ පිරිමි බවක් තියෙනවා. උස, මහත, හමේ වර්ණය, අනෙකුත් අඟ පසඟ පිහිටලා තියෙන විදිය බැලුවාම තමන්ට ආවේණික බවක් තියෙනවා. ශරීරයේ තියෙන ලෙඩ රෝග ගත්තත් එහෙමයි. ඉතින් මේ ශරීරය මටම සුවිශේෂයි කියලා හිතෙන එක සාධාරණයි වගේ. ඒත් මේකේ අනිත්‍යතාවය සැළකුවාම තමයි ගැටළුවක් එන්නේ.

වේදනාව ගත්තහම තමන් අත්විඳින වේදනා වෙන කෙනකුට දෙන්න බෑ. තමන්ටම ආවේණික බවක් පෙනෙනවා. හැඳිනීම ගත්තත් එහෙමයි. මව්පියන් දකිනකොට ඔබට එන හැඳිනීම ඔබට විතරයි. වෙන කෙනෙක් ඔබේ මවුපියන් මනුස්සයන් ලෙසින් හඳුනා ගත්තත් තමන්ගේ මවුපියන් ලෙස හඳුනාගන්නේ නෑ. ඉර හඳ වගේ වස්තු හඳුනාගන්නා විදියේ නම් යම් සමානත්වයක් තියෙනවා. නමුත් සමහර සංඥාවල තියෙන ආවේණික බව නිසා ඒ මත මමත්වය ගොඩනැගෙනවා.

සංස්කාර කියලා ගැනෙන තරහා, ආශාවන්, බලාපොරොත්තු, කල්පනා කරන විදි, චේතනා, මේ වගේ මානසික ධර්මවලත් තමන්ට ආවේණික ගතියක් තියෙනවා

වාගේ පෙනෙනවා. තමන් ආශා කරන දේ නෙවෙයිනේ හැමෝම ආශා කරන්නේ. ඔබ හිතන විදියට නෙමෙයි අන් අය හිතන්නේ.

හැබැයි මේ සියල්ලේ අනිත්‍ය ස්වභාවය සළකනකොට ඒවත් මම හෝ මගේ ආකාර කියලා ඒකාන්තයෙන් කියන්න බැරි තත්වයක් තියෙන්නේ.

ඊළගට විඤ්ඤාණය, ඒ කියන්නේ දැනීම. ඇස කන ආදිය ඔස්සේ අවට පරිසරය ගැන, තම ශරිරය ගැන කෙනෙක් දැනුවත් වෙනවා. අතිතයේ වෙච්ච සිද්ධි ගැන තියෙන දැනුම, සමාජයේ අන් අය ගැන, යම් යම් විෂයයන් ගැන ඇති දැනුම, මේ නිසාත් පුද්ගලයන්ගේ වෙනස් බවක් පැනවෙනවා. හැබැයි ඒකෙත් අනිත්‍ය සැළකුවහම එතනත් ගැටළුවක්. ගිය ජීවිතයේ ලෝකය ගැන තිබ්බ දැනුම දැන් නැහැනේ. (ඒ ඒ වෙලාවේ හටගෙන නැතිවී යන දැනීම ගැන, සාමාන්‍යයෙන් මිනිස්සු පිඩු කරලා දැනුම කියලා කියනවා)

මේ සත්ව පුද්ගල හැඟීමයි, ස්කන්ධ පහයි අතර යම් සම්බන්ධයක් තියෙන බවයි පෙනෙන්නෙ. ලෝකෙ සත්‍ය වශයෙන් තියෙන්නෙ මොනවද නැත්තෙ මොනවද කියන තැනටයි මේ කාරණය යොමුවෙන්නෙ. මේක විදර්ශනා භාවනාව කියන මාතෘකාවෙදි නිතර මතුවන කාරණයක්. සමහර කෙනෙක් පරමාර්ථ සම්මුති කියලා කථාකරන්නෙ මීට සම්බන්ධ කාරණයක්.

අනාත්ම ලක්ෂණයයි පරමාර්ථ සම්මුති කථාවයි අතර සම්බන්ධය ඔබට නොතේරුනා නම් කළබල වෙන්න එපා. අනිත්‍යතාවය, අනාත්ම ස්වභාවය, පරමාර්ථ කථාවෙ අගමුල, මේ කෘතිය තුළ විවරණය වෙනවා. අනිත්‍ය





දකින්න ඕන කොහොමද, ආත්ම හැඟීම කඩන්න ධර්ම බෙදන්න ඕන කොහොමද කියලා මෙහිදී විවරණය කරන්න බලාපොරොත්තු වෙනවා.

සත්‍ය වශයෙන් විද්‍යමාන දේ සඳහා පරමාර්ථ යන වචනය අභිධර්මය තරමක් දුරට හෝ දත් බෞද්ධයන් නිතර යොදනවා දකින්නට ලැබෙනවා. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධ ධර්මයන් පරමාර්ථ වශයෙන් විද්‍යමානවන අයුරින් පුද්ගලයෙක්, ආත්මයක් විද්‍යමාන වේ දැයි යන කරුණු බෞද්ධයන් අතර නිතර කතාබහට ලක්වනවා. මෙම න්‍යාය යොදාගෙන සත්ව පුද්ගල දෘෂ්ටිය දුරු කරගැනීමට බෞද්ධයෝ වෙහෙසෙනවා. විදර්ශනා භාවනාවට අතිශයින් සම්බන්ධ මෙම න්‍යාය ගැඹුරින් විමසිය  යුතුයි.

මොග්ගලීපුත්ත මහරහතන් වහන්සේ සම්පාදනය කළ කථාවත්ථුපකරණයේදී පුද්ගල ආත්ම දෘෂ්ටි ඛණ්ඩනය කරනු වස් විචිත්‍ර වූ නය ක්‍රම සමුදායක් දක්නට තියෙනවා. සංයුක්ත නිකායේ ඛන්ධ වර්ගයේ එන යමක, අනුරාධ සූත්‍රයන්හිදීත් මීට අදාළ වැදගත් කරුණු මතුකර ගන්න පුළුවන්.

එහිදී බුදුහිමියන් අනුරාධ ස්වාමීන් වහන්සේටත්, සැරියුත් හිමියන් යමක ස්වාමීන් වහන්සේටත් පෙන්වා දෙනුයේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වූ පඤ්චස්කන්ධ ධර්මයන්ගේ හට ගැනීමත් නැති වීමත් හැරෙන්නට රහතන් වහන්සේ (තථාගත) කියා හෝ සත්‍යය  වශයෙන් සාර ලෙසින් ගත යුත්තක් නැති බවයි.

යමක හිමියන්ට තිබුණේ, රහතන් වහන්සේ මරණින් මතු නොවේ යැයි දැක්මක්. අනික් ස්වාමීන් වහන්සේලා ඒක බොහොම වැරදි දෘෂ්ටියක් ලෙස කල්පනා කළා. කථාබහ

කරළා ඒක වෙනස් කරන්න උත්සාහ කළා. බැරිවුන තැන සැරියුත් හිමියන්ට කාරණය සැළකලා. එතන ඉඳන් සූත්‍රයේ තියෙන්නෙ මෙහෙමයි. [1]

---

ඉක්බිති සැරියුත් තෙරණුවෝ හවස් වරුවෙහි සමවතින් නැගී සිටියේ යම් තැනක යමක තෙම වේද එතනට එළඹුනහ. එළඹ පිළිසඳර කථා නිමකොට එක්පසෙක හුන්නේය. එක්පසෙක සිටි සැරියුත් හිමියන් ආයුෂ්මත් යමකගෙන් මෙසේ විචාළේය. ඇවැත්නි යමකය, ඇත්තද මේ ඔබට යමකය මෙවන් පාප දෘෂ්ටියක් ඉපදුනාද? ''යම් සේ භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ ධර්මය මම දනීද, ඊට අනුව ඛීණ ආස්‍රව භික්ෂුව කය බිඳීමෙන් සිඳී වැනසේ මරණින් මතු නොවේ කියා.''

ඇවැත්නි "යම්සේ රහත් මහණ කය බිඳීමෙන් සිඳේද වැනසේද, මරණින් මතු නොවේද, භාග්‍යවතුන් වහන්සේ එසේ දේශනා කරන ලද ධර්මය මම දනිමි "

ඇවැත්නි යමකය කුමක්ද හැගෙන්නේ? රූපය (ශරීරය) නිත්‍ය ද අනිත්‍ය ද?

අනිත්‍යයි ඇවැත්නි

යමක් අනිත්‍යද එය දුකක් ද සැපක් ද?

දුකක් ඇවැත්නි

යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස්වන (විපරිණාම) ස්වභාව ඇත්නම් එය මගේය එය මම වෙමි එය මගේ ආත්මය යැයි දක්නට සුදුසුද ?

---

1. **සූත්‍රයේ සම්පූර්ණ පරිවර්තනය අධෝලිපි 1 යටතේ පිටු අංක 117 හි ඇත.**





නැතමය ඇවැත්නි.

වේදනා -සංඥා, සංස්කාර, විඤ්ඤාණය නිත්‍ය ද අනිත්‍යද? අනිත්‍යයි ඇවැත්නි

යමක් වනාහි අනිත්‍ය නම් එය දුකක්ද සැපක්ද?

දුකක් ඇවැත්නි.

යමක් අනිත්‍ය, දුක් පෙරළෙන ස්වභාව ඇත්නම් එය මාගේය එය මම වෙමි, එය මාගේ ආත්මය යැයි දක්නට සුදුසුද?

නැතමය ස්වාමීනි.

එබැවින් ඇවැත්නි යමකය, අතීත අනාගත වර්තමානවූ අධ්‍යාත්මික හෝ බාහිර හෝ ඕලාරික හෝ සියුම් හෝ හීන හෝ ප්‍රණීත හෝ යම් රූපයක් ඇත්ද දුර හෝ ළග හෝ යම් රූපයක් ඇත්ද ඒ සියලු රූප "ඒවා මගේ නෙමෙයි, එය මම නොවෙමි, එය මාගේ ආත්මය නොවේ යැයි, තත්වාකාරයෙන් මනා නුවණින් දත යුතුයි. යම්කිසි වේදනාවක් --පෙ--සංඥාවක් --පෙ-- සංස්කාරයක් --පෙ- -යම්කිසි අතීත අනාගත වර්තමාන අධ්‍යාත්මික හෝ බාහිර ඕළාරික හෝ සියුම් හීන හෝ ප්‍රණීත දුර හෝ ළග යම් දැනීමක් (විඤ්ඤාණයක්) වේද ඒ සියල්ල "ඒ මාගේ නෙවෙයි. ඒ මම නොවෙමි. එය මගේ ආත්මය නොවේ" යැයි තත්වාකාරයෙන් මනා නුවණින් දතයුතු.

ඇවැත්නි එසේ දකින ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි කළකිරෙයි. වේදනාවෙහි කළකිරෙයි, සංඥාවෙහි කළකිරෙයි, සංස්කාර කෙරෙහි කළකිරෙයි, විඤ්ඤාණයෙහි කළකිරෙයි. කළකිරුනේ නොඇලෙයි නොඇලුනේ මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යැයි ඤාණය වෙයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචරියාව

වාසයකොට නිමවන ලදි. කළයුතු දේ කරණ ලදි. අර්ථය පිණිස අනෙකක් නැතැයි නන් අයුරින් දැනගනී.

(මෙලෙස ස්කන්ධ විදර්ශනාවෙන් යමක හිමියන් කුළු ගැන්වීමෙන් අනතුරුව සැරියුත් හිමි මෙසේ විචාළේය.)

ඇවැත්නි යමකයෙනි කෙලෙසද හිතන්නේ, රූපය තථාගතයන් (රහතන් වහන්සේ) කියා දක්නෙහිද?

නැතමය ස්වාමීනි.

වේදනාව-සංඥාව-සංඛාර-විඤ්ඤාණය තථාගතයන් යැයි දක්නෙහිද ?

නැත ස්වාමීනි.

රූපයෙහි රහතන් වහන්සේ ඇතැයි හැඟෙන්නෙහිද?

නැත ස්වාමීනි.

රූපයෙන් පරිබාහිරව රහතන් වහන්සේ ඇතැයි හැඟෙන්නෙහිද ?

නැත ස්වාමීනි.

වේදනාවෙහි -- පෙ -- වේදනාවෙන් පරිබාහිරව -- සංඥාවෙහි -- සංඥාවෙන් පරිබාහිරව -- සංස්කාරයෙහි -- සංස්කාරයෙන් පරිබාහිරව -- විඤ්ඤාණයෙහි -- විඤ්ඤාණයෙන් පරිබාහිරව රහතන් වහන්සේ දක්නෙහිද ?

නැත ස්වාමීනි.

ඇවැත්නි යමකයිනි... රූපය, වේදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාණය (මේ සියල්ල) රහතන් වහන්සේ යැයි දක්නෙහිද ?

නැත ස්වාමීනි.





අවසාන වශයෙන් සැරියුත් හිමියන් විමසුවේ - රූප නොවූ, සංඥා නොවූ, වේදනා නොවූ, සංස්කාර නොවූ, විඤ්ඤාණ නොවූ, යම් ධර්මයක් රහතන් වහන්සේ වේද? යනුයි.

නැතමය ස්වාමීනී යැයි එයටද යමක හිමියන් පිළිතුරු දුනි.

---

මේ ප්‍රශ්න උත්තර ක්‍රමය විදර්ශනා මාර්ගයක් පෙන්වා දෙනවා. ජීවිතයට සම්බන්ධ ධර්මයන්ගේ අනිත්‍යතාව මතක් කර දෙනවා. ඒ අනිත්‍ය මනසිකාරයෙන් දුක පිළිබඳ හැඟීමක් ජනිත කරවනවා. ඒ දෙකම යොදාගෙන අනාත්ම ලක්ෂණය ඉස්මතු කරවනවා.

අනුරාධ සූත්‍රයෙත් තිබුනෙ මේ ක්‍රමයමයි. මේ දේශනා විලාසයමයි. මේක රහතන් වහන්සේට විතරක් නෙවෙයි සාමාන්‍ය සත්ව පුද්ගල හැඟීම් වලටත් අදාළයි.

ඉතින් අවසානයේ සැරියුත් හිමි මෙසේ අසයි.

"එත්ථ ච තේ ආවුසෝ යමක දිට්ඨේව ධම්මේ සච්චතෝ ථේතතෝ තථාගතේ අනුපලබ්භියමානේ කල්ලං නු තේ තං වෙය්‍යාකරණං'' " තථාහං භගවතා ධම්මං දේසිතං ආජානාමි යථා ඛීණාසවෝ භික්ඛු කායස්ස භේදා උච්ඡිජ්ජති විනස්සති න හෝති පරම්මරණාති ? ''

මෙහිලා ඇවැත්නි, යමක දිටුදැම්යෙම (ඇස් පනාපිටම) සත්‍ය වශයෙන් ස්ථිරසාර වශයෙන් රහතන් වහන්සේ දක්නට නොලැබෙන කල්හි යම් සේ රහතන් වහන්සේ කය බිඳීමෙන් සිඳේද, වැනසේද, මරණින් මතු නොවේද,

භාග්‍යවතුන් වහන්සේ එසේ දෙසන ලද දහමක් මම දනිමි යැයි තොපගේ පැවසීම සුදුසුද?

මෙයට පිළිතුරු දෙමින් යමක හිමියන් පැවසුවේ, එම වැරදි දෘෂ්ටිය ප්‍රහීන වූ බවත්, ධර්මය ද අවබෝධ කරගත් බවත්ය (සෝතාපන්න). ඒ හමුවීම අවසානයේ උන්වහන්සේ රහත් විය.

විශිෂ්ට නුවණකින් සැමවිට ලෝකය දක්නා, එක දිගට පවත්නා රහතන් වහන්සේ කෙනෙක් ගැන චිත්‍රයක් යමක හිමියන්ගෙ හිතේ තියෙන්න ඇති. එසේ කාලයක් පුරාවට ඉන්න රහතන් වහන්සේ එකපාරටම නැතිවෙනවා කියන එකයි මෙතන මිථ්‍යා දෘෂ්ටිය.

මේ ප්‍රශ්න ඔක්කොටම ''නැත'', ''නැත'' කියලා පිළිතුරු ලැබෙන කොට, කෙනෙකුට ධර්ම නානත්වය මඟහැරෙන්න පුළුවන්. හැබැයි රහතන් වහන්සේ කෙනෙකුට අදාළ සුවිශේෂී නාම ධර්මවල සාමාන්‍ය පුද්ගලයෙකුට වඩා වෙනසක් ඇතිබව අමතක නොකළ යුතුයි.

රූපය, වේදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාණය (මේ සියල්ල) ජීවිතයක් පුරා සම්බන්ධ ක්‍රියාවලිය රහතන් වහන්සේ හෝ පුද්ගලයා වෙන්න බැරිද කියලා කෙනෙකුට හිතෙන්න පුළුවන්. නමුත් ක්‍රියාවලියක් එකවිට නැහැනෙ. වර්තමානය හටගෙන ඇතිවිට අතීත අනාගතය නැහැ.

බොහෝ දෙනෙකුට සමස්තයක් ලෙසින් රූප වේදනා ආදිය අනිත්‍ය ලෙසින් මෙනෙහි කොට ඒවායේ ආත්ම සාරයක් නැති බව කිව හැක. නමුත් සිදුවන පටිච්චසමුප්පන්න ක්‍රියාවලිය, දැන් ජීවිතය ගත වෙන හැටි, ආත්ම සාරයක් නැතිනම් වෙන්නෙ මොකක්ද කියලා, ඒක පැහැදිලිව දකින එක පහසු නෑ.





ඒ ඒ හේතූන්ට අනුව ඒ ඒ ඵල ලැබෙන බවත්, ඒ ඒ හේතුන් තිබීම එම ඵලය ඉපදීමට ප්‍රමාණවත් බවත්, එම හේතුන් නොමැතිනම් එම ඵලය කිසිසේත් නොලැබෙන බවත් දැන ගැනීම පහසු නොවේ. අවසාන ප්‍රශ්නයට පිළිතුරු දීමට මෙවන් දැනුමක් විශිෂ්ට ඤාණයක් අවශ්‍ය බවයි පෙනෙන්නට තියෙන්නේ. එනම් රහතන් වහන්සේ නැතැයි කීවාට, වෙන්නේ මොකක්ද කියලා, මොකක්ද තියෙන්නෙ කියලා දැනගත් බවක් යමක හිමියන්ගේ අවසාන පිළිතුරෙන් ගම්‍ය වෙනවා.

මෙසේ පංචස්කන්ධය අනන්‍ය වශයෙන් තේරුම් ගෙන ජීවිතය විදර්ශනාවට ලක් කිරීම ඉතා වැදගත්. හැබැයි මේ බෙදිල්ල ටිකක් පරිස්සමෙන් කරන්න ඕනෑ.

යම්කිසි රූපයක් පමණක් ගෙන එහි කොටස් දක්වා මුල් රූපය නැතැයි කියන ක්‍රමයක් අද අභිධර්ම න්‍යායක් ලෙසින් ප්‍රචලිතව පවතිනවා. එතැන නම් මොකක් හරි පටලැවිල්ලක් තියෙන බවයි පෙනෙන්නේ.

සැරියුත් හිමියන් දිනක් භික්ෂූන් අමතා ඇතෙකුගේ පාදය උපමා කොට දහම් දේශනාවක් ඇරඹුවා. එම දේශනාවේ දී රූපය හෙවත් ශරීරය ගැන සඳහනක් කළා. ඒ මෙහෙමයි ,

"සෙය්‍යථාපි ආවුසො කට්ඨඤ්ච පටිච්ච වල්ලිඤ්ච පටිච්ච තිණඤ්ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච ආකාසෝ පරිවාරිතෝ ත්වේව සංඛං ගච්ඡති; ඒවමේව ඛෝ ආවුසෝ අට්ඨිඤ්ච පටිච්ච නහාරුඤ්ච පටිච්ච මංසඤ්ච පටිච්ච චම්මඤ්ච පටිච්ච ආකාසෝ පරිවාරිතෝ රූපත්වේව සංඛං ගච්ඡති. ''

මහාහත්ථිපදෝපම සූත්‍රය -- මජ්ඣිම නිකාය

''ඇවැත්නි, දැව දඬු නිසාත්, වැල් ද තෘණ ද මැටි ද නිසාත් අහසින් පිරිවරන ලදුව ගෙය යැයි පැනවීමට යත් ද, එලෙසින්ම ඇවැත්නි, අස්ථි ද, නහර ද, මස ද, සමද නිසා අහසින් පිරිවරන ලදුව රූපය යැයි පනවනු ලැබේ''.

මෙය සරලව ශරීරය පිළිබඳ කළ අර්ථ දැක්වීමක්.

දැන් අපි මෙහෙම කිව්වොත්,

"නහර, මස, සම, අස්ථි, යනාදිය එකිනෙක වෙන වෙනම සැලකූ විට ඒ කිසිවක් ශරීරය නොවේ. ඒවා වෙන් කොට ගොඩක් ගසා තිබුණද ශරීරය යැයි නොකියති."

මෙතෙක් ගැටළුවක් නැහැ. පටලැවිල්ල වනුයේ ඊළඟ වාක්‍යයේ සිටය.

''එහෙයින් ශරීරයේ කියා අමුතු දෙයක් නැත. සැබෑවට ඇත්තේ ලේ, මස්, අස්ථි, හා නහර පමණය. ''

බැලූ බැල්මට තර්කයට, බුද්ධියට, විපස්සනාවට ගැළපෙන කතාවක් වගේ. නමුත්, මෙය අවුලක් වන්නේ මෙම තර්ක ක්‍රමයට මස්, අස්ථි, නහර තවදුරටත් බෙදාගෙන යන විටයි.

දැන් කවුරු හරි මෙහෙම තර්ක කළොත්;

"ලේ, මස් ආදිය සෑදී තබෙන්නේ සෛල සමුදායකිනි. ඒ නිසා ලේ මස් අස්ථි ආදිය සැබෑවට නැත. තවදුරටත් සෛල යනාදිය තුළ තිබෙන්නේ සියුම් රූප කලාප සමුදායකි. (රූප කලාප පිළිබඳව විවරණයක් පසුව ඇත.) සැබෑවට සෛල කියා දෙයක් නැත. ඊට එහාට බෙදන්නට නොහැක. එය බුද්ධ ඤාණයට ගෝචර වූ සියුම්ම ස්වභාවයයි."





මෙය රූප කලාපයකට ප්‍රශ්නය බාර දී පැන යාමක් නොවේද? විදර්ශනාවේදි තහවුරු කරගතයුතු කාරණයක් වන මෙය බුද්ධඤාණයට බාරදී අපට පැන යා නොහැකිය.

මෙම තර්ක ක්‍රමයේ බැරෑරුම්කම තේරෙන්නේ ලේ මස් අස්ථි ආදිය නැති නිසා අනිත්‍ය දුක්ඛ ධර්මයන් නොවන බව කී විටය. සමහර අය එහෙමත් කල්පනා කරනවා. ලේ මස් නහර අස්ථි, මනුස්ස ශරීරය, පුටු, මේස, මේවා හැබෑවට නැහැ. මේවා සම්මුති. මේවා පඤ්ඤත්ති. සැබෑවට හටගෙන නැතිවන්නෙ වෙන රූප.

විදර්ශනා භාවනාව සම්බන්ධව මෙතන ලොකු ප්‍රශ්නයක් මතුවෙනවා. විශේෂයෙන් රූප අනිත්‍ය ලෙස මෙනෙහි කරන්න ගියහම. රූප අනිත්‍ය ලෙස මෙනෙහි කරන්න ඉස්සෙල්ලා රූප සොයාගන්න වෙනවා. ඉතින් ඉදිරියට එන පිටු කිහිපය සාවධානව කියවන්න. එක පාරටම තද තීරණයක් ගන්න එපා.

ශරීරය නැතැයි කීවේ, ලේ මස් ආදිය පමණක් සැබෑවට ඇතැයි සළකාගෙනය. නමුත් දැන් සියුම් පරස්පරයකි. සැරියුත් හිමියන් වදාළ එම පාඨය දැන් මෙම තර්ක ක්‍රමයට අනුව කිව යුත්තේ මෙලෙසිනි.

"ඇවැත්නි, නැති මසකුත්, නැති නහරත්, නැති අස්ථීත්, නැති සමත්, නිසා අහසින් පිරිවරන ලදුව රූපය (ශරීරය) යැයි පනවනු ලැබේ. ''

එහෙම නැත්නම් සැරියුත් හිමියන්ට කියන්නට තිබුණේ

"ඇවැත්නි මසක් ඇතැයි සිතා ගත් විට නහරත්, අස්ථීන්, සමක්, ඇතැයි සිතා ගත් විට අහසත් සලකාගෙන ශරීරය කියා දෙයක් සිතෙනු ඇත. ''

නමුත් එවිට එය විඤ්ඤාණවාදයයි. රූපය හිතලුවක් ලෙස සැලකීමකි.[2]

ඇත්තෙන්ම සැරියුත් හිමියන් ඉහත කාරණය වදාළේ පංචස්කන්ධ විදර්ශනාවකට මූලාරම්භයක් ලෙසිනි. රූපය එළෙසින් අර්ථදක්වා ඉන්පසු ඇසත් වර්ණ රූපත් නිසා චක්ඛුවිඤ්ඤාණයත් ඒ සමග පහළවන වේදනා, සංඥා, සංස්කාර ආදිය ඒ ඒ ස්කන්ධ ලෙස ගෙන මේ සියල්ල පංචඋපාදානස්කන්ධයේ සංග්‍රහ කොට මෙම පහම ප්‍රත්‍යයෙන් හටගත් (පටිච්චසමුප්පන්න) ධර්ම බව මතක් කොට විදර්ශනාවෙන් කුළුගන්වා මහාහත්ථිපදෝපම දේශනාව අවසන් කරනු ලැබීය.

එහිදි උන්වහන්සේ කිසි විටකත් රූපය(ශරීරය) නැතැයි නොකීවේය. මේ විදර්ශනාව ගැන කියා දෙන වෙලාවේ නොයෙකුත් වචන මාලාවකින් නැති ශරීරයක් කුමට පනවත් ද?.

යම් රූප සමුදායක් පද්ධතියක් ලෙසින් ක්‍රියාත්මකවන විට ඒ ඒ රූපවල සුවිශේෂී බවක් දිස්වේ. ලේ සිරුර පුරා දුවද්දී ඇති ආකාරය එය රෝහලක ශීතකරණයක දමා ඇති මෙන් නොවේ. පෙනහල්ලෙන් ලෙයට රත් පැහැයක් ගෙන දෙයි. වකුගඩුවෙන් එහි විෂ ඉවත් කරනු ලබයි. ආහාර ජීරණය වී, එය ශරීරයට අවශෝෂණය වී එයින් නිපදවන තාපයෙන් ලෙය උණුසුම් වෙයි. හදවතින් ලෙයෙහි වාත පීඩනය වැඩි කරයි. හදවත ආශ්‍රිතව විශේෂ තද ගති, ලිහිල් ගති ගොඩනැගෙන්නේ ලෙයට දෙන තල්ලුව ඔස්සේය. වැඩ කරන හදවතක පඨවි ගතිය මෝචරියේ ශීතකරණයක ඇති හදවතක පඨවිය මෙන් නොවේ. නහර මස් නොවෙන්නට අස්ථි කඩා වැටෙනු ඇත.

**2 විඤ්ඤාණවාදය පිළිබඳ විස්තරයක් 95 පිටුවෙ සිට**





ලේ මස් අස්ථි අනෙකුත් අවයව සාමූහිකව ක්‍රියාත්මක වන විට ඒ ඒ ධර්මයේ විද්‍යමාන ස්වභාවය වෙනස් ය. ඒවා වෙන් කොට ශරීරයක් නැතැයි කියූ විට බොහෝ විට අපට අමතක වෙන්නෙ පද්ධතියක් වශයෙන්වන අන්තර් සම්බන්ධතාවයි. පද්ධතියක දිස්වන අනන්‍ය ආකාරයන්. රූපය රූපයට ප්‍රත්‍යවන ආකාරයයි. අමතක වනුයේ පටිච්චසමුප්පාදයයි.

දිනක් අප සේනාසනය වෙත වැඩම කර සිටි ස්වාමීන් වහන්සේ නමකට මා මෙම පටලැවිල්ල කියන්නට උත්සාහ කළේය. ඊට පටහැනිව උන්වහන්සේ මෙම ගාථාව කීය.

**"යථාහි අංග සම්භාරා**
**හෝති සද්දො රථෝ ඉති**
**ඒවං ඛන්දේසු සන්තේසු**
**හෝති සත්තෝති සම්මුති''**

මෙම ගාථාව අසා නොතිබූ මට එකපාරටම සිතුනේ මෙය බුද්ධ භාෂිතයක් විය නොහැකි බවයි. මෙය සංයුක්ත නිකායේ සගාථ වර්ගයට අදාළව වජිරා භික්ෂුණිය පැවසූවක් බව පසුව දුටිමි. මේ ගාථාව විශුද්ධි මාර්ගයේ ඇති නිසා බොහෝ දෙනා අතර ප්‍රසිද්ධයි.

දිනක් වජිරා භික්ෂුණිය අන්ධ වනයේ සිටින විට ඇයව අවුල් කිරීමට බිය පත් කිරීමට සමාධියෙන් පිරිහෙළීමට මාරයාට සිතුනේය. මාරයා ඇයට ඇසෙන සේ පැනයක් විචාරනුයේ,

**"කේනායං පකතෝ සත්තෝ , කුවං සත්තස්ස කාරකෝ**
**කුවං සත්තෝ සමුප්පන්නෝ , කුවං සත්තෝ නිරුජ්ඣති''**

**'' කවුරුද සත්ත්වයා කරන ලද්දේ**
**කොහිද සත්ත්වයා නිමවූ කෙනා**
**කොහෙද සත්ත්වයා හට ගත්තේ**
**කොහෙද සත්ත්වයා නැති වෙන්නේ ''**

සත්ව පුද්ගල දෘෂ්ටියක පිහිටා මාරයා ඇසූ පැනයට මාරයාට පාඩමක් කියා දීමට මෙන් සිත පිහිටි දෘෂ්ටියෙන් පෙරළා වික්ශේපයට පත් කිරීමට මෙන් තෙරණිය පැවසුවේ,

**'' කුමක්ද ඔබ සත්වයා යැයි සිතන්නේ**
**නුඹගේ වැරැදි දෘෂ්ටියක් නොවැ**
**සුද්ධ සංඛාර පිඩුවක් වන මෙහි**
**සත්වයෙක් නම් දක්නට නොලැබෙයි. ''**

ඉන්පසු තෙරණිය මුලින් උද්ධෘත කළ '**යථාහි අංග සම්භාරා**' ගාථාව පැවසීය.

**''නොයෙකුත් අංග සම්භාරය නිසා**
**රථය යන සද්දය වන ලෙසින් ,**
**ස්කන්ධයො ඇති විට**
**සත්වයා යැයි සම්මුතියක්නේ.''**

මෙම ගාථාවෙන් මාරයා වික්ෂේපයට පත් වූවා දැයි මම නොදනිමි. නමුත් අද නම් ලොකු අවුලක් මේ නිසා වෙති. භික්ෂුණිය උපමා රූපකව රථයක් ගැන කී කතාව බොහෝ දෙනා සත්‍ය වශයෙන් ගෙන අවයව හැරෙන්නට වාහනයක් නැතැයි කියනු දක්නට ලැබේ.

බුදුරජුන් එම ගාථාව අනුමෝදන් වූ බවකුත් මෙම සූත්‍රය අගට දක්වා නැත. බුද්ධ විෂය අචින්ත්‍යය. තුන් කල් දැක දේශිත ධර්මයෙහි පරස්පරතා නැත. නමුත් ශ්‍රාවක භාෂිත, පසුකාලීන අසන්නන් පටලවා ගන්නට වැඩිඉඩක් තියෙනවා.





අනෙක් අතට භික්ෂුණිය ඍජුවම රථයක් නැතැයි කියා ප්‍රකාශ කළේ ද නැත.

රථය ගැන කියන්නට ඇත්තේ ද ශරීරය ගැන කිවූ ටිකමය. ගොන් කරත්තයක් මෙන් නොව ඉන්ධන දහනය විද්‍යුත් හා යාන්ත්‍රික පද්ධති සමායෝගයෙන් දුවන අද කාලයේ වාහනයක් සත්‍යවශයෙන් නැතැයි මා කීවොත්, ඔළුව හොඳ නැත්දැයි අසා ගැනීමට සිදුවනු ඇත.

ක්‍රියාත්මකවන වාහනයක දිස්වන සතර මහා භූත පද්ධතිය නවතා ඇති විට දී මෙන් නොවේ. එන්ජිම තුළ තේජෝ ස්වභාවය අවස්ථා දෙකේ දී වෙනස්ය. නවතා ඇති විටදීටත් වඩා, අංගෝපාංග ගළවා ඇති විට මහා භූත වෙනස් ය. රෝදය තුළ වායු පීඩනය වාහනයට සවිකර ඇතිවිට වැඩි බව කාටත් පැහැදිලිය. මෙලෙස හමුවන අනන්‍ය වූ සතර මහා භූත පද්ධතිවලට ප්‍රයෝජනය සලකා ලෝකයා විසින් විවිධ නම් දෙනු ලැබෙති.

සතර මහා භූත පද්ධතියක් හෝ රාශියක් හෝ කියූ පමණින් රථය නැතැයි කියන්න ගියහොත් පරමාර්ථ වශයෙන් පංචස්කන්ධය ද නැතැයි කීමට සිදුවනු ඇත. එතැනද පහක් ඇති නිසාය. විදර්ශනා කරනවා කියා රූපවල විවිධත්වය ගැන අන්ධ විය යුතු නොවේ.

රූපයක කොටස් සඳහන් කොට මුල් රූපය සත්‍යවශයෙන් නැතැයි බුදු මුවින් කියන අන්දමේ වැකියක් මුළු ත්‍රිපිටකය පුරා සෙව්වත් දක්නට ලැබුනෙ නෑ. ඒ කිව්වේ අභිධර්ම පිටකයත් එක්ක.

බුදුරජුන් පැවසුවේ මහ පොළොවත් අනිත්‍ය යැයි කියාය. අනිත් රූප ගැන කවර කතාද. පොළොව සැබෑවට නැත්නම් අනිත්‍ය වූයේ කුමක් ද?

මේ කතාව තවත් තේරුම් යන්නට රහතන් වහන්සේලා දෙනමකගේ හමුවීම උපකල්පනය කරමු. සැරියුත් හිමියනුත් මුගලන් හිමියනුත් එක දිනයක හමුවී ආරණ්‍යයේ එකතු වී ඇති සිවුරු ආදී පිරිකර සංඝයාට බෙදාදෙන්නට කතිකා කරයි. සිවුරු, පාත්‍ර, දින, පුද්ගල නාම ආදිය ඔවුන්ගේ කතාවේ සඳහන් වෙයි. දැන් ඒ ඒ වචනවලින් සත්‍යාර්ථයක් නිරූපණය නොවේ නම් දෙදෙනා වහන්සේ මේ සම්ප්‍රප්ඵලාපයක්ද මේ කථාකරනුයේ? නැතිනම් රහතන් වහන්සේලා හමු වූ විට තුණ්හිභූතව සිටිත්ද? දෙදෙනා වහන්සේම අනෙකා රහත් බව දන්නේය.

රහතන් වහන්සේ නමක් පෘථග්ජනයෙක් හමුවූවිට නම් එවැනි වචන භාවිතා කළේ තමන්ට කිසි හැඟීමක් නැතිව පෘථග්ජන පුද්ගලයාට ඒ වචන වලින් යමක් හැඟෙතැයි සලකාගෙන, හරියට දෙමව්පියන් කුඩා ළමයෙකු සමග බබාගේ භාෂාවෙන් කතා කරනවා මෙන් යැයි යමෙකුට සිතෙන්නට පුළුවන.

නමුත් සැරියුත් මුගලන් ස්වාමීන්වහන්සේලා දෙනම පෞද්ගලික හමුවකදී කුමට සිවුරු, පාත්‍ර, පුද්ගල නාම යොදාගෙන කථා කළේ ද?

සැලකිලිමත්විය යුත්තේ වචනයක් කියනවිට, කියන්නාටත්, අසනවිට අසන්නාටත් එන හැඟීම පිළිබඳවය. යමක හිමියන් කථාවේ දී යොදාගත් ''තථාගත'' වචනයේ හෝ මාරයා කියූ සත්ව වචනයේ දෝෂයක් නොව ඒ ඒ වචන භාවිතා කරද්දී ඔවුන්ගේ සිතෙහි තිබුණා වූ වචනවලට දුන් අමතර අරුතෙහිය දෝසය තිබුනේ. වචනවලට දියයුතු අරුතක්ද ඇත්තේමය.

දෙවියා, මිනිසා, බල්ලා, යන වචන රහතන් වහන්සේ භාවිතා කරනුයේ අනන්‍ය වූ ධර්ම සමුදායක් (නාම- රූප





සමුදායක්) එම වචන වලින් නිරූපණය වන බව සිතෙහි දරාගෙනය. රහතන් වහන්සේලා මේ නාම- රූප සමුදාය[3] යම් ඒකත්වයකින් ගන්නා බවක් පේන්න තියෙනවා. නැත්නම් උන්වහන්සේට සිදුවනුයේ අභිධර්මයේ එන නාම රූප පිළිබඳ පිටු ගණනක විස්තරයක් දෙවියා හෝ බල්ලා වෙනුවට කියන්නටය.

නමුත් සාමාන්‍ය මිනිසුන් එම වචන භාවිතා කරන විට අනන්‍ය ධර්ම ස්වභාවයන්ට අමතරව මිථ්‍යා දෘෂ්ටියකුත් බොහෝවිට සිතෙහි දමාගෙනය කතා කරනුයේ. නාම - රූප වලින්ම ගොඩනැගුනු මිත්‍යා දෘෂ්ටියක් සිතෙහි දමාගෙනය.

සාමාන්‍ය මනුස්සයා, දෙවියාගේ හෝ බල්ලාගේ වෙනස නොදන්නවා නොවේ. බල්ලාගේ කායික මානසික ස්වභාවය දෙවියාගේ කායික මානසික ස්වභාවය මෙන් නොවන බව දන්නේ නමුත් ඊට අමතරව සංඥා විපල්ලාසයකුත් පටලවාගෙනය පෘථග්ජනයා සිතනුයේ. එම නාම රූප නිත්‍ය, සුඛ, ආත්ම, ලෙස පරාමර්ශණය කරමිනුය ඔහු කථා කරනුයේ.

මේ කථාව ඔබට හොඳින් වැටහේවි මේ සංසාර චක්‍රය ගැන කල්පනා කරහම.

දැන් අපි හිතමු මිනිහෙක් පින්දහම් කරලා ඊළඟ ආත්මයේ දෙවියෙක්වුනා කියලා.... දැන් මෙය කියවද්දි ඔබට හිතුනේ මොකද්ද? සාමාන්‍යයෙන් හිතෙන්නේ මිනිහාම දෙවියෙක්වුනා කියලා නේද?

---

**3 පංචස්කන්ධයට සමාන අර්ථයෙන් නාම - රූප වචනය මෙම කෘතිය තුළ යෙදෙන බව සළකන්න. පිටු අංක 126 අධෝ ලිපි 2 බලන්න.**

හැබැයි ටිකක් ආපස්සට කල්පනා කළොත් අපි හිතමු මිනිහා පෙර භවයේ බල්ලෙක් වෙලා හිටියා කියලා. දැන් අපි හිතන්න ඕනෙ බල්ලා දෙවියෙක් වුනා කියලද, මිනිහා දෙවියෙක් වුනා කියලද?

දෙවියාට පස්සේ බ්‍රහ්මයෙක්වුනා නම් හිතන්නේ මිනිහා බ්‍රහ්මයෙක්වුනා කියලනේ. මේ දෙකෙන් විතරක් පිළිතුරක් තෝරාගන්නවා නම්, වඩාත් සාධාරණ බල්ලා දෙවියෙක්වුනා කියන එක. ඇයි සත්තවයෝ සංසාර ගමනේ දී වැඩියෙන් ඉඳලා තියෙන්නේ සතර අපායේ නිසා.

දැන් ඔබට තේරෙනවා ඇති මනුස්ස කාලේ බලු බවක්වත් දේව බවක්වත් නැහැනේ. බල්ල කාලේ මනුස්ස බවක්වත් දේව බවක්වත් නෑ. බල්ලාගේ ශරීරය හා මනස (නාම-රූප) එක විදියක්. මිනිහාගේ තව විදියක්. බල්ලාගේ නාම-රූප තියෙනකන් මනුස්සයාගේ නාම-රූප හටගන්න බෑ. මිනිහාගේ නාම-රූප තියෙනකන් දෙවියාගේ නාම-රූප හටගන්නේ නැහැ. ඔබට දෙවියෙක් හෝ දිව්‍යාංගනාවක් වෙන්න ඕනා නම් පින් දහම් කරන්න ඕනා තමයි. හැබැයි අනිත්‍ය පැත්තෙන් කල්පනා කරහම ඉස්සෙල්ලා ඔබ මැරෙන්න ඕන. ඔව් ඔබ සම්පූර්ණයෙන්ම මැරෙන්න ඕනෙ.

සාමාන්‍ය මිනිස්සු කල්පනා කරන්නේ තමන්ට අරමුණු වන ධර්මතා අල්ලාගෙන. මිනිසා යැයි අරමුණු කළ නාම-රූප සමුදාය වැරදි ලෙස ගොනු කරගෙන එය එතන නවත්තනවා. නිත්‍ය ලෙස පිහිටුවනවා. ඊට පස්සේ දේවත්වය ඊට ඇඳනවා. එහෙමයි මිනිහා දෙවියා වෙනවා කියලා හිතුවේ. මිනිහාට බල්ලා තව විදිහකට ඇඳුවාම මේ මිනිහා තමයි බල්ලාවෙලා හිටියේ කියලා හිතනවා. මේවාට දහමේ කියන්නේ වැරදි ලෙස මඤ්ඤනා කරනවා කියලා.





සාමාන්‍ය හැඟීමක් වගේ පෙනුනට එදා බුද්ධ කාලයේ ස්වාමීන් වහන්සේලා මේ වගේ මඤ්ඤනාවක් යමක ස්වාමීන් වහන්සේට ආපු වෙලාවේ ඒකට කිව්වේ පාප දෘෂ්ටියක් කියලා. කරුණු කියලා යමක ස්වාමීන් වහන්සේගේ අදහස, අර රහතන් වහන්සේ මරණින් මතු නැතිවෙනවා කියන අදහස දුරු කරවන්න බැරිවුණ තැන තමයි ඔවුන් සැරියුත් හිමියන් ව අඬගහගෙන ආවෙ. දැන් අද කාලෙත් බෞද්ධයො හිතන්නෙ එහෙමනේ. සැරියුත් හිමියන් ඇවිල්ලා ඇහුවේ එහෙම දෘෂ්ටියක් තියෙනවද කියලා නෙවෙයි. පාප දෘෂ්ටියක් තියෙනවද කියලයි ඇහුවෙ. මේකට මෝහයත් සම්බන්ධයි. නාම-රූපයන් වැරදි ලෙස මුලා වූ ආකාරයකින් දකින නිසා.

සතිපට්ඨානයේ චිත්තානුපස්සනාවේදී රාග, ද්වේෂ, මෝහ සිත් අල්ලන්න තියෙනවා. රාග ද්වේෂ සිත් ගැනනම් බොහෝ දෙනෙකුට යම් අදහසක් තියෙනවා. යම් මට්ටමින් අඳුනාගන්නවා. ඒවා නැත්තටම නැති කරලා දාන්න බැරිවුණත් හිතේ මතුවෙන කොට ප්‍රහාණය කරන්නට උත්සාහ කරනවා. නමුත් මෝහය කුමක්ද?

මෝහය සම්බන්ධ වෙච්ච සත්ව පුද්ගල හැඟීම් හටගන්න කොට ඒවා සම්මුතියක් කියලා උපේක්ෂා වෙනවා. සමහර විට මමත්වය පුද්ගල හැඟීම් නැතිව ජීවත්වෙන්න බැරි යැයි සිතනවා වෙන්නත් පුළුවන්.

මේවා සම්මුති නෙවෙයි අකුසල්.

එක්කෝ අවසානයේ එකපාරටම දර්ශනය පහළ වෙලා සියුම් අනිත්‍යතාවයක් දැකලා ඒවා ප්‍රහාණය වෙයි කියලා හිතනවා.

රාග ද්වේෂ වගේම මේ පුද්ගල හැඟීමුත් සිතේ මතුවෙනකොට නැත්තටම නැතිකරගන්න බැරි වුනත් ඒ ඒ වෙලාවේ යටපත් කරන්න උත්සහවත්ත වෙන්න ඕනෑ.

ඒකට ක්‍රමය තමයි අනිච්චානුපස්සනාව. නාම-රූප ගැන යම් මට්ටමකට තේරුම් අරගෙන ඒවායේ අනිත්‍ය ස්වභාවය මෙනෙහි කිරීම කළ යුතුය. හරියට අභිධර්මය ඉගෙන ගත්තොත් ඒක බොහොම පහසු වේවි. හැබැයි ත්‍රිපිටකයේ තියෙන අභිධර්මය.[4] මිනිහා හෝ තමන් පින් කරලා දෙවියෙක් වෙයි කියලා කියන්නේ යම් දෘෂ්ටියක පිහිටලා. හැමෝම හැමවිටම නෙවෙයි, ඒක නැති වෙන්නේ මිනිසා හා දෙවියා ලෙස ගන්නා ඒ ඒ නාම-රූප සමුදායන් අනිත්‍ය දුක්ඛ ඒ වගේම අනාත්ම ලෙස මෙනෙහි කිරීමෙන්.

අනමතග්ග සංයුක්තය අහල බොහෝ ස්වාමීන් වහන්සේලා රහත් වුණා. සංසාරෙ අනන්ත වාරවල හරක්, කුකුල්ලු, වෙලා මැරුණා කියල අහනකොට මේ දැන් ඉන්න මම අතීතයට, අනාගතයට සම්බන්ධ කරන එක නැවතුනා. දෘෂ්ටි කෝණය වෙනස් වුනා. ඔබ කුඩා කාලයේ මමයයි සිතුවේ කුඩා කාලයේ රූපයයි, ඒ දවස්වල සිතිවිලියි අරමුණු කරගෙන. තිරිසන් සත්තු මම කියලා හිතන්නේ උන්ගේ රූපයයි, සිතිවිලියි අරමුණු කරගෙන.

දැන් සර්ව බලධාරී දෙවි කෙනෙක් ඉන්නවා කියලා යමෙකුට අදහසක්, දෘෂ්ටියක් තියෙනවා නම් ඒක කඩන්න දිබ්බචක්ඛු ඤාණයෙන් දිව්‍ය ලෝකය බලන්න ඕනෑ නෑ. ඒ සර්වබලධාරී දෙවියන් ලෙස හැඟෙන නාම-රූප ධර්ම ටික ඒ කියන්නේ සර්ව බලධාරී දෙවියන් ගැන යමෙකුට හිතෙනකොට, ඔහුගේ රූපය ලෙස තමන් දැක්ක තමන්

**4. අභිධර්ම පිටකයට වඩා පසුකාලීන අභිධර්ම ග්‍රන්ථවල න්‍යායාත්මක වෙනස්කම් ඇත. 128 පිට අධෝ ලිපි 3 බලන්න.**





අත්විඳපු රූප ඔස්සේ උපකල්පනය කර ගන්නේ. ලෝකයේ වෙන දේවල් දැනුවත් වෙනවා, හඳුනාගන්නවා, තීරණ ගන්නවා ලෙසින් විඤ්ඤාණ, සංඥා, සංස්කාර, ආදිය ගැන තමන් දන්නා නාමධර්ම[2] ඔස්සේයි දෙවියන්ගේ මානසික පැත්ත උපකල්පනය කරන්නේ. ඒ කායික මානසික දේවල් උපකල්පනය නොකර දෙවියෙක් ගැන සිතන්න බැහැ.

අනිකෙකුගේ නාම-රූප උපකල්පනය කිරීම නෙවෙයි ගැටලුව, ඒ නාම රූප වැරදියට ගැටගහ ගත් එක. ඒ නාමරූප නිත්‍ය යැයි ගැනීම. සමහර විට නාමයෙහි රූපයත් රූපයෙහි නාමයත් ඇතුළට අමුණන එකයි දෝෂය.

මේ රූපමය හා මානසික (පංචස්කන්ධ) ධර්මයන් තමයි සියලූ දෘෂ්ටි පසුපස තියෙන්නේ කියන වැදගත් අර්ථය පෙන්නුම් කරන සූත්‍ර මාලාවක් ස්කන්ධ සංයුක්තයේ දිට්ඨි හා සෝතාපන්න වර්ගවල තියෙනවා. [5]

ඒ අවස්ථාවල බුදුරජුන් පෙන්වනවා යම්තාක් මිථ්‍යාදෘෂ්ටි වේද, එනම් මෙය මම, මෙය මාගේ ආත්මය, කියලා හරි, කර්මයක විපාකයක් නෑ, ඕපපාතික සත්වයෝ නෑ කියලා හිතෙන දසවස්තුක මිථ්‍යා දෘෂ්ටියක් හරි, යම් ධර්ම හෝ පුද්ගල ස්වභාවයක් අල්ලා ගෙන එය අනාගතයේ නිත්‍යව තිබේ කියා සළකන සාස්වත දෘෂ්ටියක් හෝ වේවා , එය අනාගතයේ නැත්තටම නැතිවේ ලෙස දකින අසාස්වත දෘෂ්ටියක් හෝ වේවා, මේ සියලූ දෘෂ්ටි හටගන්නේ :

“රූපේ ඛෝ භික්ඛවේ සති, රූපං උපාදය රූපං අභිනිවිස්ස ඒවං දිට්ඨි උප්පජ්ජති...

**2. 126 පිට අධෝ ලිපිය බලන්න.     5. දිට්ඨි වර්ගයේ ඒතං මම සූත්‍රයේ සරල පරිවර්තනයක් අධෝ ලිපි 4 සඳහන් වෙනවා.**

වේදනාය සති, වේදනා උපාදාය වේදනා අභිනිවිස්ස - සංඥාය සති... සංඛාරේසු සති.. විඤ්ඤාණං සති, විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස ඒවං දිට්ඨී උප්පජ්ජති...''

මහණෙනි, රූපය ඇති කල්හි, රූපය ඇසුරු කොට, රූපයට රිංගා, බැසගෙන -- පෙ-- වේදනාව ඇති විට --පෙ-- සංඥාව ඇතිවිට -- පෙ-- සංස්කාර ඇතිවිට --පෙ-- විඤ්ඤාණය ඇති විට විඤ්ඤාණය අල්ලාගෙන විඤ්ඤාණයට බැසගෙන මෙවන් දෘෂ්ටියක් (දෘෂ්ටින්) හටගනී.

මේ නාම-රූප ධර්මයන් සිතකට ආරම්මණ වශයෙන් එළඹ සිටින විට ඒ සිතත් සමඟ හටගන්නා දෘෂ්ටියක් ගැනයි මේ කියන්නේ. සක්කාය දිට්ඨියේ එක ආකාරයක් වන රූපය මාගේ ආත්මය යැයි (රූපං අත්තතෝ සමනුපස්සති) හැඟෙන කොට රූපාරම්මණ සිතක දෘෂ්ටිය ගැනයි කියවෙන්නේ.

(මෙම සූත්‍ර පෙළෙහිම දැක්වෙනුයේ නොයෙකුත් මිථ්‍යා දෘෂ්ටි, පංචස්කන්ධය ඇසුරු කොට එය අල්ලාගෙන එහි බැසගෙන හටගන්නා බවයි. අටුවා අර්ථකථනයට අනුගත වෙමින් '' උපාදාය සහ අභිනිවිස්ස '' පද දෙක '' නිසා සහ ප්‍රත්‍යයෙන් '' ලෙස බුද්ධ ජයන්ති ත්‍රිපිටක පරිවර්තනය තුළ සඳහන් වී ඇත. අභිනිවිස්ස යන පාලි පදයෙ අර්ථය බැසගෙන වැදගෙන යනුයි. දෘෂ්ටිසහගත සිතකට එළඹෙන ආරම්මණය ගැනයි මේ කියවෙන්නෙ. සහජාත ධර්මයන් නොවෙයි.

යම් දෘෂ්ටියක් හටගන්න කොට සහජාතව එක්ව හටගන්නා නාමධර්ම සමුදායක් තියෙනවා. ඒ දෘෂ්ටියට තුඩුදෙන සංඥාවක්, ස්පර්ශයක්, වේදනාවක්, දැනීම් ස්වභාවයක් වගේ





නාමධර්ම සමුදායක්, ඒ දෘෂ්ටිය සමග හටගන්නවා. ඊළගට සිතේ හටගැනීමට ශරීර අභ්‍යන්තරයේ යම් රූපයක් උපකාර වෙනවා. ඒකට වත්ථු රූපය කියලා කියනවා. ඒ නාමධර්ම සමුදායයි වත්ථුරූපයයි නෙමෙයි අර දෘෂ්ටි සහගත සිතට ආරම්මණ වශයෙන් එළඹ සිටියේ.

ආරම්මණයයි, සිතයි, මනාව තේරුම් ගන්න එක විදර්ශනාවට හරි වැදගත්. ආරම්මණය විනිවිද ගිහින් සිත අල්ලන්න පුළුවන්. සිත හොඳින් වටහා ගන්න පුළුවන්. සංයුක්ත නිකායෙ එන මේ සූත්‍ර මාලාවෙන් අවධානය යොමුවන්නෙ ආරම්මණය පැත්තටයි. දැන් තිරිසනෙකුට ඔය බොහොමයක් දෘෂ්ටි හටගන්නෙ නෑ. ලෝකයෙ හටගන්නා විවිධ රූපමය ආකාර හා මානසික ස්වභාවයො මනුස්සයන්ගේ තරමට ඒ සත්වයන්ට ඉලක්ක වෙන්නෙ නෑ. අරමුණු වන්නෙ නෑ.

සක්කාය දිට්ඨියේ තව ආකාරයක් වන ''රූප වන්තං වා අත්තානං '' කියනකොට නාම-රූප සමුදායක එල්ලිලායි ඒ දෘෂ්ටිය හට ගන්නේ.

ඊළගට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ පංචස්කන්ධ ධර්මයන් අරමුණු කරලා පරාමර්ශනය නොකළා නම් මේ දෘෂ්ටි කිසිවක් හටගන්නේ නෑ නේද කියලා. එතකොට මේ දෘෂ්ටි කඩාගන්න ක්‍රමය තමයි මේ පෙන්නන්නේ. ඒකයි ඒ සූත්‍රවල අග කොටසින් පඤ්චස්කන්ධ ධර්මයන් ත්‍රිලක්ෂණයට නංවලා විදර්ශනා කරවන්නේ.

ඒ ස්වාමීන් වහන්සේලා දන්න නාම හා රූපයන් ගැන තමයි දේශනා වෙන්නේ කියලයි පේන්න තියෙන්නෙ. නාම-රූප නොදන්නකම එහෙම නැත්නම් ඒවා අරමුණු නොවීම නෙවෙයි ගැටලුව. ඒවා අරමුණු වෙද්දි ගැටගහගත්ත

එකයි අවුල. සංඥා, චිත්ත, දිට්ඨි විපල්ලාසය කියන්නෙත් මේ අවුල්වලට. බුදුරජාණන් වහන්සේ මේ දේශනය අද කාලේ කරන්න ගියානම් ගැටළුවක් මතුවෙනවා. මහණෙනි මේ රූපය අනිත්‍යයි නේද, මේ රූපය අල්ලා ගෙනත් මෙහෙම දෘෂ්ටි මතුවෙනවා කියනකොට කෙනෙක් රූප හොය හොයා කාලේ නාස්ති කරන්න පුළුවන්. සැබෑ රූප සොයමින් බෙද බෙදා වෙහෙසෙන කොට දේශනාවේ ඍජු අර්ථය ඔහුට මගහැරෙන්න පුළුවන්. රූප නැතැයි කියලා විඤ්ඤාණවාදයට යන කෙනා, එයත් රූප අනිත්‍යයි කියලා බර දාලා මෙනෙහි කරන්නෙ නෑ,

තවත් කරුණක් මේ එක්කම මතක් කරලා දෙන්නම්.

වචන හෝ වචන මාලාවක් යමෙක් භාවිත කරනවිට ඔහුගේ සිතෙහි පහළවන විවිධ හැඟීම් දැනීම් සිතිවිලි ගැන අපට අනුමාන කරන්න පුළුවන්. වචනවලට සාමාන්‍යයෙන් මිනිසුන් දෙන අර්ථ තියෙනවා. බුදුරජාණන් වහන්සේ වචනවලින් පැනවූ විශේෂ ධර්මතා ද ඇත. ස්කන්ධ ධාතු ආයතන වැනි. සාමාන්‍ය වචන ටිකක් වුණත් එක්තරා රටාවකට ඇදුවාම අසන්නාගේ කෙලෙස් අඩු වෙයි නම්, ඥාන අවබෝධය පුළුල් වෙයි නම්, ඒකට අපි ධර්ම දේශනාවක් කියලා කියනවා. අහන කෙනාට නොතේරුණත් දේශකයාගේ සිහිය දියුණු වුනා නම් ඒකත් ධර්මදේශනයක්.

මේ වචන මාලාවලින් සුවිශේෂී අර්ථ ඒ ඒ ජන සමාජය විසින් නිරූපණයවන සේ පනවාගෙන තියෙනවා. වචන කිව්වේ සද්ද රටාවකට. වචනවලට, වචන මාලාවකට අන් අයගේ සිතට එන හැඟීම් හොඳින් දත් අයට නිරුක්තියේ ප්‍රභේදගත ඥාණය හෙවත් නිරුක්ති පටිසම්භිදාව ඇතැයි කියනවා. ඒකයි බුදුරදුන්ගේ ධර්ම දේශනාවක්





සාත්ථං සබ්‍යඤ්ජනම් වන්නේ. අර්ථය විතරක් නෙවෙයි පදබ්‍යඤ්ජනත් ඒ සමාජයට ගැලපෙනවා.

හැබැයි අපි මතක් කරගන්න ඕනේ වචන භාවිතා නොකරන තිරිසන් සතුන්ටත් කෙලෙස් හටගන්නවා. අරූප ලෝකයේ සතුන්ටත් කෙලෙස් හටගන්නවා. කෙලෙස් නිසා ම වචන සෑදුනා නෙමෙයි. සංඥා නානත්වය නිසයි ව්‍යවහාර නානත්වය සෑදුණේ. ස්පර්ශ නානත්වය නිසයි සංඥා නානාත්වය හැදුනේ. ස්පර්ශ නානත්වය ධාතු නානත්වය නිසයි විද්‍යමාන වනුයේ. මේක තියෙන්නේ ධාතු සංයුක්තයේ මුල්ම සූත්‍රවල.

මෙම කෘතිය ලියාගෙන යනකොට තවත් වටිනා සූත්‍ර පාඨයක අදහස කුමක් වෙන්න ඇතිදැයි කල්පනාවුණා. මූල පරියාය සූත්‍රයේ ඒකත්තං නානත්තං කියන පද දෙක ගැනයි. මජ්ඣිම නිකායේ මුලටම මෙම සූත්‍රය රහතන් වහන්සේලා සංග්‍රහ කරන්න ඇත්තේ මෙහි විශේෂ වැදගත්කමක් ඇති නිසයි. ආපෝ, තේජෝ, වායෝ, භූත, දේව, ප්‍රජාපති, බ්‍රහ්ම, ආභස්සර, සුභකිණ්ණ, වේහප්ඵල, අභිභූ, ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤා නාසඤ්ඤායතන, දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත, ඒකත්ත, නානත්ත, සබ්බ, නිබ්බාන යන ධර්මතා (24)ක් පෘථග්ජනයෙක්, සේක්ෂයෙක්, රහතන් වහන්සේ කෙනෙක්, බුදු කෙනෙක් දැන ඇඳින ගන්නා ආකාරය මෙම සූත්‍රයේ විස්තර වෙනවා.

මේ ලෝකයේ සියලු දෑ මෙම ධර්ම 24 තුළ කැටි වෙනවා. ඒ නිසාය මේ සූත්‍රයට සියලු ධර්මයන් ගේ මූල ආකෘතිය යන අරුත් දෙන සබ්බධම්ම මූලපරියාය ලෙස නම් තබා ඇත්තේ. හැබැයි මේ සූත්‍රය විඤ්ඤාණවාදීන්ටත්, බෙදුම්වාදීන්ටත් රුච්වන සූත්‍රයක් නෙමෙයි. බෙදුම්වාදියා

කීවේ අත්දැකිය නොහැකි සියුම් රූප පමණක් රූපයයි සිතන කෙනාටයි. [6]

පෘථග්ජනයා ඒ ඒ ධර්ම හැඳින ඒවා වැරදි ලෙස මඤ්ඤනා කරන බවත් රහතන් වහන්සේ ඒවා විශිෂ්ට ඥානයෙන් දැන හැඳිනගෙන වැරදි ලෙස මඤ්ඤනා නොකරන බවත් එහි දැක්වේ. සිංහලෙන් මඤ්ඤනා යන්නට ළඟින්ම යන්නේ 'හඟියි' යන වචනයයි.

විස්තරාර්ථීන් සඳහා මූලපරියාය සූත්‍රයේ සරළ පරිවර්තනයක් ඉදිරියට දැක්වෙනවා. මෙම කෘතියට අදාළව, ඔබ විසින් අවධානය යොමු කළ යුතු වන්නේ, මූලික ලෙස පෘථග්ජනයා සම්බන්ධ කොටසටත් රහතන් වහන්සේ සම්බන්ධ කොටසටත් පමණයි.

"මා විසින් මෙසේ අසන ලදි. ඒක් සමයක භාග්‍යවතුන් වහන්සේ උක්කට්ඨා නුවර සුභගවනයේ සාලරාජමූල වැඩ වසන අවධියේ මහණෙනි යැයි භික්ෂූන් ඇමතූසේක. ස්වාමිනි යැයි එම භික්ෂුහු පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙලෙස වදාළහ. - සියලු ධර්මයන්ගේ මුල ආකෘතිය මහණෙනි ඔබලාට දේශනා කරන්නෙමි. එය අසන්න. හොඳින් මෙනෙහි කරන්න. දේශනා කරන්නෙමි. එසේය ස්වාමිනි යැයි එම භික්ෂුහු පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

මහණෙනි, ආර්යයන් නොදකින අර්ය ධර්මයෙහි දක්‍ෂ නොවූ, ආර්ය ධර්මයෙහි නොහික්මුණු සත්පුරුෂයන් නොදකින සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ නොවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනු අශ්‍රැතවත් සාමාන්‍ය මිනිසුන් පඨවිය පඨවිය යැයි හඳුනාගනි. පඨවිය පඨවිය යැයි හඳුනාගෙන

6. අධෝ ලිපි පිටු අංක 130





පඨවිය යැයි හඟියි, පඨවියෙහි හඟියි. පඨවියෙන් හඟියි. පඨවිය මගේ යැයි හඟියි. පඨවිය ගැන සතුටු වෙයි. කුමක්ද කාරණය ? ඔහුගේ පිරිසිඳ නොදත් බව යැයි කියමි.

(පඨවිය ලෙස ඝන තද දෑ උචිත යැයි සිතමි)

ද්‍රව ද්‍රව ලෙසින් හඳුනාගනි. ද්‍රව ද්‍රව ලෙසින් හඳුනාගෙන ද්‍රවය යැයි හඟියි. ද්‍රවයෙහි හඟියි, ද්‍රවයෙන් හඟියි ද්‍රවය මගේ යැයි සිතාගනියි, ද්‍රවය ගැන සතුටු වෙයි. කුමක්ද කාරණය? පිරිසිඳ නොදත් බව යැයි කියමි.

තාපය (තේජෝ) තාපය ලෙසින් හඳුනාගනී. තාපය තාපය ලෙසින් හඳුනාගෙන තාපය යැයි හඟියි. තාපයෙහි යැයි හඟියි. තාපයෙන් හඟියි, තාපය මගේ යැයි සිතයි, තාපය ගැන සතුටු වෙයි. කුමක්ද කාරණය ඔහුගේ පිරිසිඳ නොදත් බවයි.

වායු වායු යයි හඳුනාගනි. වායු වායු ලෙසින් හඳුනාගෙන වායු යැයි හඟියි. වායුවෙහි හඟියි, වායුවෙන් හඟියි. වායුව මගේ යැයි හඟියි. වායු ගැන සතුටු වෙයි. කුමක්ද කාරණය ඔහුගේ පිරිසිඳ නොදත් බවයි.

භූත භූත යැයි හඳුනාගනි (දේව මට්ටමින් පහළ සවිඤ්ඤාන සත්වයන් භූත ලෙස අදහස් කළ බව පෙනේ.) භූත භූත ලෙසින් හඳුනාගෙන භූත යැයි හඟියි, භූතයෙහි හඟියි, භූතයෙන් හඟියි, භූත මගේ යැයි හඟියි, භූතය ගැන සතුටු වෙයි. කුමක්ද කාරණය ඔහුගේ පිරිසිඳ නොදත් බවයි.

දෙවියන් දෙවියන් ලෙස හඳුනාගනි. දෙවියන් දෙවියන් ලෙස හඳුනාගෙන දෙවියන් යැයි හඟියි, දෙවියන් කෙරෙහි යැයි හඟියි. දෙවියන්ගෙන් යැයි හඟියි. දෙවියන් මගේ යැයි හඟියි, දෙවියන් ගැන සතුටු වෙයි, කුමක්ද කාරණය? ඔහුගේ පිරිසිඳ නොදත් බවයි.

(දෙවියා ලෙස ඒකවචනයෙන් ද ගත හැකි බව පෙනේ)

ප්‍රජාපති ප්‍රජාපති ලෙසින් හඳුනාගනී. (දේව පිරිසෙහි නායකයා)..............බ්‍රහ්මයන්..............ආභස්සර දෙවියන්.............. සුභකිණ්හ දෙවියන්................ වේහප්ඵල දෙවියන්............... අභිභූ දෙවියන්.........

ආකාසානඤ්චායතනය ආකාසානඤ්චායතනය ලෙස හඳුනා ගනී....... ආකාසානඤ්චායතනය ගැන සතුටු වෙයි. කුමක්ද කාරණය ඔහුගේ පිරිසිඳ නොදත් බවයි.

විඤ්ඤාණඤ්චායතනය..පෙ..ආකිඤ්චඤ්ඤායතනය.... පෙ..නේවසඤ්ඤානාසඤ්ඤායතනය

දක්නා ලද්ද දක්නා ලද්ද යැයි හඳුනාගනී...පෙ.... අසන ලද්ද ........පහසන ලද්ද (මුතං)

දන්නා ලද්ද (විඤ්ඤාතං) දන්නා ලද්ද යැයි හඳුනා ගනී. දන්නා ලද්ද දන්නා ලද්ද යැයි හඳුනාගෙන දන්නා ලද්ද හඟියි. දන්නා ලද්දෙහි හඟියි, දන්නා ලද්දෙන් හඟියි, දන්නා ලද්ද මගේ යැයි හඟියි, දන්නා ලද්ද ගැන සතුටු වෙයි.

ඒකත්වය ඒකත්වය යැයි හඳුනාගනී........

නානත්වය නානත්වයැයි හඳුනාගනී.....

සියල්ල සියල්ල යැයි හඳුනාගනී.

නිවන නිවන යැයි හඳුනාගනී. නිවන නිවන යැයි හඳුනාගෙන නිවන හඟියි, නිවනෙහි හඟියි, නිවනෙන් හඟියි, නිවන මගේ යැයි හඟියි. නිවන ගැන සතුටු වෙයි. කුමක්ද කාරණය? ඔහුගේ පිරිසඳ නොදත් බවයි.

සාමාන්‍ය ජනයා වශයෙන් ප්‍රථම භූමියයි.





යම් මහණෙනි මේ සේඛ භික්ෂුවක් වේද, උතුම්ම තැනට තවම නොපැමිණි, අනුත්තර වූ යොගක්ෂේමය (යෙදීම්වලින් නිදහස) බලාපොරොත්තුවෙන් වාසය කරන ඔහුද පඨවිය පඨවිය යැයි වෙසෙසින් දනී (අභිජානාති) පඨවිය පඨවිය යැයි වෙසෙසින් දැන පඨවිය මඤ්ඤනා කිරීමෙන් වැළකීමට උත්සාහ දරයි. (මා මඤ්ඤි පාලි පාඨයයි) පඨවියෙහි යැයි මඤ්ඤනාවෙන් වැළකීමට උත්සාහ දරයි. පඨවියෙන් යැයි මඤ්ඤනාවෙන් වැළකීමට උත්සාහ දරයි. පඨවිය මගේ යැයි මඤ්ඤනාවෙන් වැළකීමට උත්සාහ දරයි. පඨවිය ගැන සතුටුවීමෙන් වැළකීමට ප්‍රයත්න දරයි. කුමක් හෙයින්දයත් තව දුරටත් පිරිසිඳ දත යුතු හෙයින් යයි කියමි.

ද්‍රව, තාපය, වායු, භූත, දෙවියන්, පජාපති,..................... ආකාසානඤ්චායතනය ........... දක්නාලද්ද.....අසනලද්ද ......... පහසනලද්ද......දන්නාලද්ද...... ඒකත්වය ........... නානත්වය .......... සියල්ල......

නිවන නිවනයැයි විශිෂ්ට නුවණින් දනී. නිවන නිවන යයි විශිෂ්ට නුවණක් දැන නිවන යැයි මඤ්ඤනාවෙන් වැළකීමට උත්සාහ දරයි (මා මඤ්ඤි) නිවනෙහි යැයි (මා මඤ්ඤි) නිවනෙන් (මා මඤ්ඤි) නිවන මගේ යැයි (මාමඤ්ඤි) නිවන ගැන සතුටු වීමෙන් වැළකීමට උත්සාහ දරයි.

සේඛ දෙවන භූමිය නිමයි.

........... මහණෙනි රහත් ආස්‍රව ක්ෂය වූ භික්ෂුවක් වේද බ්‍රහ්මචරියාව වැස නිමවන ලද, කළ යුතු දේ කළා, බර බහා තැබූ තමාගේ අර්ථයට පැමිණි භව බැඳීම ක්‍ෂය වුනාවූ මනාව දැන මිදුණා වූ ඔහුත් පඨවිය (තද ඝන) පඨවිය ලෙස විශිෂ්ට නුවණින් දනී. පඨවිය පඨවිය ලෙසින් විශිෂ්ඨ

නුවණින් දැන, පඨවිය යැයි නොහඟියි (ස්වකීයත්වයක් ඇති සන දෙයක් ලෙස) පඨවියෙහි යැයි නොහඟියි. පඨවියෙන් යැයි නොහඟියි. පඨවිය මගේ යැයි නොහඟියි. පඨවිය ගැන සතුටු නොවෙයි. කුමක් නිසාද යත් ? පිරිසිඳ දත් බැවිනි.

ද්‍රව - තේජෝ - වායු - භූත - ...... ඒකත්වය නානත්වය - සියල්ල -

නිවන නිවන ලෙස විශිෂ්ට ලෙස දකී. නිවන නිවන ලෙස විශිෂ්ට ඥාණයෙන් දැක නිවන යයි නොහඟියි, නිවනෙහි යැයි නොහඟියි. නිවනෙන් යැයි නොහඟියි, නිවන මගේ යැයි නොහඟියි, නිවන ගැන සතුටු නොවෙයි - කුමක් නිසාද යත් -පිරිසිඳ දත් බැවිනි.

මෙම සූත්‍රයේ ඊළඟ කොටසින් රහතන් වහන්සේට අදාළ වාර 3ක් දැක්වේ. ඉහත වාරයට වඩා එකම වෙනස වනුයේ අවසානයට යෙදෙන මඤ්ඤනා නොකිරීමට හේතුවේ විවිධත්වය පමණි.

එම වාරවල රාගය පහවූ බැවින්, ද්වේශය පහ වූ බැවින්, මෝහය පහවූ බැවින් ලෙස , පිරිසිඳ දත් හෙයින් වෙනුවට සඳහන් වේ.

සත්වන වාරයේ එම ධර්ම 24 කෙරෙහි බුදු කෙනෙකුගේ දැක්ම විවරණය වේ. රහතන් වහන්සේට දැක්වූ අයුරින්ම සඳහන් කොට අවසාන වැකියේ මඤ්ඤනා නොකිරීමට හේතුව ලෙස "පරිඤ්ඤාතන්තං තථාගතස්සාති වදාමි" ලෙස සඳහන් වේ. (පිරිසිඳ දැනීමේ කෙළවරට පැමිණි ලෙස අර්ථ දිය හැක)

අවසාන අටවන වාරයේදී මෙසේ අවසන්වේ. කුමක්ද ඊට හේතුව? සතුටු වීම දුකෙහි මුල යැයි දැන එය ජාති ජරා





මරණ වඩවන්නේ යැයි දන්නා නිසාය. එබැවින් මහණෙනි උත්තම පුද්ගලයා සියළු තණ්හාවන් ක්‍ෂය වීමෙන් විරාග යෙන් නිරෝධයෙන් අතහැරීමෙන් පටිනිස්සග්ගයෙන් අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළේ යැයි කියමි.

තථාගත වශයෙන් අටවන භූමිය නිමයි.

මෙසේ වදාළ කල්හි ඒම භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය ගැන සතුටු නොවූහ.

මූලපරියාය සූත්‍රය

---------------------------------------------------------------

අතපය, මස්, සම, අස්ථි, වැනි පඨවි ගතියට ගිය දෑ දැන හැඳින එය ස්වායත්ත නිත්‍ය දෙයක් ලෙස සිතීම මූලික මඤ්ඤනාවයි. ඉන්පසු එය මම මගේ මට අයත් ලෙස මඤ්ඤනා කරයි. ඉඩමක් වැනි බාහිර පරිසරයේ රූපයක් අරමුණු වී මෙම ඉඩම මගේ මේ ඉඩමේ ගෙයක් හදන්නට ඕනෑය ලෙස විවිධ හැඟිම් සිතෙහි හටගනියි.

**''අස්සුතවා පෘථජ්ජනෝ... පඨවිං පඨවිතෝ සඤ්ජානාති. පඨවිං පඨවිතෝ සඤ්ඤත්වා පඨවිං මඤ්ඤති. පඨවියා මඤ්ඤති. පඨවිතෝ මඤ්ඤති. පඨවිං මේති මඤ්ඤති. පඨවිං අභිනන්දති... ''**

'' අශ්‍රැතවත් සාමාන්‍ය ජනයා තද දෑ තද දෑ ලෙසින් හඳුනාගනියි. එසේ හඳුනාගෙන තද දෙය ස්වායත්ත ස්ථිරසාර දෙයක් යැයි හඟියි. තද දෙයෙහි හඟියි. තද දෙයින් හඟියි. තද දෙය මගේ යැයි හඟියි. තද දෑ කෙරෙහි සතුටුවෙයි. ''

රහතන් වහන්සේගේ අත්දැකීම දක්වා තිබුනේ,

''පඨවිං පඨවිතෝ අභිජානාති, පඨවිං පඨවිතෝ අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති පඨවියා න මඤ්ඤති . . . . . . ''

''තද දෑ තද දෑ බව වෙසෙසින් දැනගනී. එසේ විශිෂ්ට ඥානයෙන් දැන තද දෙය යයි නොහඟියි. තද දෙයෙහි යැයි නොහඟී. තද දෙයින් නොහඟී. තද දෙය මාගේ යැයි නොහඟී .තද දෙය අභිනන්දනය නො කරයි. '' ලෙසිනි.

දෙවියන් ගැන රහතන් වහන්සේ දකින්නේ මෙලෙසිනි.

"දේවේ දේවතෝ අභිජානාති දේවේ දේවතෝ අභිජානිත්වා දේවේ න මඤ්ඤති... දේවේ න අභිනන්දති. ''

"දෙවියන් දෙවියන් ලෙස විශිෂ්ට ඥානයෙන් දනී. දෙවියන්, දෙවියන් ලෙස වෙසෙසින් දැන දෙවියා යැයි මඤ්ඤනා නොකරයි. ඉදිරි පදවලින් දෙවියන්ගේ, දෙවියන් කෙරෙහි, දෙවියන්ගෙන්, ආදී ලෙස විභක්ති දක්වා ඇත.

උදාහරණයක් ලෙස දෙවියන්ට මෙය අයිතිය. දෙවියන්ට විමානයක් පහළ වුණේ ය. දෙවියන් දිව්‍ය ලෝකයෙන් චුත වුනේය. දැන් දිව්‍ය ලෝකයෙන් දෙවියෙකු චුත වුණා කියන කොට සාමාන්‍ය මිනිසෙකුට හිතෙන්නේ දිව්‍යලෝකය නිශ්චල කොට එය පවතිද්දි දේව ස්වභාවයේ යම් අනිත්‍යතාවයක් ය. මේ ස්වභාවයන් දෙකෙහිම දිව්‍ය ලෝකයෙත්, දෙවියාගේත් වෙනස්වීම එකවිට ග්‍රහණය කරන රහතන් වහන්සේට අර සාමාන්‍ය විදියට දෙවියෙක් දිව්‍ය ලෝකයෙන් චුත වුණා කියලා හිතෙන්නේ නෑ. හැබැයි උන්වහන්සේ දෙවියෝවත් දිව්‍යලෝකයත් නොදන්නවා නෙවෙයි. චුත වුනා කියා යම්කිසි විශේෂ දෙයක් වුනා කියලා නොදන්නවාත් නෙමෙයි.





දැන් මනුස්ස ලෝකයට ආවොත් පොළොවේ ගස් වැවෙනවා කියලා හිතනකොට, අන්න පඨවියා මඤ්ඤති කියලා තිබුණේ පොළවෙහි කියලා විභක්තියෙන්. එතකොට සාමාන්‍ය මිනිහට හිතෙන්නේ පොළොව ඉස්සර ඉඳන් තිබුණා, ඒ පොළොවේ අමුතුවෙන් ගසක් හට ගත්තා කියලා. හැබැයි සාමාන්‍ය බෞද්ධයෙක් නම් මහපොළොව නිත්‍යයි කියන අදහසක් නෑ. ඒත් ගහට වඩා තිබුණා කියන හැඟීම ඔහුට තියෙනවා.

මේ වගේම තමයි ගහක ගෙඩි හටගෙන ගෙඩි බිම වැටිලා කුණු වෙලා යනවා දකිනකොට අර ගහට ගෙඩිවල ස්වාමීත්වය දෙනවා. ගහ යනු වෙනස් වන ධර්මතාවයක් නම් ගෙඩිත් වෙනස්වනවා නම් ගහේ ගෙඩි කියලා කියන්න බැරි තත්වයක් තියෙන්නේ. හැබැයි රහතන් වහන්සේ ගහ හෝ ගෙඩි හෝ නොදන්නවාත් නෙවෙයි. ගෙඩි හටගත් බව නොදන්නවා නෙවෙයි. ගහේ ගෙඩි හැදිලා කියලා උන්වහන්සේ කියනකොට ඒක නිකන් ව්‍යවහාර මාත්‍රයක් නෙවෙයි. යම් අර්ථයක් සඳහායි කියන්නේ. ගෙඩි ඇති විට නැති විටදීට වඩා වෙනස උන්වහන්සේ දන්නවා. ගහත් වෙනස් වෙනවා ගෙඩියක් වෙනස් වෙනවා කියලා කියපු ගමන් සමහර කෙනෙක් ගහේ තියෙන රූපත් ක්ෂණයක් පාසා භංග වෙනවා. ගෙඩියේ තියෙන රූපත් ක්ෂණයක් පාසා භංග වෙනවා කියලා හිතන්න පුළුවන්. එහෙම එකක් නෙවෙයි මම අදහස් කළේ. ක්ෂණභංග කථාව පස්සෙ කියලා දෙන්නම්.

සතර මහාභූතවලට පස්සේ අර භූත කියලා වචනයක් තිබුනනෙ. සවිඤ්ඤාණක මේ ලෝකයේ දක්නට ලැබෙන සත්වයින්ට සම්බන්ධ වචනයක් බවයි පෙනෙන්නේ. තමනුත් ඇතුළත්ව. මම ගියා, මට ලැබුණා, මට අයිතියි, මගෙන්

වෙන් උනා වගේ හිතෙනකොට මේ මඤ්ඤනා කරන ක්‍රමය දිස්වෙනවා. අර භූතතෝ කියන විභක්තියෙන් තිබ්බේ මගෙන් යමක් වෙන් වුනා කියන එක. එහෙම හිතන්නේ වෙන් වුණාට පස්සෙත් මම ඉන්නවා වෙන්වුනු ධර්මයත් තියෙනවා කියලා ගත්තහම.

දිනක් බුදුරජාණන් වහන්සේ හමුවෙන්න දෙවියෙක් ඇවිත් මෙහෙම අහනවා.

දෙවියා- "නන්දසි සමණ?" ශ්‍රමණය ඔබ සතුටු වෙනවද?.

බුදුහිමි - කිං ලද්දා ආවුසෝ? කුමක් ලැබුණාටද?.

දෙවියන් - එහෙනම් දුක් වෙනවද?.

බුදු හිමි- මොකක් නැති වුණාට ද?

**ස.නි -- සගාථවර්ගය -- දේවපුත්තසංයුක්තය --- කකුධ සූත්‍රය**

තමන්ට අදාළ ධර්මයනුත්, හාත්පස සියලු ධර්මයන්ගේත් හටගැනීම නැතිවීම දකින නිසයි දන්න නිසයි බුදුහිමියන් එහෙම කියන්නේ. ශ්‍රාවකයො කොතරම් තමන් වහන්සේව පිරිවරා ගත්තත් මට යමක් එකතුවෙනවා කියලා මඤ්ඤනාවක් බුදුහිමියන් කෙරෙහි හටගන්නෙ නෑ.

වෙනකක් තබා අවකාශයත් අනිත්‍යයි. අභිධර්මයේ එහෙම තියෙනවා. ඉතින් හිස් අවකාශය තුළ රූප ඉපදිලා බිඳෙනවා කියලා දකින කොටත් සියුම් දෝසයක් තියෙනවා. අවකාශය අර්ථ දක්වන්නේ සතර මහාභූතවලට සාපේක්ෂව නිසයි. අවකාශය තුළ වස්තු චලනය වෙනවා කියලා හිතෙන විටත් වැරදි මඤ්ඤනාවක්. අවකාශයයි සතර මහාභූතයි එකවිට වෙනස්වන නිසා.

ඉතින් රූපයේ අනිත්‍යතාවය පිළිබඳ හැඟීම ඔබ තුළ දියුණු වෙනවා දැයි, මැන ගන්නට පුළුවන් ඉහත නොයෙක්





විභක්තිවලින් දක්වපු හැඟීම් දිනෙන් දින අඩු වෙනවද කියල සිත ගැන විමසිල්ලෙන් ඉදලා.

තමන් අවට පරිසරයේ වේගයෙන් රූප බිඳී යනවා පෙනෙනවා නම් මොකක් හරි අවුලක් වෙන්න පුළුවන්. අනිත්‍ය සංඥාව බොහොම ශාන්තයි. බිඳෙනවා, බිඳෙනවා, බිඳෙනවා කියලා අමුතු හදිස්සියක් හරි ඤාණය තුළ නෑ. අතීත රූප ගැන කල්පනා කරාම අතීත රූප දැන් නැහැනේ. එහෙනම් අරමුණු වෙත් දී බිඳෙන්න බැහැනේ. එය හටගෙන නැති වුණා කියන ඥානය විතරයි උපදින්නේ.

අනාගතයේ රූප හටගෙන නැහැනේ. ඒවත් බලන් ඉද්දි බිඳෙනවා දකින්න බෑ. එතකොට වර්තමානයේ? චක්ඛු විඤ්ඤාණයට වර්ණ රූපයක් අරමුණු වෙලා ඊට පසුව එන සිත්ධාරාවටම අර වර්ණ රූපය අත්ථි ප්‍රත්‍යයෙන් උපකාර වෙනවා. ඒ කියන්නේ ඇති බැවින් උපකාර වෙනවා කියලා අභිධර්මයේ තියෙනවා. රූපය තියෙද්දිම ඒ සිතිවිලි ධාරාව නැති වෙලා යනවා. එතකොට මෙම චක්ඛුවිඤ්ඤාණ වීදියේ පසුව හටගන්න කුසල සිතකටත් ඒ අරමුණු වන වර්ණ රූපය බිඳෙනවා දකින්න බෑ. ඒ සිතට පිටින් පරිබාහිරව ඔබ ඉන්නවා කියලා මඤ්ඤනා කළොත් නම් පුළුවන් වේවි . තව එක විදියයි තියෙන්නේ. දිබ්බචක්ඛු ඤාණයෙන් වර්ණ රූප දැකලා. ගොඩක් දෙනා නිවන් දැක්කෙ දිබ්බචක්ඛු ඇතුව නෙවෙයි. ඒකත් හරියන්නැහැ.

අන්තිමට නිවන් දකින්නේ සම්මර්ෂණ ඤාණ මුහුකුරා ගියාම. ත්‍රෛකාලික නාම-රූප ධර්මයන් එකවිට පිඬු කරලා, එකවට ග්‍රහණය කරලා, ත්‍රිලක්ෂණයට නංවලා දකින ඤාණයයි මාර්ග ඤාණයට ආසන්නයෙන්ම තියෙන්නේ. එක එක රූපය ගැන ඤාණයක් නෙවෙයි.

ආපහු සූත්‍රයට ගියොත් භූතවලට පස්සේ දෙවියන් ගැනයි තිබුනෙ. දැන් කවුද මේ දෙවියන්? රහතන් වහන්සේ දිව්‍ය ලෝකෙට ගිහිල්ලා දැකපු දෙවියන් ගැනද මේ විශිෂ්ට ඤාණයෙන් දකිනවා කියන්නෙ. පෘථග්ජනයන්ටත් දේව කියන ධර්මය දාල තිබ්බ නිසා මේ එහෙම එකක් වෙන්න බෑ. අර සත්ව පුද්ගල කතාවට ආපහු සිත යොමු කළොත්, සත්‍යවශයෙන් දෙවියෙක් නැත්නම්, මොකක්ද මේ රහතන් වහන්සේ විශිෂ්ට නුවණින් දකින දෙවියා.

සතර මහාභූතවලට පසු වේදනා, සංඥා, සංඛාර, විඥාණ, ගැන කියා එතනින් සූත්‍රය අවසන් වුණා නම් සියුම් බෙදුම්වාදී දර්ශනයට අනුව ගැටළුවක් නොවනු ඇති. අනන්‍ය වූ නාම-රූප සමුදායක් දෙවියන් ලෙස නිරූපනය වන බවත්, ඒවායේ නානත්වය මෙන්ම යම්කිසි ඒකත්වයක් තිබෙන බවක් නේද මෙයින් පෙන්නුම් කරන්නේ. රහතන් වහන්සේ එම නානත්වය මෙන්ම ඒකත්වය විශිෂ්ට නුවණින් දැන එම නාම රූප ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම ලෙස දකිමින්ය දෙවියන් අරමුණු කරනුයේ.

චිත්ත චෛතසික හා රූප ධර්මයන්ගේ වෙන් වෙන් වූ ඊට ආවේණික ස්වභාවයන් ඇත්තාසේම ඒවායේ අන්තර් සම්බන්ධතා ඇති නිසාය ඒකත්වයක් දිස්වනුයේ. අන්තර් සම්බන්ධය වර්තමානව මෙන්ම අතීත අනාගතව ද සිදුවේ. කර්මය හා විපාකය වැනි. සමනන්තර අනන්තර ආදී ප්‍රත්‍ය සම්බන්ධය වැනි.

අනන්‍ය වූ ධර්මතා රාශියක් පෙන්නුම් කරන නිසාය මේ සූත්‍රය විඥාණවාදියාට රුචි නොවන්නේ. සතර මහා භූත, දෙවියන්, බ්‍රහ්මයන්, අරූපී ධ්‍යාන අවස්ථා ලෙසින් ධර්මතා රාශියක් මෙහිදී පෙන්නුම් කරයි.





**විඥාණවාදයේ දී මගහැරෙන්නේ ධර්මවල නානත්වය යි.**

**බෙදුම්වාදයේදී මගහැරෙන්නේ ධර්මවල ඒකත්වයයි.**

මූල පරියාය සූත්‍රයේ අවසානයේ එන, ඒකත්ත නානත්ත සබ්බ යන පදවලින් ඊට පෙර සඳහන් කළ ධර්මතා විස්සම සම්පිණ්ඩනය වන බව අපගේ අදහසයි.

මේ සියලු මඤ්ඤනා කිරීම් කැඩෙන්නේ පස්කඳ ත්‍රිලක්ෂණයට නැංවීමෙන්. ත්‍රිලක්ෂණයෙනුත් අනිත්‍ය සංඥාව මූලිකයි. නාම-රූප ගැන පොදුවේ අනිත්‍ය කියන හැඟීම දියුණු කරනවා වගේම ඒ ඒ අවස්ථාවට අනුව අනිත්‍යයි කියලා සිතිය යුතු සුවිශේෂී නාම-රූප ධර්මත් තියෙනවා. (තත්ථ තත්ථ විපස්සති කියලා භද්දේකරත්ත සූත්‍රයේ තියෙන්නේ.)

දැන් කවුරු හරි කියපු දෙයක් ගැන තරහ ගියාම මේ පුද්ගලයා තමයි මේ කතාවට වග කියන්න ඕන කියලා ඒ පුද්ගලයා ඒ කතාවට ඇඳලා මඤ්ඤනා කිරීමක්නෙ වෙලා තියෙන්නේ. මෙතනදී තරහ ගියේ ශබ්දයේ අනිත්‍යතාව නොදැක්ක හින්ද නෙවෙයි. ශබ්දය කොච්චර සියුම්ව බෙදලා දැක්කත් ක්ලේශය අඩු වෙන එකක් නෑ. ඒ පුද්ගලයාට තියනවා කියලා හිතෙන නාම-රූප ටිකයි ත්‍රිලක්ෂණයට නංවන්න ඕනෑ. තමන්ගේ පැත්තෙන් යම් අපේක්ෂාවක් බලාපොරොත්තුවක් ඔහු සම්බන්ධව තිබුණා නම් ඒකත් බලපානවා.

ආත්ම සංඥාව කියන්නේ මම මගේ කියලා හිතනකොට විතරක් නෙවෙයි. ඔහු, ඔහුගේ කියලා ග්‍රහණය කරනකොටත් තියෙනවා. අනාත්ම කියන හැඟීම අභ්‍යන්තර බාහිර සියලු ධර්ම කෙරෙහි පතිත විය යුතුයි කියලයි ධර්මයේ තියෙන්නෙ.

**"සබ්බේ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති අථ නිබ්බින්දති දුක්ඛේ ඒස මග්ගෝ විසුද්ධියා ''** ධම්මපදය

"සියලු ධර්මයෝ අනාත්ම යැයි යම් කලෙක නුවණින් දකියි ද එවිට දුකෙහි කලකිරෙයි. එය විසුද්ධියට මාර්ගය යි.''

දැන් බාහිරව ගත්තොත් යම් යම් දේවල්වලට වග කියන, තීරණ ගන්නා, ක්‍රියාකරන බාහිර පුද්ගලයෙක් ඉන්නවා කියලනේ හිතන්නේ. ඒ ඒ ශරීර අනිත්‍යනම් ඒ කියන්නේ ඒවාට ස්වකීයව පැවතීමේ හැකියාවක් නෑ. ශරීරය ඇසුරු කොට ඇතිවෙච්ච නාම ධර්මයත් හටගෙන නැතිවෙනවා. ඒවාටත් ස්වකීය තත්වයක් නැහැනෙ. ඒ නාම රූප ධර්ම කිසිවක් කිසිවකට අයිති නෑ.

මහා සාගරය තිබුනට මහා සාගරය කරවන්නෙක් නැහැනෙ. මහපොළොව තිබුනට එය කරවන්නෙක් නැහැනේ. ඒ වගේ මේ ශරීරය තිබුනට ඒ ශරීරය කරවන කෙනෙක් නෑ. ආහාරයෙන්, හුස්මෙන්, වතුරින්, කර්ම ශක්තියෙන් සිතත් උපකාර වෙලා හටගෙන තියෙන්නේ, පවතින්නේ.

බාහිර දේවල් සම්බන්ධයෙන් ගතහොත්, පුද්ගලයෙකු ගැන හරි තිරිසනෙකු ගැන හෝ ආත්ම හැඟීමක් එන්නේ ප්‍රධාන වශයෙන් ඒ සත්වයාගේ ශරීරය පදනම් කරගෙනයි. ඉතින් ශරීරය දිරලා විනාශයට, අභාවයට යනවා කියන හැඟීම ප්‍රගුණ කළොත් (සතිපට්ඨානයේ කායානුපස්සනාවේ නවසීවථිකයේ වගේ) ඒ ශරීර ඒ පුද්ගලයාට හෝ සතාට අයිති නෑ කියන හැඟීමක් ඇති කරගන්න පුලුවන්. තමන්ගේ ශරීරය තමන්ට අවශ්‍ය විදිහට පවතින්නේ නෑ වගේ උගේ ශරීරය ඌටත් නැහැ. මේකට කියනවා පරතෝ දැක්ම කියලා. ඒ ශරීරය ඌටත් කරදරයක් කියලා දුක්ඛානුපස්සනාව දියුණු කරගත්තොත් තවත් වටිනවා.





ඔහු හෝ ඇයට ඒ ඒ ශරීරවලින් පිහිටක් නැත්නම් අනෙකාගේ ශරීරයෙන් ඔබට පිහිටක් සරණක් ලැබෙන්නේ කොහොමද? ආත්ම ග්‍රහණයෙන් ශරීරය අත හැරියාට පස්සේ ඉතුරු වෙන්නේ මානසික පැත්තයි.

කෙනෙකුට හිතෙන්න පුළුවන් බාහිර සත්වයන් සැලකුවම මානසික පැත්ත උපකල්පනය කරන දෙයක් නේ. පේන්නෙ ඒ සත්වයන්ගේ ශරීර විතරයිනේ කියලා. අනිත්‍යතාවය පැත්තෙන් ගත්තහම සත්‍ය වශයෙන් හටගත් ධර්මයක් නේ නැති වෙන්නේ.

නමුත් අන් සත්වයන්ගේ මානසික ස්වභාවය තමන්ට දැනෙන එක නවත්තන්න පුළුවන්ද? අනෙක් සත්වයෝ ගැන විදර්ශනාවේ දී දකින්න ඕන ඒ ශරීර මළමිනියක් වගේ සිතක් සම්බන්ධ නැති ධර්මයක් කියලා විතරද?

මේක තේරුම් ගන්න පොඩි කතාවක් කියන්නම්. දැන් අපි හිතමු ලංකාවේ රහතන් වහන්සේ නමක් ජපානයට යනවා. උන්වහන්සේ ටිකක් වයසයි. ධර්ම දේශනා මාලාවකට යන්නේ. දවසක් කටයුත්තකට නගරයේ ඇවිදගෙන යනකොට කෝකටත් පාර හරිද කියල දැනගන්න වටපිට බැලුවාම සාප්පුවක පිළිගැනීමේ නිලධාරිනියක් දකිනවා. ඇය බොහොම ලස්සනයි. හැබැයි ....... හැබැයි රොබෝ කෙනෙක්. වෙනස හොයා ගන්නම බෑ. අද කාලයේ තාක්ෂණය බොහොම දියුණුයි. පාර ඇහුවම ඇය කියනවා, සමාවෙන්න මම දන්නේ නෑ කියලා. කට හඬ ඇහෙන කොට තමයි ස්වාමීන් වහන්සේ තේරුම් ගන්නේ යන්ත්‍රයක් කියලා.

රහතන් වහන්සේට ඇය දැක්කට අංශුමාත්‍රයක්වත් රාග සිතක් ආවෙ නැනෙ. හැබැයි මිනිහෙක් කියලා පැටලුනා

නේ. උන්වහන්සේ මුලින් ඇයගේ යම් කායික මානසික ස්වභාවයක් උපකල්පනය කරා. හැබැයි ක්ලේශයක් දෘෂ්ටියක් ආවේ නැත්තේ මොන ආකාරයේ නාම-රූප ධර්ම තිබුණත් ඒවායේ අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාවය ගැන පොදුවේ යම් ගැඹුරු වැටහීමක් සිතේ පැලපදියම් වෙලා තියෙන නිසායි.

සතිපට්ඨාන සූත්‍රයේ තියෙනව අජ්ඣත්තං වා ධම්මේ, ඊට පස්සේ බහිද්ධා වා, ඊට පස්සේ අජ්ඣත්තබහිද්ධාවා කියලා. ඒ අජ්ඣත්තබහිද්ධා කියන්නේ, පොදුවේ නාම-රූප සලකා ගන්නකොට බවයි පේන්න තියෙන්නේ.

දැන් තමන්ගේ ශරීරයත් අසුබයි. මුණගැසෙන බාහිර පුද්ගලයකුගේ ශරීරය ඇතුළාන්තයත් අසුබයි. අප දෙදෙනාගෙම අසුබයි. මෙහෙමත් පුළුවන්නේ; කාගෙ වුනත් අසුබයි. අන්න අජ්ඣත්තබහිද්ධා. එතනදි තමනුත් අනිත් අයත් අයිතියි. එතකොටයි අනාගතයේ රූපයක් දකිද්දිත් විශේෂයෙන් අසුබ හැඟීම එන්නේ.

මේ රොබෝගෙ කතාවෙන් තවත් වැදගත් කාරණයක් ඉස්මතු වෙනවා. දැන් රහතන් වහන්සේට මුලින්ම ගෝචර වුනේ වර්ණ රූපයයි. හැබැයි වර්ණයක් එහෙම නැත්නම් පාට චිත්‍රයක් විතරක් කියලා නෙවෙයි දැනුනේ. දකින දෙයට සම්බන්ධව දිග පළල උස ගැනත් වැටහීමක් ඇතිවුණා.

අර බාහිය ස්වාමීන් වහන්සේට දුන් අවවාදය වගේ දිට්ඨෙ දිට්ඨමත්තං, ඒ කියන්නේ දැක්මෙහි දැක්ම පමණක් වුණේ නෑ. රහතන් වහන්සේලා පාට දැකලා ඒ මට්ටමින් නවතින වෙලාවලුත් ඇති. හැබැයි මෙතනදී වුනේ "විඤ්ඤාතං විඤ්ඤාතතෝ අභිජානති'' දැනුනු දේ තුළ විශිෂ්ට නුවණ පිහිටලා. උන්වහන්සේ මෙතැනදී වර්ණය ඔස්සේ





සවිඤ්ඤානක සත්වයෙක් සාප්පුව ඉදිරිපිට ඉන්නවා කියා සිතුවනේ. හැබැයි සාමාන්‍ය මිනිසුන්ට හිතෙන විදිහට නෙවෙයි.

එහෙනම් විදර්ශනාවේ ඒකාන්ත කාරණයක් නැහැ වර්ණ මට්ටමින් හරි සද්ද මට්ටමින් හරි නවතින්න ඕනෑ කියලා. එහෙම වුනොත් බුද්ධකාලයෙ නම් බුදුරජාණන් වහන්සේවත් අඳුරගන්න බැරුව යනවා. මෙතනත් පේන්නේ ධර්මවල නානත්වය වගේම යම් ඒකත්වයක්. පාට දැක්කට පස්සේ ඒ කියන්නේ චක්ඛුවිඤ්ඤාණ අවස්ථාවට පස්සේ උන්වහන්සේ සවිඤ්ඤානක සතෙක් තර්කනය කළානේ. නැත්නම් පාර අහන්න යන්නෙ නෑනෙ. පාට දැකලා පාට නොවන දෙයක් තර්කනය කළා. හැබැයි ඒ විතර්කයට පස්සේ සිත ප්‍රපඤ්චයට ගියේ නෑ.

දැන් මොකක්ද කියන්න වෙන්නේ, සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවා කියලද නෑ කියලද? දෘෂ්ටිගතිකව සත්තවයෙක් උපකල්පනය කිරීමයි වැරැද්ද. කෙනෙක් දෘෂ්ටිගතික නොවී යම් සවිඤ්ඤාණක සත්තවයෙක් උපකල්පනය කරන විදියක් තියෙන්න ඕනා. සාමාන්‍ය මිනිස්සු විතර්ක මට්ටමට ගියොත් බොහෝ දුරට ඊළඟට වැරදි මඤ්ඤනාවකට යනවා. ප්‍රපඤ්චයට යනවා.

මේ කතාවක් කීවේ. වෙන්න පුළුවන් දෙයක් බව සබුද්ධික පාඨකයාට වැටහෙනවා ඇති.

විදර්ශනාව දියුණු කරගන්න හදන යෝගියෙක්ගේ පැත්තෙන් ගත්තොත් නම් මෙතැනදී යම් වෙනසක් තියෙනවා. යෝගියා අත්‍යවශ්‍ය කාරණයක් නැත්නම් වටපිට නොබලා ඉන්නයි උත්සාහ කරන්නේ. වටපිට බැලුනත් පාට මට්ටමින් නවත්තන්න බලනවා. බුදුරජාණන් වහන්සේ

කියලා තියෙනවනේ ''න නිමිත්ත ගාහි න අනුබ්‍යඤ්ජන ගාහි'' කියලා. නිමිති හැඩරුව හිතට ගන්න එපා කියලා.

මේ මඤ්ඤනාවල පටලැවිලි තව ටිකක් කියන්නම්. ඔක්කොම ලියන්න ගියොත් නම් මහ පොළොව තරම් පොතක් වේවි. ඉතුරු ටික පාඨකයන්ට නුවණින් සිතා ගන්න පුලුවන් වේවි. දැන් හිතෙන් හිතනවා කියා වැටහුණා නම් ඒත් දෝෂයක්. හිතට දැනෙනවා කිව්වත් එහෙමයි. හිතට හෝ හිතෙන් දැනගන්න, යම් අවස්ථාවක ඒ හටගත් දැනීමට අමතරව ඊට පිටිපස්සේ තියෙන හිතක් නැහැනෙ. කියන්න තියෙන්නෙ යම් ආරම්මණයක එල්බගෙන හිතක් හටගන්නවා කියලා විතරයි.

ඒ විදියට ලෝකෙ ගැන කියා දෙන දේශනා විලාශයක් අභිධර්මයේ තියෙනවා. හැබැයි ආරම්මණය තමන් අතින් දාගන්න ඕනෑ. සූත්‍රපිටකයේ නම් ඔබ මේ දේට ආශා කළොත් මෙහෙම දුකක් විදින්න වෙයි කියලා ආරම්මණය සමහර දේශනාවල තියෙනවා. අභිධර්මයෙ පළවෙනි පොතේ පළවෙනි පිටුවේ කුසල සිතක ආකාරය ගැන කියන කොට බුදු රජාණන් වහන්සේ දක්වනවා රූපයක් හෝ ශබ්දයක්, ගන්ධයක්, රසයක්, පහසක්, ධර්මයක් අරමුණු කරගෙනයි මේ සිත හටගන්නෙ කියලා. මොන රූපෙ ද, මොන සද්දෙද, මොන ධර්ම ද, කියලා තමන් දාගන්න ඕනි. නැත්නම් අභිධර්මය හැදෑරීම ගණිත ක්‍රමයක් වෙනවා.[7]

අනමතග්ග සංයුත්තයේ සූත්‍ර දේශනාවල, මහණෙනි ඔබලා අනන්ත වාරවල හරක්, කුකුල්ලු වෙලා කියලා එතන හිටිය භික්ෂූන් වහන්සේලා අතීතයට සම්බන්ධ කරලා කියන්න බුදුරජාණන් වහන්සේට සිද්ධ වුණා. ඒක අහපු නුවණ තියෙන ස්වාමීන් වහන්සේලා ඒක පටලවා ගත්තේ නෑ. ඒ

**7 අධෝ ලිපි 6**





දේශනය තුළ තමන්ට අදාළ අතීත ධර්මයන්ගේ අනිත්‍ය දුක්ඛ ස්වභාවය සිහිපත් කරලා දෙනවා. ඒක තුන් කාලයට අදාළ සියලු අභ්‍යන්තර බාහිර සංස්කාර ධර්මයන්ට පතිත කරමින් රහත් වෙන්න ස්වාමීන් වහන්සේලා සමත්වුණා. අනිත්‍යතාවය, දුක, පුළුල් ව සිහිපත් වෙනකොට අනාත්ම ලක්ෂණය කොහොමටත් ඇඳිලා එනවා. ඒක නවත්තන්න බෑ.

මෙහෙම සිතේ වරින්වර එන වැරදි හැඟීම් මඤ්ඤනා කිරීම්වලට අවධානය යොමු කරලා අපට පුළුවන් අනිත්‍යයි කියලා වැඩිපුර සිහිපත් කළ යුතු ධර්ම මොනවද කියලා මතුකරගන්න. වැරදි මඤ්ඤනාවල පදනම නිත්‍ය සංඥාව නිසා.

යමෙක් යම් නාම රූප ධර්මයන් අනිත්‍ය ලෙස සිහිපත් කරන විට ඒ වෙලාවේ සිතේ රාග ද්වේෂ ආදී අකුසල් නැතෙයි කියලා වැටහෙනවා නම් සිතේ ප්‍රගුණ බවක් ශාන්ත බවකුත් කර්මන්‍ය බවකුත් තියෙනවා නම්, ඒ වගේ අවස්ථාවල වරින් වර හෝ දුක්ඛ අනාත්ම හැඟීමත් එනවනම් සිත එකග වෙන්නත් ඒක හේතුවක් බව පෙනෙනව නම්, අකුසල් සිතේ හට නොගන්නත් ඒක හේතුවක් බව පෙනෙනව නම්, ඒකාන්තයෙන් ඔහු අනිත්‍ය ලෙස මෙනෙහි කරන ආකාරය නිවැරදියි.

මේ කෘතිය මුලින් පටන් ගත්තේ පරමාර්ථ ගැන කියන කතාවකින්. පරමාර්ථ කියන්නේ මොනවද කියලා හරියටම දැනගන්න ඕනෑ කියලා ඔබට සමහරවිට හිතෙන්න ඇති. පරමාර්ථ කියන්නේ තවදුරටත් බෙදන්න බැරි කුඩාම ආකාරය ද, නැත්නම් අනන්‍ය වූ ධර්ම ආකාරයද කියලා නිශ්චය කරගන්න වෙනවා. නැත්නම් වෙන මොකක්හරිද කියලා.

බුද්ධකාලයෙ නම් පරමාර්ථ වචනය භාවිතා වුනේ පරම අර්ථය කියන අරුතින් නිවන සඳහායි.[8] සාමාන්‍යයෙන් ත්‍රිපිටකය කියවපු පින්වතුන් දන්නවා ඇති පරමාර්ථ කියලා වචනයක් මුණගැහෙන්නෙ නෑ ත්‍රිපිටකය තුළ. කථාවත්ථුපකරණයේ හැරෙන්නට. සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර (200) කට පසු යුගයේ අශෝක රජතුමාගේ කාලයේ තමයි කථාවත්ථුපකරණය සම්පාදනය වුනේ මොග්ගලීපුත්තතිස්ස තෙරුන් වහන්සේ අතින්.

විදර්ශනාවට සම්බන්ධ වටිනා කරුණු සමුදායක් මතුකර ගන්න පුළුවන් මේ කෘතියෙන්. විශේෂයෙන්ම එහි එන පුද්ගල කතාවලින්. නමුත් කථාවස්තු ප්‍රකරණය පරිහරණය කරලා තියෙන බවට පෙනෙන්නේ ඉතා සීමිත පිරිසක්. ඊට සාපේක්ෂව මිලින්ද ප්‍රශ්නය බොහෝ දෙනා කියවා ඇති බවයි පෙනෙන්නේ. කතාවස්තුව අභිධර්මය කෘතියක් ලෙසින් සංග්‍රහ වුන නිසා එහෙම වුනාද කියලා හිතෙනවා. සමහරවිට සරල සිංහල අනුවාදයක් නැති නිසා වෙන්න ඇති. නමුත් කතා වස්තුව තේරුම් ගැනීමට විශේෂ අභිධර්ම දැනුමක් අවශ්‍ය නම් නෑ.

එකේදි තමයි මුලින්ම පරමත්ථ කියන වචනය නිවන ඇරෙන්න වෙන දේකට යොදනවා පේන්නේ. හැබැයි අමුතු දේකට නෙවෙයි. සාමාන්‍යයෙන් බෞද්ධයන් දන්න ස්කන්ධ, ධාතු, ආයතනවලට, ම තමයි. එහිදී පුද්ගල දෘෂ්ටිය කඩන්න උන්වහන්සේ මෙහෙම ප්‍රශ්න කරනවා.

රූපයක්, වේදනාවක්, සංඥා, සංස්කාර, විඥාන සත්‍යවශයෙන් පරමාර්ථ වශයෙන් දක්නට ලැබෙනවා වගේ <u>පුද්ගලයෙකුත්</u> සත්‍ය වශයෙන් පරමාර්ථ වශයෙන් දක්නට

8. පරමාර්ථ වචනය ත්‍රිපිටක ග්‍රන්ථවල යෙදුණු ආකාරය අධෝ ලිපි 7 පිටු අංක130, 131





ලැබෙනවාද කියලා. ආත්ම දෘෂ්ටියක බැස ඉන්න අන්‍ය තීර්ථකයෙකුගෙන් අහන විදිහටයි ප්‍රශ්න හදලා තියෙන්නේ. ඒ වගේමයි ආයතනවලටත්, ධාතුවලටත්.

**"රූපං උපලබ්භති සච්චිකට්ඨ පරමත්ථේන පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨ පරමත්ථේන''**

(කථාවස්තු- පුග්ගල කථා)

මේ පාලි පාඨයෙන් අහන්නේ රූපය සත්‍ය වශයෙන්, පරමාර්ථ වශයෙන් දක්නට ලැබෙනවා වගේ පුද්ගලයෙකුත් දක්නට ලැබෙනවා ද කියලා. ඉහත සඳහන් කළ අනුරාධ හා යමක සූත්‍රවලත් මීට ආසන්නයෙන් යන පාඨයක් තියෙනවා.

**"එත්ථ ච තේ අනුරාධ දිට්ඨේව ධම්මේ සච්චතෝ ථේතතෝ තථාගතේ අනුපලබ්භියමානේ...''**

"මෙහිලා අනුරාධය දිටුදැහැමියෙම (ඇස් පනාපිටම) සත්‍ය වශයෙන් , සාර ලෙසින් රහතන් වහන්සේ විද්‍යමාන නොවන කල්හි ''

අනුරාධ හා යමක සූත්‍ර වල එන සච්චතෝ ථේතතෝ කියන තැන තමයි කතාවස්තුවේදී සච්චතෝ පරමත්ථතෝ වුනේ. දුක්ඛ සත්‍යය කියලා අර්ථ දක්වන්නෙ පංච උපාදානස්කන්ධ ධර්මයන්නෙ. සත්‍යය කීවම විද්‍යමානවන ධර්මයක් කියන අදහස තියෙනවා. සැබෑවටම දකින්නට ලැබෙන කියලා කියන්නත් පුළුවන්. හඳේ හාවෙක්, සර්ව බලධාරි දෙවියෙක්, සැබෑවට දකින්න නැහැනේ. හැබැයි සත්‍ය වශයෙන් බුදු කෙනෙක් නෑ කිව්වොත්, අම්මා තාත්තා නෑ කිව්වොත්, දසවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙ තියෙනවා නත්ථි මාතා නත්ථි පිතා කියලා දැක්මක්. සියල්ල දක්නා දැනෙනා බුදු කෙනෙක් නෑ කියලා දැක්මක්.

ඒක නිසා සත්‍ය වශයෙන් ඇති නැති කතාව හිතනවට වඩා සංකීර්ණයි. කියන කෙනා මොන අර්ථයක් සඳහා මොන පදනමක ඉඳලද කියන්නෙ කියලා සලකා බලන්න වෙනවා. කතාව සත්‍ය වුණත් අහන කෙනාට අනර්ථයක් වෙනවා නම් වැඩක් නැනේ.

දැන් ස්කන්ධ ධාතු, ආයතන වශයෙන් නානා ධර්ම බුදුරජාණන් වහන්සේ අර්ථ දක්වලා තියෙද්දි මොකද්ද මේ පරමාර්ථ කතාව කියලා කෙනකුට සිතෙන්න පුළුවන්.

මෑත කාලයේ සම්පාදනය වූ අභිධර්ම ග්‍රන්ථවල පරමාර්ථ කියලා තියෙන්නේ චිත්ත, චෛතසික, රූප, නිර්වාණ, කියලා සතර ආකාරයක්. එයින් චිත්ත, චෛතසික, රූප කියන්නේ පංචස්කන්ධ ධර්මයන්ට නේ. හැබැයි පරමාර්ථ කියන වචනය ඇහෙනකොට ස්කන්ධ කියන වචනයට වඩා සූක්ෂම බවක් දැනෙනවා. සාමාන්‍යයෙන් දැනෙන්නෙ නෑ වගේ කියලා ගොඩක් දෙනෙකු හිතනවා. විශේෂයෙන් සමහර රූප ගැන හිතනකොට. හැබැයි අභිධර්ම පිටකයේ බුදුරජාණන් වහන්සේ රූප ගැන කරන මූලික අර්ථ දැක්වීමේ තියෙනවා මේ සියලු රූප ''**උපාදානීයා සංකිලේසිකා... ඡහි විඤ්ඤාණේහි විඤ්ඤෙය්‍යා** '' ආදී ලෙසින්.

ඒ කියන්නේ, සතර මහා භූත, ඊට පස්සේ ඇස, කන, වර්ණය, සද්ද, ගන්ධ, වගේ අනෙකුත් උපාදය රූපත්, අරඹයා ඒවා ඉලක්ක කරලා කෙලෙස් හටගන්නවා. ඒවා උපාදානයට ලක්වෙනවා, සයාකාර වූ විඤ්ඤාණයෙන් මේ රූප දත යුතුයි. චක්ඛු-සෝත-ඝාන-ජිව්හා-කාය-මනෝ විඤ්ඤාණ සයෙන්.

සතිපට්ඨාන සූත්‍රයේ තියෙන්නේ ''**චක්ඛුං ලෝකේ පිය රූප සාත රූපං එත්ථේසා තණ්හා උප්පජ්ජ මානා උප්පජ්ජති**





**සෝතං ලෝකෙ පිය රූප සාත රූපං එත්ථේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති** '' කියලා...

ඇස ලෝකයේ ප්‍රිය ස්වභාවයක්, එය කෙරෙහි තණ්හාව උපදිනවා කන ලෝකයේ ප්‍රිය ස්වභාවයක් ආදී ලෙසින්.

මේ කියන්නේ ඇස, කන, ගන්ධය, රස ආදී රූප ඉලක්ක කරලා කෙලෙස් හටගන්නවා කියන එක. සූත්‍රයේ තියෙන ඇසයි අභිධර්මයේ ඇසයි වෙනස්වත්ද? අභිධර්ම පිටකයේ, සච්ච විභංගයෙත් ඔය පාඨය තියෙනවා.

චක්ඛුවිඤ්ඤාණයට ආරම්මණය වර්ණය කියන පරමාර්ථය. පේන්නේ පාට නේ. සෝතවිඤ්ඤාණය සද්දෙ කියන පරමාර්ථය. නහය නිසා හටගත් සිතට ගන්ධය කියන පරමාර්ථය, දිවට රසය කියන පරමාර්ථය, කයට පඨවි, තේජෝ, වායෝ, කියන ස්වභාවය. පරමාර්ථයෝ නෙමෙයිද මේ දැනෙන්නේ. ඔය සිත් ඤාණ විප්‍රයුක්තයයි.

වෙනකක් තියා, මව මරණ, පියා මරණ ආනන්තරිය පාපකර්මය කරන වෙලාවේ අරමුණු වෙන්නෙ ජීවිතඉන්ද්‍රිය රූපය කියලා අභිධර්මයේ අන්තිම පොතේ තියෙනවා. බරපතළ අකුසල සිතටත් යම්කිසි විදිහකට පරමාර්ථ දැනෙනවා.

රූප දැනෙන්නේ නැති එක නෙමෙයි ප්‍රශ්නේ. ඒ ඒ රූපවල විවිධ පැතිකඩ ඒ කිච්චේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙසින් වැටහෙන්නේ නැති එක. ඒ ඒ රූපාකාර හටගත් විදිහ පැහැදිලි නැති කම. ඒ රූප හටගැනීමට තුඩුදුන් ප්‍රධාන හේතු අපැහැදිලි බව. ඒ රූප වලට හිතන්න දැනගන්න පුළුවන් කියලා හැගෙන එක. ඒ කියන්නේ රූපය ඇතුළෙ නාමය බස්සලා.

මේ කියන්නේ ඔබට සතර මහාභූතත්, වර්ණය, ශබ්දය, වගේ උපාදාය රූපත් අනිත්‍යයි කියලා මෙනෙහි කරන්න පුළුවන් බව. අනිත්‍ය සංඥාව භාවිත බහුලීකෘත නැති එකයි ප්‍රධාන ගැටළුව.

පරමාර්ථ දකින්න ගැඹුරු සමාධියක් ලැබෙනකම් ඉන්න එපා. දැනට දන්න නාම-රූප ටික අනිත්‍ය ලෙස මෙනෙහි කරන්න. එතකොට සිත එකඟ වේවි. නොදන්න නාම-රූපත් ප්‍රකට වේවි.

බුද්ධ කාලේ නාමරූපවල විවිධත්වය හඟවන්න ධාතු කියන වචනය යෙදුණු බවක් පෙනෙන්න තියෙනවා. ඒ කියන්නේ අනන්‍ය වූ ධර්ම ස්වභාවයන් ඒ වචනයෙන් අර්ථවත් කළා. මෙම ධාතු සහ පරමාර්ථ අතර සම්බන්ධයක් තියෙනවා.

**''කතමඤ්ච භික්ඛවේ ධාතු නානත්තං?**

**චක්ඛුධාතු, රූපධාතු, චක්ඛුවිඤ්ඤාණධාතු, සෝතධාතු, සද්දධාතු, සෝතවිඤ්ඤාණධාතු ....... මනෝ ධාතු, ධම්ම ධාතු, මනෝ විඤ්ඤාණ ධාතු, ඉදං වුච්චති භික්ඛවේ ධාතු නානත්තං ''**

ධාතු සංයුක්තය

''මහණෙනි ධාතුන්ගේ විවිධත්වය කුමක්ද? ඇස යන ධාතුව, වර්ණරූප ධාතුව, ඇස නිසා හටගත් විඤ්ඤාණ ධාතුව... ධර්ම ධාතුව, මනෝ විඤ්ඤාණ ධාතුව.... මහණෙනි ධාතුන්ගේ නානත්වය මෙයයි. ''

ඇස, කන වගේ නෙවෙයි, කන, දිව වගේ නෙමෙයි, චක්ඛුවිඤ්ඤාණය, සෝතවිඤ්ඤාණය වගේ නෙමෙයි.





ඇසෙන් කරන වැඩේ කනින් කරන්න බෑ. ජාති අන්ධ පුද්ගලයකුට, චක්ඛුවිඤ්ඤාණය ගැන, ඒ කියන්නේ අවට පෙනෙනවා කියලා ලබන අත්දැකීම කොහොම කිව්වත් තේරුම් යන්නේ නෑ. සද්ද ඇහෙන, පහස දැනෙන, විදියෙන් ඒ දැනීම් වලින් අර දැනීම දක්වන්න බෑ. වස්තුවක පැහැය, අල්ලලා බලලා හෝ උණුසුම හෝ අනුව කියන්න බෑ.

මානසික පැත්තෙන් බැලුවොත් කරුණාව මෛත්‍රිය, වෛරය ක්‍රෝධය වගේ නෙවෙයි. ලෝභය විරාගය වගේ නෙවෙයි. ඥාණය මෝහය වගේ නෙවෙයි. ඒ ධම්ම ධාතුවේ විවිධත්වයයි.

මේ ලෝකයේ විවිධත්වය දිස්වෙන්නේ මේ ධාතු විවිධත්වය නිසයි. ඊළඟට ධාතු සංයුක්තයේ එන තවත් සූත්‍රයක තියනවා සඤ්ඤානානත්වයට බලපාන්නේ ධාතු නානත්වය කියලා. හැඳිනීම්වල විවිධත්වය ධාතුන්ගේ විවිධත්වය මතයි. ඉතින් මේ විවිධ විදිහට ලෝකේ හඳුනාගන්න කොට එය අන් අයට ප්‍රකාශ කරන්න විවිධ වචන ව්‍යවහාරයන් බිහි වෙනවා. ඒ නිසා තථාගතයන් වහන්සේ වදාළා '' වෝහාර වේපක්කං භික්කවේ සඤ්ඤං වදාමි'' කියලා. ව්‍යවහාරය සකස් වෙන්නේ හඳුනාගන්නා ආකාරවලින් කියන එකයි.

මේ විවිධ ධර්මතා ගැන කතා කරන කොට ඉතා වැදගත් කරුණක් මතකයට ආවා පරමාර්ථ සම්බන්ධයෙන්. දැන් වෛරය හැදිලා තියෙන්නෙ මොකකින්ද ? එහෙම නැත්නම් වේදනාව හැදිලා තියෙන්නෙ මොනවයින්ද කියලා සමහර කෙනෙක් අහන්න පුළුවන්. වේදනාව හැදිලා තියෙන්නේ ස්පර්ශයෙන් කියලා උත්තර දුන්නොත් දෝෂයක් හිටිනවා.

වේදනාව හටගත්තේ කෙසේද කියලා ඇහුවා නම් ස්පර්ශය නිසා යැයි කිව හැකි. නමුත් වේදනාව හැදිලා තියෙන්නේ

ස්පර්ශයෙන් කිව්වොත් එයින් අදහස් වෙනවා වේදනාව ඇතුළෙ ස්පර්ශය තියෙනවා වගේ. විඥ්ඥාණය හැදිල තියෙන්නෙ නාම-රූප වලින් කියලා කිව්වත් ඒ වගේමයි. විඥ්ඥාණය නාම-රූප හට ගන්නා විට හටගන්නවා. නාමරූප තියෙන විට විඥ්ඥාණය තියෙනවා.

පටිච්චසමුප්පාදය පිළිබඳ න්‍යායක් තථාගතයන් වහන්සේ දැක්වූ සේක.

''**ඉමස්මිං සති ඉදං හෝති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති** ''

''මෙය ඇතිවිට මෙය වේ. මෙය උපදින විට මෙය උපදී.''

විඥ්ඥාණයේ ඊට ආවේනික ලක්ෂණ තියෙනවා. අනෙකුත් නාමධර්ම රූප ධර්මවලත් ඊට අනන්‍ය වූ ලක්ෂණ තියෙනවා. වෙන විදිහකට කිව්වොත් ධාතු නානත්වයක් තියෙනවා. ඉතිං කවුරුහරි මේ නානත්වය වටහා නොගෙන එහෙම නැත්නම් පටලවා ගත්තොත් ඔහු විඥ්ඥාණය ගැන කියන්න ගියාම රූපය ගැන කියනවා. රූපය ගැන කියන්න ගිහිල්ලා විඥ්ඥාණය ගැන කියනවා. අන්තිමට මොකක්වත් හරියට කියලා නෑ. එහෙම වුනොත් බුදුදහම අමරාවික්ඛේප වාදයක් වෙනවා.

රූප උපකාර වෙලා සමහරවිට අරමුණු වෙලා සිතක් හටගන්නවා තමයි. නමුත් හට ගත්තට පස්සේ සිත අස්සේ රූප නෑ. විවිධ රූප සිතට දැනුන කියල රූප ඇතුළේ හිතක් නෑ. පරමාර්ථ කතාවක් බුද්ධ කාලයෙන් පස්සේ වැඩ හිටිය මහතෙරුන් වහන්සේලා ගොඩනැගුවානම් එතන හරය මෙතනයි.

නාම හා රූපවල තියනවා ප්‍රධාන වෙනසක්. දැන් නාම ධර්මයන් ගත්තහම[2] (මෙතැනදී අදහස් කරන්නේ සියලු





මානසික ධර්මයන් ගැන.) ඒවා අර්ථ දක්වන්න ආරම්මණයක් ගැන කියන්න වෙනවා.

ටිකකට ඉස්සෙල්ලා ඔබ කෙරෙහි පහළ වුණ චක්ඛු විඥ්ඥාණ ගැන, ඒ කියන්නෙ හටගත් පෙනීම ගැන විස්තර කරන්න ගියාම පෙනුණු දේ මොකක්ද කියලා කියන්න වෙනවා. පෙනුණු පාට ඒ චක්ඛුවිඥ්ඥාණය නොවුනට ඒ පාටින් තොරව ඒ සිත අර්ථ දක්වන්න බෑ.

මේ සාරම්මණ බව, අරමුණු සහිත බව නාම ධර්මවල සුවිශේෂී ලක්ෂණයක්. තද ගතිය, රස්නය, ඇස, ආදී රූප හටගන්න ආරම්මණයක් කියලා දෙයක් අදාළ නෑ. ඒ රූප විස්තර කරන්න ආරම්මණයක් අවශ්‍ය නෑ. ඒ නිසයි රූපධර්ම අනාරම්මණං කියලා අභිධර්මයෙ කියලා තියෙන්නේ. පිපුණු මලක රූව ඒ මල දන්නෙ නෑ. මේ නාමරූපවල ප්‍රධාන වෙනස මේකයි. ඒකයි පුංචිකාලේම උගන්නන්නේ දෙකක් නම් මොකක්ද කියලා ඇහුවාම, නාමයයි රූපයයි කියලා.

''**ද්වේ නාම කිං ? නාමඤ්ච රූපඤ්ච**''

**බුද්දකපාඨ--කුමාරපඤ්හ**

පරමාර්ථ කියලා මම මුලින්ම සඳහන් කලා. සමහරෙකුගේ අදහසක් තියෙනවා තවදුරටත් බෙදිය නොහැකි සියුම්ම ආකාරය කියලා.

බුද්ධ දේශනාවක සඳහන් වෙනවා ''**උපමායපි න සුකරං යාව ලහුපරිවත්තං චිත්තං.**'' කියලා

**අංගුත්තර නිකාය -- ඒකක නිපාතය**

සිතේ පෙරළෙන වේගය උපමාවකින් පවා දක්වන්න අමාරුයි කියලා.

සිත ගැන නිතර අවධානයෙන් සිටිය, යම් මට්ටමක හෝ අභිධර්ම දැනුමක් තියෙන පින්වතුන් දන්නවා විවිධත්වයෙන් යුතු සිතේ අවස්ථා කොතරම් සීඝ්‍රයෙන් මාරු වෙනවද කියලා. හැබැයි ඊටත් වඩා සියුම් ලෙස බුදුරජාණන් වහන්සේ දකින්න ඇති. සිත හා චෛතසික සම්බන්ධයෙන් "ගත්තොත් ඒවායේ එක්තරා මට්ටමක් තියෙන්න ඕනැනේ තවදුරටත් බෙදිය නොහැකි" කියලා සාධාරණ අදහසක් ඉදිරිපත් වෙන්න පුලුවන්.

දැන් මේ සිද්ධිය හොඳින් කල්පනාවට ගන්න. දැන් අපි හිතමු ඔබට එක දවසක් පැය ගණනක් ඔළුවෙ කැක්කුමක් තිබුණා කියලා. ඒ කියන්නේ දුක්ඛ වේදනාවක් හටගෙන තිබුණා කියලා. මේ වේදනාව ගැන මතක් කරල අනෙකෙකුට කියන්න පුළුවන් ඊයෙ වරුවක් විතර තද හිසරදයක් තිබුන කියලා. ඔබ මනස ගැන නිතර අවධානයෙන් ඉන්න කෙනෙක් නම් දන්නවා වෙන වෙන සිතුවිලි තිබ්බ අවස්ථාවල අර වේදනාව අත්විඳ නෑ කියලා.

මේ වේදනාව ගැන පසුව නැවත සළකා බලනකොට, පරමාර්ථ කථාව තේරුම් ගන්නත් විදර්ශනාවට උපකාර වශයෙනුත් දැන් මේ වේදනාව බෙදලා බලමු. හැබැයි මේ වේදනාව බෙදන්න ඉස්සෙල්ලා වේදනාව ඔබ එකතු කළේ කොහොමද කියලා මතක් කළොත්. අපි උපකල්පනය කරමු වරුව පුරාවට යම් මට්ටමක වේදනාත්මක ස්වභාවයක් සිය වරක් (100) විතර ප්‍රකට වුණා කියලා. ඒ වගේම උපකල්පනය කරමු ඒ ඒ අවස්ථාවල පොඩි පොඩි වෙනස්කම් තිබුනත් සමාන මට්ටමකින් වේදනාව දැනුන කියලා.

දැන් සියලු අවස්ථා සම්පිණ්ඩණය කරලා ඊයේ තිබ්බ හිසරදය ගැන කල්පනා කරනකොට අර එක එක අවස්ථාවේ තිබ්බ වේදනා ස්වභාවය එකතු කරලා ඒ වගේ සිය වාරයක්





බරපතළ වේදනාවක් තිබුණ කියලාද හිතෙන්නේ, නැත්නම් අර එක එක අවස්ථාවේ තිබ්බ වේදනාව අඩු වැඩි වෙවී වරුවක් පුරාවට තිබ්බ කියලද හිතන්නේ. ඒහෙම නම් වැටහේවි වරුවක් පුරාවට තිබ්බ වේදනාව බෙදන්න යනකොට අපි බෙදන්නේ වේදනාව නෙවෙයි. වේදනාව තිබ්බ කාල පරාසයන්. කොටස් දහසකට බෙදුවත් ඔය ටිකමයි.

ඒ සියල්ල දැක්ක සියල්ල අවබෝධ කළ බුදුරජාණන් වහන්සේ ඒ වේදනාව තිබුණ කාලපරාසයන් නිරූපණය කළා එක චෛතසිකයකින්. සිතත් සමග හටගත් එක්තරා ධර්මයකින්. ඒකට කියන්නේ අරූප ජීවිතඉන්ද්‍රිය කියලා.

ඒක බුදුරජාණන් වහන්සේ ධර්මසංගණියේ අර්ථ දැක්වූවේ මෙහෙමයි.

"යෝ තේසං අරූපිනෝ ධම්මානං ආයු, ඨිති, යපනා, යාපනා, ඉරියනා, වත්තනා,පාලනා, ජීවිතං, ජීවිතින්ද්‍රියං, '' කියලයි.

''මේ අරූපි ධර්මයන්ගේ ආයුෂයක්, තැබීමක්, පැවතීමක් ජීවයක්, කියලයි.

ඉතින් සෑම සිතකම යම් පවත්නා බවක් තියෙන නිසයි මේ සබ්බ චිත්ත සාධාරණ චෛතසිකයක් කියලා අර්ථ දැක්වූවේ. සිත ගැන කොතරම් කුඩා මට්ටමින් කතා කළත් මේ චෛතසිකය අනිවාර්යයෙන්ම දැක්විය යුතුමයි. මෙතනයි බුදුදහමේ කාලය කියන්නේ.

මෙතන තව වැදගත් කාරණයක් තියෙනවා. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, කියන චිත්ත චෛතසික යම් මට්ටමකට කාලයෙන් වෙන් කරලයි තථාගතයන් වහන්සේ

අර්ථ දක්වලා තියෙන්නේ. වෙන්කරලා කිව්වට එක්ව හටගනිමින් එකිනෙකට ප්‍රත්‍යවීම් වශයෙන් සම්ප්‍රයුක්ත වීමක් තියෙනවා.

අවසානයේ මේ සියළු වූ කතාවෙන් ගම්‍ය කළයුතු ප්‍රායෝගික අර්ථයක් තියෙනවා. මුලින්ම තේරුම් ගත යුතුයි පරමාර්ථ තමන්ට අරමුණු වෙනවා, අරමුණු කළ හැකියි කියන එක. ඊළඟට ඒවා අනිත්‍ය ලෙස මෙනෙහි කරන්න දැනටමත් ඔබට පුළුවන් බව.

කොතරම් පොඩි මොහොතක මේ ජීවිත ඉන්ද්‍රිය විද්‍යමාන වෙනවා ද කියන එක බුද්ධ විෂය පිළිබඳ කරුණක්. එක විදර්ශනාවේ දී අප විසින් දත යුතු කරුණක් නොවේ. ඒක දැනගන්න ඕනේ නම් බුදු වෙන්න වෙනවා.

ඒ පොඩි මොහොතත් දෙයක් කරගන්න එපා. මොකද බුදුරජාණන් වහන්සේ කීවේ ඨිති නෙවෙයි. ''**ඨිතස්ස අඤ්ඤතත්තං**'' කියලයි. සිටියහුගේ අන්‍යබවක් පැනවෙනවා කියලයි. ඒ කියන්නේ සතත වෙනස්වීමක් දිස්වෙනවා කියන එකයි.

තවත් කරුණක් තියෙනවා. හැම සිතකම ආයුකාලයන් සමානයි කියලා කරුණක්. ඊට පදනමක් අභිධර්ම පිටකය තුළ නම් පේන්නවත් නෑ. විවිධ මානයන්ගෙන් යුත් විවිධ ලෝක තිබීමෙන් පෙන්නුම් කරන්නේ මේ සිතෙයි රූප වලයි සංඛ්‍යාත ඒ ඒ ලෝකවල වෙනස් බවයි. අර මාලාභාරී දෙවියන්ගේ කතා ප්‍රවෘත්තියෙන් [9] පෙනෙන්නේ ඒ ඒ දිව්‍ය ලෝකවල කාලය ගෙවෙන විදිය මනුස්ස ලෝකෙට වඩා වෙනස් කියලයි.

මේ හිසරදය ගැන කියපු කථාවෙන් මම වටහලා දෙන්න උත්සාහ කළේ චිත්ත චෛතසික පරමාර්ථ කියලා ගත්තොත්,

**9 පතිපූජික කුමාරි වස්තුව - ධම්මපදය - පුප්ඵවර්ගය**





ඒ පරමාර්ථ යනු කාලය තුළ තවදුරටත් බෙදිය නොහැකි කුඩාම ආකාරය කියලා ගැනීම කිසිසේත් ගැළපෙන්නෙ නෑ කියන එකයි. ඒවා ස්වභාව ධර්මයෝ.

චිත්ත චෛතසිකවලට කොහොමත් අවකාශය තුළ බෙදීමක් අදාළ නෑ.

බුද්ධ දේශනාවේ තියෙනවා බෝධිසත්ව කාලේ චක්‍රවර්ති රජවෙලා, ඒ තිබ්බ රාජධානි ගැන සඳහන් කරලා ඒ සියළු දෑ, ඒ සේනාව , හිටපු පරිවාර පිරිස, මහණෙනි මේ සියල්ල අභාවයට ගියා කියලා. ඒ වගේ දේශනා වල අවසානයේ තියෙනවා බොහොම වටිනා වැකියක්. අනමතග්ග සංයුක්තයෙත් මේ වැකිය නිතර දකින්නට පුළුවන්.

**''....භික්ඛවේ, අලමේව සබ්බසංඛාරේසු නිබ්බින්දිතුං ,අලං විරජ්ජිතුං , අලං විමුච්චිතුං''**

'' මහණෙනි , මෙයත් ඇති සියළු සංස්කාරයන් කෙරෙහි කළකිරෙන්න , මෙයත් ඇති විරාගයට පත්වෙන්න. මෙයත් ඇති මිදෙන්නට ''

ඒ කියන්නෙ "මහණෙනි මෙයම ඇති නුඹලාට නිවන් දකින්න" කියලයි.

**බුදුරජාණන් වහන්සෙ ඒ කිව්වේ පරමාර්ථ වල අනිත්‍යතාවයම තමයි.**

වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන්වල (1930-1940) විද්‍යාඥයන් විසින් පරමාණු ඛණ්ඩනය කොට ශක්තිය නිපදවිය හැකි බව පෙන්නුවා. නමුත් බටහිර විශ්ව විද්‍යාල පරමාණු ගැන, අණුක පද්ධති ගැන, ආවර්තිතා වගුව ගැන, අධ්‍යාපනයෙන් බැහැර වුණේ නෑ. පරමාණු යනු හුදු

සංකල්පයක් බව ඔවුන් කීවේ නෑ. මන්ද කුඩා ශක්ති ගොනු සමුදායක් එක්ව පරමාණුක ව්‍යුහය පෙන්නුම් කරන නිසයි.

නොයෙක් රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනයට බෙහෙත් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනයට වැදගත් වන්නේ අන්තර් පරමාණුක සම්බන්ධතාවල වෙනස් වීමෙන් සෑදෙන නව සංයෝගයි. පරමාණු කඩා ශක්තිය ඇති කරත් කිසිදු දැනුම් තේරුම් ඇති විද්වතෙක් පරමාණු නැතැයි නොකියත්. මන්දයත් සිය දහස් වර පරමාණුක ව්‍යුහය තහවුරු කර ඇති බැවිනි. මිනිසුන් එම බෙහෙත් පාවිච්චි කර ලෙඩ සුව කර ගනිති. නොයෙකුත් ප්‍රයෝජනවත් ද්‍රව්‍ය නිපදවා ගනිති. භෞතික පරිසරය දක්නට ලැබෙන නොයෙකුත් සංසිද්ධීන් පැහැදිලි කිරීමට පරමාණුක ආකෘතියෙන් පුළුවන්කමක් ලැබුණා.

ඉන් ඔබ්බට ගොස් පරමාණු සමූහ ලෙස එක්වී අණුත්, අණුක දාමයන් පද්ධති ලෙස සකස් වී පෙන්නුම් කළ (ඩි එන් ඒ) අණුවේ ආකාරය සත්ව ශරීරවල විවිධත්වය යම් මට්ටමකට පැහැදිලි කර දෙනු ලැබුවා.

සත්වයන්ගේ ජීව ක්‍රියාවලිය තේරුම් කිරීමේදී සෛලයක ආකෘතිය විද්‍යාඥයන් හැඳින ගත්තා. අන්වීක්ෂයකින් දැකිය හැකි මෙම ආකෘති පරමාණු විශාල ප්‍රමාණයක එකතුවක්. සෛලයක ආකෘතිය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම රෝග නිවාරණයට, ඖෂධ නිපැයුමට ශරීර සුවතාවයට අතිශයින් වැදගත් වුණා.

විද්‍යාඥයන් සියුම් රූපාකාර ලෙස හඳුනාගත් විද්‍යුත් චුම්භක තරංග යොදා ගෙන රූපවාහිනී, ගුවන් විදුලි සන්නිවේදන උපකරණ නිපදවුණා. අභ්‍යවකාශයේ දක්නට ලැබෙන සංසිද්ධි විස්තර කර ගැනීමට ග්‍රහ පද්ධති, තාරකා පද්ධති ලෙස ගොනු කරගෙන කල්පනා කළ යුතු වුනා.





මෙලෙස කුඩා ම විද්‍යුත් චුම්බක තරංග ආකෘතියේ සිට පරමාණු ලෙස, අණු ලෙස, සෛල ලෙස ඉන් ඔබ්බට ගොස් පරිසරයේ දක්නට ලැබෙන විශාල රූපාකාර ලෙස (ගස් ගල් වැනි), ඊටත් එහාට විශාල ග්‍රහ වස්තු ලෙස සතර මහාභූත විවිධ පද්ධති ලෙස ක්‍රියා කරන ආකාරය තේරුම් යනවා ඇති.

බුදුරජාණන් වහන්සේ මේ වෙනස නොසලකා හැරියේ නෑ. අභිධර්මය තුළ රූප පද්ධති ලෙස ඉහත සඳහන් විවිධත්වය දැක්වුණේ රූපාකාර කිහිපයකින්.

උපචය රූපය, ආපෝ හා වර්ණ රූපයන් ගෙන් මෙය විශේෂයෙන් පෙන්නුම් කරනවා.

**'' කතමං තං රූපං රූපස්ස උපචයෝ?**
**යෝ ආයතනානං ආචයෝ සෝ රූපස්ස උපචයෝ ''**

''යම් ආයතනයන්ගේ එක් රැස්වීමක් ඇද්ද මෙය උපචය රූපය නම් වේ යැයි''

(ධර්මසංගණිය -රූප කාණ්ඩය)

ආයතනයන් ලෙස මෙහිදී ගැනෙනුයේ පඨවි, තේජෝ, වායෝ ඵොට්ඨබ්බායතනය ලෙසත් රූප, ගන්ධ, රස, ශබ්ද ආදි ආයතනත් ඇස්, කන්, දිව ,නාසය, කායායතනයත් ඇතුළුව ධම්මායතනයට අදාළව ඇති රූපමය ආකාරත් එක්ව මෙසේ ඇති රූපමය ආයතන එකොළසයි.

අටුවා හා ටීකාවල මෙම උපචය රූපයේ ඇති වැදගත්කම එතරම් සැලකූ අයුරක් පෙනෙන්නට නෑ ''ජාති රූපස්සේව ඒතං අධිවචනං'' කියලා ධර්මසංගණී අටුවාවෙ එයට අර්ථ දක්වා තියෙනවා. උපචය කියන්නෙ උපත කියලා සැළකු

බවක් පෙනෙන්න තියෙනවා. එම අර්ථකතනය නිසා වෙච්ච පටලැවිලි ලිහන්න ධර්මසංගණී අටුවාවෙ ප්‍රකීර්ණක කාණ්ඩයෙදි ඡේද ගණනක් තර්ක කරන්න අටුවාචාරීන් වහන්සේට සිදුවුණා.

ජාති යන්නෙහි අදහසත් හුදු උපත ම නෙවෙයි. විවිධත්වයෙන් යුත් ධර්මවල උපතයි.

**''තේසං තේසං සත්තානං තම්හි තම්හි සත්ත නිකායේ ජාති සඤ්ජාති...''**

යනුවෙන් ඒ ඒ සත්ව නිකායේ ඒ ඒ ආකාර වූ සත්ව උප්පත්තිය ජාති යන වචනයෙන් අර්ථවත් වෙනවා. කොහේ හෝ අටුවාවක ජාති යන්නට ''සවිකාරං ඛන්ධානං උප්පත්ති '' ලෙස අර්ථකථනයක් තිබුණා මතකයි. විවිධ ආකාර වූ ස්කන්ධයන්ගේ උපත යනු යි.

ඒ ඒ සත්ත්වයන්ගේ විවිධාකාර ශරීර දිස්වනුයේ ඉහත ආයතනයන් එක් රැස් වූ විවිධත්වය මතයි. උදාහරණයක් ලෙස කොටියෙකුගේ හමේ පුල්ලි පේන්නේ වර්ණ රූපය එක් රැස්වුණු විවිධත්වය මතයි. අස්ථියක් පුංචි ළමයෙකුගේ සිට වැඩිහිටියෙකු දක්වා වර්ධනය වෙනවා කියන්නේ ඒ අස්ථියට ආවේණික රූප එතැන එකතු වෙන්න ඕන.

**චය** කියන වචනයේ තේරුම එක්රැස් වෙනවා, ගොඩ ගැසෙනවා කියන එක.

ඇස් කන් අතපය හදවත වකුගඩු ආදිය ඒ ඒ තැන් තැන්වල පිහිටන්න ඕනේ. ඒ සුසන්ධාන බව ඇතිවෙන්න කර්මය බලපානවා. ඒකයි උපචය සංතති රූප විටෙක කර්මජ වෙනවා කියලා ධර්මසංගණියේ දක්වලා තියෙන්නේ. අර ළමයෙකුගේ ඉඳලා වැඩිහිටියා වන මට්ටම දක්වා රූපය





විකසනය වන විට එතන උපචය සංතති රූප දෙකම පෙන්නුම් කරනවා. සංතති යන්නෙහි අර්ථ දැක්වීම උපචය ට සමානයි.

වර්ණ රූපයට දීලා තියෙන අර්ථ දැක්වීම මෙහෙමයි.

කතමං තං රූපායතනං? යං රූපං චතුන්නං මහාභූතානං වණ්ණනිභා සනිදස්සනං, සප්පටිඝං, නීලං, පීතකං, ලෝහිතකං, ඕදාතං, කාළකං, මඤ්ජිට්ඨකං, හරි, හරිවණ්ණං අම්බඞ්කුරවණ්ණං, දීඝං, රස්සං, අණුං, ථූලං, වට්ටං, පරිමණ්ඩලං, චතුරස්සං, ඡළංසං, අට්ඨංසං, සොළසාසංසං, නින්නං, ථලං, ඡායා, ආතාපෝ, ආලෝකෝ, අන්ධකාරෝ,අබ්භා, මහිකා, ධූමෝ, රජෝ, චන්දමණ්ඩලස්ස වණ්ණනිභා, සුරියමණ්ඩලස්ස වණ්ණනිභා,තාරකාරූපානං වණ්ණනිභා, ආදාසමණ්ඩලස්ස වණ්ණනිභා, මණිසංඛමුත්තාවේළුරියස්ස වණ්ණනිභා, ජාතරූපරජතස්ස වණ්ණනිභා, යං වා පන අඤ්ඤම්පි අත්ථි රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං .............ඉදං තං රූපං රූපායතනං. ''

කුමක්ද මෙ රූපායතනය? යම් සතර මහා භූතයන්ගේ දීප්තියත්, විදහා දැක්වෙන ගැටීම් සහිත නිල්, කහ, රතු, සුදු, කළු, මදටිය පැහැ, කොළ, කොළ පැහැ, අඹඅංකුර පැහැ, දික්, කොට, ක්ෂුද්‍ර, මහත්, වෘත්තාකාර, වටකුරු, හතරැස්, ෂඩාස්‍රාකාර, අෂ්ඨාස්‍රාකාර, දාසයාකාර, නිම්නය, තැනිතලාව, සෙවණ, අව්ව, එළිය, අඳුර , වළාකුළු, හිමය, දුමය, දූවිල්ල, සඳ මඬලෙහි පැහැය, හිරු මඬලෙහි පැහැය, තරු පැහැය, කණ්ණාඩියේ පැහැය, මැණික්හක්මුතුවෙරළු මිණි (වෛරෝඩි)පැහැය, රන් රිදී පැහය.......... යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් ඇසුරු කොට පවත්නා හෝ වර්ණයක් වේ නම්..... මෙය රූප ආයතනය නම්.

නිල් රතු ආදී පැහැයන්ට අමතරව කුඩා, මහත්, දිග, කොට, වටකුරු ආදී ලෙසින් වස්තුවක ත්‍රිමාණ බවට යම් සම්බන්ධයක් වර්ණ රූපය ඔස්සේ දක්වා තිබෙන බවයි පෙනෙන්නෙ.

වළාකුළු, හිම, දුම්, දූවිල්ල, ලෙසින් විවිධ පරිසර දක්වමින් බුදු රජුන් වර්ණය කොතරම් ප්‍රායෝගිකව අර්ථ දැක් වූවා දැයි බලන්න.

අන්ධකාරයද වර්ණයට සම්බන්ධව අර්ථ දක්වා තිබීම විශේෂත්වයක්.

වර්ණ රූප පරාසය ඔස්සේ පරිසරයේ ත්‍රිමාන බව ඒ ඒ වස්තු වල විශාලත්වය හැඟීයයි. ශබ්දය. ගන්ධ. රස. වගේ රූප වලින් ත්‍රිමාණ බවක් හැඟෙන්නේ නෑ. සමනලයෙකුගේ පියාපත් ගැන හිතුවොත් එහි වර්ණ පරාසය විහිදී යන අතර සණකම විශාලත්වය සමව පිහිටිය යුතුයි. සතර මහාභූතයෝ ක්‍රමානුකූලව එක්රැස් විය යුතුයි.

ආපෝ ධාතුවට දුන් අර්ථ කථනය මෙහෙමයි.

**''කතමං තං රූපං ආපෝධාතු ?**

**යං ආපො ආපෝ ගතං සිනේහෝ සිනේහගතං බන්ධනත්තං රූපස්ස ඉදං තං රූපං ආපෝ ධාතු. ''**

''යම් දියරයක්, දියර ගතියක්, ස්නේහයක්, ස්නේහගතබවක් රූපයාගේ බන්ධනයක් වේද මේ ඒ ආපෝ ධාතුවයි. ''

තෙල්, ජලය, පැණි වගේ ද්‍රව වැගිරෙනුයේ එහි බන්ධනය නිසාය. ඇතුළාන්ත බන්ධනය දුර්වලවනවිට ද්‍රව්‍ය වාෂ්ප ස්වභාවයක් ගනී. සාමාන්‍යයෙන් ද්‍රව්‍යවල බන්ධනය වැඩිවන





විට ඝන ස්වභාවයක් ගන්නා බැවින් , ද්‍රවමය ගතිය අඩු වන බැවින්, ආපෝ නොහොත් වැගිරෙන ස්වභාවය හා බන්ධනය අතර සම්බන්ධය කුමක් දැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. වායුවේ සිට ද්‍රවයට සිතීමෙන් මීට තරමක පිළිතුරක් ලැබුණු ඇත. වායුවක අන්තර් අණුක බන්ධනය වැඩි වීමේ දී එය වැගිරෙන ස්වභාවයක් ගනී. වායුවේ ඇත්තේ විසිරෙන ස්වභාවයයි. මෙම රූපයක දිස්වන සමස්ත බන්ධනය නිසයි එය විශාල රූපයක් බවට පත්වූයේ.

මෙසේ රූප එක්රැස්වීමත් (උපචය ලෙසින්), බැඳීයාමත් (ආපෝ ධාතුව ලෙසින්) යන ද්විත්ව ක්‍රියාකාරිත්වය තුළින් විශාල රූප පද්ධති සැකසෙන බවත් වර්ණ රූප ඔස්සේ මෙය විදහා දැක්වෙන බවටත් පෙනෙන්නට තියෙනවා.

අටුවා ටීකා යුගයේ බුදු දහමේ උගන්වන රූප විස්තර කරනු වස් ශුද්ධ අෂ්ටක නමින් රූප ආකෘතියක් ඉදිරිපත් විය. කුඩාම රූප කලාපය ලෙස ගත් ශුද්ධ අෂ්ටකයේ සතර මහාභූතත් උපාදාය රූප ලෙස වර්ණ, ගන්ධ, රස, ඕජා යන රූපද ඇතැයි සලකනු ලැබීය. තවත් විවිධ උපාදාය රූප සතර මහා භූත වලට සම්බන්ධවන ආකාරය අනුව නවක, දශක, තේරසක, ආදී රූප කලාප ලෙස පවතින බවත් මෙම කලාප අතර අවකාශය පැතිර ඇති බවත් සලකන ලදී. දසක කලාපයක් ලෙස ශුද්ධ අට සමඟ ජීවිත ඉන්ද්‍රිය රූපයත් ඇසත් එක්ව ගෙන දැක්වියහැක.

සතර මහාභූත එකිනෙකට සම්බන්ධව එක්ව සමායෝග වී ඇති බව පට්ඨානයේ ප්‍රත්‍ය ක්‍රමයට අනුව සත්‍යයකි. උපාදාය රූපද සතර මහා භූත මත පදනම්ව ඒවා ඇසුරු කොට එක විට ජනිත වන බව පට්ඨානයෙන් පැහැදිලිය.

දැන් පාන් පෙත්තක් ගැන සිතා බලන්න. එය ඇල්ලුවොත් යම් තද ස්වභාවයක් දැනෙනු ඇති. පාන් පෙත්ත දෙපසට ඇද්දොත් එක්වරම වෙන් වී නොයන්නේ එහි සමස්ත බන්ධනයක් ඇති නිසාය. එහි යම් පිපුනු ගතියක් වේද, තද කළොත් ප්‍රසාරණයවන බවක් වේද එය වායු ලෙසින් අර්ථකථනය කළ හැක. එහි යම් උණුසුමක්වේද එය තේජෝ ස්වභාවයයි. එහි යම් සුදු පැහැයක් ඇත. ගඳ සුවඳක් විද්‍යාමානය. අනුභව කළොත් රසයකුත් දැනේවි. ශරීරයට ආහාරයක් වේවි.

මෙලෙස සතර මහා භූත, උපාදාය රූප සතරකුත් ලෙස රූප අට ආකාරයක් සලකා ගත හැක. මේ පාන් පෙත්ත කොටස් අටකට බෙදුවා නොව පාන් පෙත්ත පුරා විහිදී යන ලෙස රූප ස්වභාව අටක් ගැන සිතීමය.

නමුත් මෑත කාලයේ සංග්‍රහ වෙච්ච අභිධර්ම ග්‍රන්ථ වල ශුද්ධ අෂ්ටකය ලෙස අදහස් කළේ තවදුරටත් නො බෙදිය හැකි ඉතා  සියුම් ඒකකයන්ය. අවම උපාදාය රූප ප්‍රමාණයක් ලෙස වර්ණ, ගන්ධ, රස, ඕජා යන රූපාකාර සතර මහාභූත සමග තිබිය යුතු බව පට්ඨානයේ දක්වා නැහැ. වෙනකක් තබා ශුද්ධ අෂ්ටක කියලා වචනයක් අභිධර්ම පිටකයේ නැහැ.

ඇත්තෙන් ම අභිධර්ම පිටකය තුළ අසඞ්ඛ්‍ය තලයේ දී ඉහත උපාදාය රූප සතරෙන් වර්ණය සතර මහා භූත ඇසුරු කොට පවතින බව දක්වා ඇතත් අනෙක්වා ගැන සඳහනක් නෑ. කෙසේ හෝ වේවා මෙම ශුද්ධ අශ්ටක සමූහයන් එක්ව අපට පරිසරයේ දක්නට ලැබෙන විවිධ රූප (ගස්, ගල්, සත්ත්ව ශරීර ආදිය) එළෙසින් දිස්වන බව සමහර





අභිධාර්මිකයන්  සිතනවා. මෙවන් සරල ශුද්ධ අශ්ටක ආකෘතියකින් භෞතික පරිසරයේ විවිධත්වය හා සංසිද්ධීන් විස්තර කළ හැකි යැයි සිතන්න අමාරුයි.

දියමන්තියක තද ස්වභාවයට, කාබන් පරමාණු එකට බැඳී සෑදුන අණුක ව්‍යුහය මූලික වෙනවා. කාබන් පරමාණු වෙනත් ආකාරයකට සම්බන්ධ වූ විට එතරම් තද නැති අඟුරු ආකාරය ගන්නවා. කාබන් පරමාණුව තුළ පිහිටි අති සියුම් සතර මහාභූත ආකාර දියමන්තියේ තද ගතියට එතරම් බලපෑමක් නොකරන බවයි පෙනෙන්නේ.

බොහෝ වස්තුවල ගෝචර වන පඨවි ස්වභාවය අන්තර් අණුක පද්ධති හේතුකොට දිස්වනවා මිස අණුවේ පරමාණුව තුළ ඇති සතර මහාභූත නිසාම නෙවෙයි. ආලෝකය වැනි සියුම් විද්‍යුත් චුම්බක රූපාකාරවල තද ගතියක් ගෝචර නොවන බැවිනි.

නමුත් සමස්ත අණුක පද්ධතියක් කරණ කොට සැකසුන ගෝචර වූ පඨවි ස්වභාවය පරමාර්ථයක් දැයි කෙනෙකුට ගැටලුවක් මතු වෙන්න පුළුවන්. පරමාර්ථ යනු අනන්‍ය ආකාර යැයි ගතහොත් පටලැවිල්ලක් නෑ. එම තද ස්වභාවය සිතින් මවාගත්තක් නොව සත්‍ය වශයෙන් විද්‍යමානවන ස්වභාවයක්මයි.

වස්තුවක සමස්ත බන්ධනයක් නැත්නම් ඇල්ලූ සැණින් කැඩී යනු ඇත. දෙපසට ඇද්ද විට ම වෙන් වෙනු ඇත. අවකාශයෙන් වෙන්වුණු සරල ශුද්ධ අෂ්ටක ආකෘතියකින් මේ කාරණය කොහොමද පැහැදිලි කරන්නේ? සමහර තැනක සතර මහාභූත අවකාශයෙන් වෙන්ව ඉතා සියුම් ලෙස නොපවතිනවා කියනවා නෙවෙයි. මේ ගැටලුව නිසා මෑත කාලයේ සමහර අභිධර්ම ආචාර්යවරුන්ට අන්තර්

කලාපීය බන්ධනයක් ගැන සඳහන් කරන්නට සිදු වුණා. නමුත් පට්ඨානයේ නය ක්‍රමය අනුව ඊට ඉඩක් නෑ. අටුවා වල ද අන්තර් කලාපීය සම්බන්ධයක් ගැන දක්නට ලැබුණේ නැහැ.

අටුවාවේ ශුද්ධ අෂ්ටක යනු අති සියුම් කුඩාම ඒවා ලෙසද සඳහනක් දක්නට ලැබුණේත් නැහැ. උදාහරණයක් ලෙස ඇස සහිත කර්මජ කලාපය ගැන ධර්මසංගණී අටුවාවේ සඳහන් වෙන්නේ උකුනු හිසක් පමණ පදෙසක පැතිර ඇති රූපයක් කියලයි. ඒ ප්‍රමාණය පරමාණු මට්ටමින් ගත්තොත් සැලකිය යුතු විශාලත්වයක්. අටුවාවේ ශුද්ධ අෂ්ටක වචනයෙන් ශුද්ධ යනුවෙන් අදහස් කළේ නවක, දසක, තේරසක ආදී කලාප වලින් වෙන් කොට දැක්වීම විනා නොබෙදිය හැකි අර්ථයකින් නොවන්නත් පුලුවන්. අර්ථකථාවෙ එන කාරණා එක් පුද්ගලයෙක් තනි අධ්‍යාශයකින් කියන ඒවාම නෙවෙයි. අදහස්වල සංකලනයක් එහි තියෙනවා. සමහර තැනක ශුද්ධ අෂ්ටක කියලා අදහස් කළදේ නෙමෙයි තව තැනක තියෙන්නෙ.

රස, ගන්ධය වගේ උපාදාය රූපයන්ගෙත් වෙනස්කම් දිස්වෙන්නේ අණුක මට්ටමෙන්. සමහර සුවඳ විලවුන් වර්ග නිෂ්පාදනයට මිනිස් මුත්‍ර භාවිතා කරනවා. පරමාණුක ව්‍යුහයේ වෙනසක් නොවී අණුක සැකැස්මේ වෙනසකින් නව සංයෝගයක් සෑදීමෙන් ගඳ සුවඳක් බවට පත් කෙරුණා. පරමාණුක ව්‍යුහයේ වෙනසක් නොවූයේ යැයි කීවේ එහි අභ්‍යන්තරිකව ඇති රූප කලාප වෙනස් නොවන බව නොවේ. ඒවා වෙනස් වුවත් සමස්තයක් ලෙස පරමාණුක ආකෘතිය ස්ථාවරව පවතින බවයි. ගස්, ගල්, කඳු වෙනස් වුවද පෘථිවියේ ආකෘතිය සැලකිය යුතු වෙනසකට භාජනය නොවන්නාක් මෙනි. එතකොට සුවඳ කියලා දැනුණේ





පරමාණුව තුළ තිබ්බ සියුම් රූපවල සුවඳ ද, නැත්නම් අණුක පද්ධතියකින් දැක්වුණු සුවඳද?

හැබැයි වර්ණ රූපය නම් ඉතා සියුම් සතර මහා භූත පද්ධතීන් කෙරෙනුත් විද්‍යාමානවන බව පේන්න තියෙනවා. සාරාංශයක් ලෙස කීවොත් විවිධ ආකාරයේ රූපාකාර දිස්වනුයේ විවිධ විශාලත්වයෙන් ගන්නා සතර මහා භූත පද්ධතිවලින් බවයි පෙන්නුම් කරන්නේ. ඒ නිසා ඒ ඒ මට්ටමින් ශුද්ධ අෂ්ටක ආකෘති පනවා ගත යුතු බවටයි පේනෙන්නෙ. විවිධ මට්ටමින් ගත්තද ඒ සියල්ල රූපයේ අනන්‍ය ආකාරයන්.

දැන් පොඩි ළමයෙක් ගැන පුංචි කතාවක් කියන්නම්. ඔන්න පුංචි ළමයෙක් ඉන්නවා. තවම සමහර කෑම දැකලා නෑ. එක දවසක් අම්මා පොඩි එකාට කේක් කෑල්ලක් ගෙනත් දෙනවා. ඇතදීම ළමයා කේක් කෑල්ල දැක්කා. චක්ඛුවිඤ්ඤාණය. නම හුරු කරගන්නත් එක්ක අම්මා ඒකෙ නම සද්ද කරලයි දෙන්නෙ. සෝතවිඤ්ඤාණය. අතට ගත්ත ගමන් ඒකෙ මෙලෙක් ගතිය දැනුනා. හොඳ සුවඳකුත් දැනේවි. අතට දුන්න එක හපලා බලන එක පොඩි එකාගේ පුරුද්ද නිසා අන්න ජීවිතයේ පළමු වරට කේක් රසයක් වින්දා. ජිව්හාවිඤ්ඤාණය. දැන් කේක් ගැන හැඟීමක් මනසේ තැන්පත් වුණා. සළායතන ක්‍රියාකාකාරිත්වයේ කරකැවිල්ලක් මෙතැන සිද්ධ වුණේ. ඔය අත්දැකීම් ටික ලබන්න ඇස, කන, දිව, නහය, කය තියෙන්න ඕනේ. බාහිර රූපත් සම්බන්ධ වුණා.

මනෝවිඤ්ඤාණ අවස්ථාවේදී පොඩි ළමයා තේරුම් ගත්තේ කේක් කියලා දෙයක් ලෝකෙ තියෙනවා. ඒකෙ ලක්ෂණ තමයි හොඳ සුවඳක්, රසයක්, මෙලෙක් බවක් තියෙනවා කියලා. අර අත්දැකීම ලබන වෙලාවේ ඇති

උනානේ වින්දනයක්. ඒ නිසා දැන් කේක් ගැන සුභ සංඥාවක්. ඊළඟට ආශාවක්. කබඩ් එකේ කේක් තියෙනවා අම්ම හංගල. ඒක මට ලං කරගන්න ඕනා. මෙතැන මම ඉන්නවා. කේක් අතන තියෙනවා. දැන් සිතෙන් කේකුයි තමන්වයි  ඇඳෙනවා. තණ්හාවත් එක්ක.

පුංචිඑකා කියලා ගත්ත පෘථග්ජනයාට වැරදුනේ කොතනද. ආයතන පහෙන් ගත්ත දැනුම මනායතන අවස්ථාවේ වැරදි ලෙස ගොනු කර ගත්තා. මෙතන පුංචි එකා කියලා ආයතනවලට ඇඳලා, ආයතන පුද්ගල ප්‍රතිබද්ධව කීවාට එයාගෙ දෘෂ්ටිකෝණයෙන් බලන්න පාඨක ඔබ දක්ෂ වෙන්න. පුංචි ළමයාව අයින් කරලා ආයතන ක්‍රියාවලියක හටගැනීම පැත්තෙන් බලන්න .

ආයතන පහේ අත්දැකීම් සත්‍ය වශයෙන් සිද්ධ වුණා. හැබැයි චක්ඛුවිඤ්ඤාණය තියෙන වෙලාවේ සෝතවිඤ්ඤාණ නැහැ. ඒක තියෙන වෙලාවේ ජිව්හාවිඤ්ඤාණය නැහැ. මේ සියල්ලෙන් ආපු දැනුම එක් තැනකට වැරදියට අමුණනවා. දැනුම අමතක කරන්න නෙවෙයි ඕනෙ. වැරදියට අමුණගෙන ඉදිරියට යන එකයි නවත්තන්න ඕනා.

ළමයාට ඇති වෙච්ච වැරදි හැඟීමක් තමයි මම මෙතන ඉන්නවා. අර කේක් කෑල්ල අතන තියෙනවා. ආයිත් කේක් කන්න පුළුවන් වුණත් බැරි උනත් මම ඉන්නවා. මම ජීවත් වෙනවා. නමුත් අර කේක් කෑල්ලත් එක්ක ගත වෙච්ච අත්දැකීම් ටික එකින් එක අයින් කරොත් ඊට පස්සේ වෙනත් ධර්මයන් එක්ක ලබන අත්දැකීම් සියල්ලත් සිදු නොවුණා නම්, කේක් කෑල්ල ගැන පස්සේ කල්පනා කිරීම් වගේ මනෝ විඤ්ඤාණ අත්දැකීම් ටිකත් සිදු නොවුණා නම්, ඒ ළමයා ජීවත් වුණා කියලා කියන්න පුළුවන්ද? ඒ වගේම



සළායතන විදර්ශනාව

ඒ අත්දැකීම්වලට පාදක වෙච්ච ඇස, කන, දිව, නහය හා කය කියන ආයතන පහත් ඒවා පිහිටලා තිබ්බ ශරීරයත් හටගෙන නොතිබුණා නම්. එහෙමනම් ළමයා කේක් කෑල්ල ඇතත් නැතත් මම ඉන්නවා මම ජීවත් වෙනවා කියලා හිතුවොත් හරිද?

නමුත් කේක් එක කාලා ඒක ගැන කල්පනා කරනකොට ළමයට හිතුනෙ, මම කේක් එක ගැන කල්පනා කරනවා. මම කල්පනා කළා කියලයි. මම අනෙකක්, කේක් එක අනෙකක් ලෙසටයි හැඟෙන්නේ.

කේක් එක අරමුණේ තියෙද්දී, එයින් පරිබාහිරව ඔහුගේ ජීවිතය අර්ථ දක්වන්න බැරි ස්වභාවයක් තියෙනවා. නමුත් ළමයා යනු කේක් නොවන්නේ වෙන වෙන ධර්මත් එක්ක තවත් සළායතන කරකැවිලි සිද්ධ වෙන නිසා.

කාලයක් තියෙන ස්ථිරසාර ව පවතින කේක් එකක් බාහිර පරිසරයේ තියෙනවා කියලා හිතනකොටත් පොඩි පටලැවිල්ලක්. පටලවා ගන්න එපා  කේක් නෑ කියලා නෙමෙයි කිව්වේ ස්ථිර සාර නිත්‍ය කේක් නෑ කියලයි අදහස් කලේ.

ඒ ඒ අවස්ථාවේ පංච විඤ්ඤාණය සමග ලබපු අත්දැකීම් විතරයි සත්‍ය වශයෙන් තිබුනේ, සත්‍ය වශයෙන් කේක් කෑල්ලක් නෑ කියලා  කිව්වොත්. එහෙම කියන්න හදිස්සි වෙන්න එපා. මූලපරියාය සූත්‍රය මතකයිනේ.

කේක් කෑල්ල ගැන හරියටම හැඟෙන්න ඕන කොහොමද කියලා  දැනගන්න ඕනා නම් කරන්න තියෙන්නේ අර ලබන අත්දැකීම් ඒ කියන්නේ චක්ඛුවිඤ්ඤාණ සෝතවිඤ්ඤාණ ආදියත් ඒ සමග හටගත් වේදනා, සංඥා, සංස්කාර ආදිය

ත්‍රිලක්ෂණයට නංවන එකයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙස මෙනෙහි කරන එකයි. ඒ අත්දැකීම්වලට පාදක වූ ඇස කන දිව කය වගේ රූපත් ඒවා පිහිටි සතර මහාභූත ශරීරයත්, ගෝචර වෙච්ච බාහිර අභ්‍යන්තර රූපත් ත්‍රිලක්ෂණයට නංවන එකයි.

මේ සළායතන විදර්ශනාව කරවලා මලියදේව මහරහතන් වහන්සේ ලංකාවේ බොහෝ දෙනෙක් රහත් භාවයට පැමිණෙව්වා.

කෙනෙකුට හිතන්න පුළුවන් කේක් කෑල්ලක් එක්ක ගතවෙච්ච සළායතන කරකැවිල්ල අනිත්‍යයි තමයි. මේ මඤ්ඤනාත් වැරදි තමයි. ඒත් ඉතින් මොකද කියලා.

සළායතන අත්දැකීම් අනිත්‍ය වගේම තමන් කැමති ආකාරයට පවතින්නේ නෑ. කේක් විතරක් නෙමේ අපායේ කටුත් කන්න වෙනවා. පෙරේතයෝ වෙලා සෙම් සොටු මළ මුත්‍ර කන්න වෙනවා.

දැන් මේ කතාව අහලා සසර බිය දැකලා ළමයා ටිකක් ලොකු වුණාට පස්සේ කල්පනා කරනවා, ආහාරයට තියන ආසාව නැති කරගන්න ඕනා කියලා. කේක් කෑල්ල අවබෝධ කරගත යුතුයි කියලා කල්පනා කරලා අර විද්‍යාඥයන් කරා වගේ අන්වීක්ෂයකින් ඒකෙ ඇතුළාන්තය බැලුවොත් ඒ තණ්හාව දුරු වේවිද ? එහෙම නැත්නම් ගැඹුරු සමාධියකින් කේක් කෑල්ල තුළ සියුම් රූප වලට හිත යොමු කලොත්.

විද්‍යාඥයන් එහෙම කළේ ලෝකෙ සැපයි කියන පදනම ඉඳගෙන. තවත් ජීවිතය සැපවත් කරන ක්‍රම සොයා ගන්නයි. බෞද්ධයා රූප බෙදාගන්න ඕනි විදර්ශනා භාවනාවට උපකාරයක්වන ලෙසිනුයි. හරියට බුදුරජාණන් වහන්සේ දෙතිස් කුණපයක් දැක්වූවා වගේ.





සමහර අය ඉන්නවා ගැඹුරු සමාධියකට සම වැදිලා සියුම් ශුද්ධ අශ්ටක දකින අය. සමාධිය උපකාර කරගෙන ශරීරයෙ සියුම් රූප කෙනකුට පෙනෙන්න පුළුවන්. සමාධිය දියුණු කරගත්ත එක ඔහුගේ දක්ෂතාවයක්. ඔහුට පිරික්සා බලන්න පුළුවන් ඒ දැකපු ශුද්ධ අෂ්ටකවල සත්‍ය අසත්‍ය බව. එම ශුද්ධ අෂ්ටකවල ගඳ සුවඳ රස කොහොමද තමන් අත්දැක්කෙ කියලා කල්පනා කළොත්. ශුද්ධ අෂ්ටයක් දැක්කායි කියන්න අටම දකින්න එපැයි. තමන් ඉදිරියේ ගඩොල් ගොඩක් තියෙනවා කියලා දැනෙන්නේ එක එක ගඩොල යම් තරමින් හරි වෙන් වෙන්ව පෙනෙන නිසානෙ.

රූපයේ අනිත්‍යතාව ක්‍රමානුකූලව මෙනෙහි කිරීමටයි විවිධාකාර රූපයන් ගැන යෝගාවචරයෙකු අධ්‍යයනය කරනු ලබන්නේ. හේතුඵල සම්බන්ධතා මැනවින් අවබෝධ කර ගැනීමටයි.

නැවතත් මතක් කරලා දෙන්න වෙනවා මේ ටීකාවල හා මෑත කාලයේ සම්පාදන වූ අභිධර්ම ග්‍රන්ථවල ඉදිරිපත්ව වූ කාරණා විවරණය කරන්නේ අවඥාවට ලක්කිරීමට නෙමෙයි. ඒවා බොහොමයක් සම්පාදනය කළේ සිල්වත් ගුණවත් උත්තමයෝ. බොහොම සාරවත් කරුණු ඒවායෙ තියෙනවා. මේ දුර්වලතා ගැන සැලකිලිමත් වෙමින් පාඨකයන්ට පුළුවන් වඩාත් හොඳින් ඒ පොත් පරිශීලනය කරන්න.

රූපයේ අනිත්‍යතාවය ගැන සලකද්දී අටුවා ටීකාවල සඳහන් විශේෂ කරුණක් නම් , රූපයක් හෝ ශුද්ධ අෂ්ටක කලාපයක් චිත්තක්ෂණ 17 ක කාලයක් පැවත බිඳීයන බවයි. මෙය අභිධර්මය පිටකයේ සඳහන් නොවන සුවිශේෂිත කරුණක්.

චිත්ත වීථි සැකැස්ම තීරණයේ දී මෙන්ම රූපයේ අනිත්‍යතාවය අනුමාන ලෙස සිතාගැනීමට මේ කරුණ වැදගත් වෙනවා.

මුළු විශ්වයේම තුන් කාලය පුරාවට හටගත් සෑම රූපයක්ම චිත්තක්ෂණ 17 කින් බිඳී යා යුතුය. මෙවන් විශ්වීය ධර්මතාවයක් බුදුරජාණන් වහන්සේ අභිධර්මය දේශනා කරද්දී නොවදාළේ මන්දැයි සිතාගත නොහැක. එය සත්‍යය නම් බුදුහිමියන් එය අටුවා මගින් ලොවට ඉදිරිපත් නොකරණු ඇත. සෘජුවම ධර්මසංගණියේ රූපකාණ්ඩය ආරම්භයේදී ඒකක කාණ්ඩයේ දී "සබ්බං රූපං සත්තරස චිත්තක්ඛණිකා " (සියලු රූපයනට චිත්තක්ෂණ 17ක් ආයු ඇත) ලෙසින් ඉදිරිපත් කරණු ඇති.

අටුවා ටීකාවල රූපයක ආයු කාලය සම්බන්ධයෙන් පොදු එකඟතාවයක් නෑ. විවිධ මත තියෙනවා. පුරාණ අටුවාවේ තියෙන්නේ (16) ක් කියලා. බුද්ධඝෝෂ හිමියන් යමක ප්‍රකරණයේ කාරණයක් ඉදිරිපත් කරලා ඒක (17) ක් විය යුතුයයි කියලා අදහසක් ඉදිරිපත් කළා. පුරාණ අටුවාව කීවේ බුද්ධඝෝෂ හිමියන් අර්ථකථා ලියන්න පාදක කරගත් ඊට පෙර තිබූ හෙළ අටුවාවයි. නැවත අභිධර්ම මූල ටීකාවේ මෙය 16ක් විය යුතු බවට තර්කයක් ඉදිරිපත් වුණා.

මේ වගේ අවිනිශ්චිත කරුණු මත තමන්ව සසරින් එතෙර කරවන විදර්ශනා භාවනාවේ පදනම් තබාගැනීම බුද්ධිගෝචර නෑ. ත්‍රිපිටකයේ ඇති නිශ්චිත කරුණු මතම විදර්ශනාවේ පදනම් ගොඩනගා ගත යුතු බවයි අපගේ අදහස.

මේ කරුණ ගැන විවේචන ඉදිරිපත් කරනුයේ සෘජුවම මෙය විදර්ශනාව නොමග යැවීමට බලපාන නිසායි. රූපයේ





අනිත්‍යතාව මෙනෙහි කරන්නේ කෙසේදැයි අද බොහෝ දෙනකුට ගැටලුවක් වී තිබෙන්නේ මෙවන් විවරණ නිසයි. දීඝනිකායෙ පාථිකවර්ගයෙ අග්ගඤ්ඤ සූත්‍ර අර්ථකථාවේ, හඳේ පළල යොදුන් 49 යි ඉරේ පළල යොදුන් 50 යි කියලා සඳහන් වෙනවා. ඒ කථාව හරි වුනත් වැරදි වුනත් එය විදර්ශනා භාවනාවට බලපෑමක් නැහැ.

යමක් යම් හේතූන්ගෙන් හට ගන්නේ ද එම හේතු නැතිවීමෙන් එම ධර්මය නැතිවී යන බව දහම් න්‍යායයි.

**''රූපං භික්ඛවේ අනිච්චං, යෝපි හේතු යෝපි පච්චයෝ. රූපස්ස උප්පාදාය සෝපි අනිච්චෝ, අනිච්ච සම්භූතං භික්ඛවේ රූපං කුතෝ නිච්චං භවිස්සති''**

**සහෙතු අනිච්ච සූත්‍රය- ස.නි.ඛන්ධ වර්ගය.**

''මහණෙනි රූපය අනිත්‍යයි. රූපය ඉපැදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද එය ද අනිත්‍යයි. අනිත්‍ය දෙයකින් හටගත් රූපය මහණෙනි කෙලෙස නිත්‍ය වන්නේ ද?''

(17) කථාවට අනුව රූප නැතිවනුයේ කාලය ගෙවී යාමෙනි. රූපය බිඳී යාමට හේතුවක් අවශ්‍ය නොවන බවත් එය අනිවාර්යයෙන්ම බිඳී යා යුතු බවත් සමහර විට අහන්න ලැබෙනවා. නාම-රූප ක්ෂණයක් ක්ෂණයක් පාසා බිඳී යන බවත් සමහරුන් පවසනවා. සාමාන්‍යයෙන් මේ කියමන්වලින් අදහස් වන්නේ හේතු නැතිවීමෙන් නැති වී යාමක් නොව කාලය ගෙවී යාමෙන්වන බිඳීමකි.

විදර්ශනා ඤාණවල භංගානුපස්සනා ඤාණය කියලා සඳහන් වෙනවා. එය නාම ධර්මවලට පමණයි. සැක ඇත්තෝ පටිසම්භිදාමාර්ගයෙහි භංගානුපස්සනා ඤාණයේ නිද්දෙස වාරය බලත්වා.

ක්ෂණයක් පාසා නාමරූප බිඳෙන්නේ යැයි කී විට මේ ක්ෂණය කුමක්ද කියලා ගැටලුවක් පැන නගිනවා. නාම-රූප වලට පරිබාහිරව කාලය කියා දෙයක් නොපැනවෙන නිසා. නාම-රූප ක්‍රියාකාරීත්වය තුළින්මයි කාලය පිළිබිඹු වෙන්නේ. කාලය හෝ අවකාශය තුළ නාම රූප හට ගන්නේ යැයි අභිධර්මය ගැඹුරින් දත් අයෙක් කියන්නේ නෑ.

සමහරවිට ක්ෂණය යනු සිතක් පවත්නා කාලය නැත්නම් රූපයක් පවත්නා කාලය ලෙස අර්ථ දක්වනවා. එවිට සිතක් පවත්නා කාලයක් පාසා සිත බිඳී යනවා කීවා වැනියි. රූපයක් පවත්නා කාලය තුළ රූපය බිඳී යනවා කීවා වගෙයි. මෙය එක තැන කරකැවෙන චක්‍රීය අර්ථ දැක්වීමකි. ( circular definition ) අමුතු අර්ථයක් නැති කියමනක්.

යමකපාලියේ ඛණ යන වචනය යොදනුයේ අවස්ථාව යන අරුත දීමටයි. යමක ප්‍රකරණයේ නය ක්‍රමය පිරික්සීමෙන් මෙය තෝරා ගත හැකියි. යමකයේ එන උප්පාදක්ඛණේ , භංගක්ඛණේ යන්න උපදින අවස්ථාවේ, බිඳෙන අවස්ථාවේ ලෙසින් ගත යුතුය. ඛණය දෙයක් කරගත් යුතු නැත. සිතකට උප්පාදභංග ලෙසින් ඛණ 2 ක් ඇතැයි අසනවිට කෙනෙකු ඛණය දෙයක් කර ගන්නා බවයි පෙනෙනනේ. ඛණ දෙක එක වෙලාවේ තියෙනවා වගේ හිතෙනවා.

මෙය අතීත අනාගත වර්තමාන තුන් කාලය පටලවා ගැනීමක්. ඉතින් යමෙක් කාලය තුළ නාම-රූප ධර්මයන් බිඳී යනවා බලන්න වෙහෙසුනත් ඔහු වැරදි පාරකයි යන්නේ. උතුම් අවස්ථාව ඔහුට මග හැරෙන්න පුළුවන්.

**"ඛණෝ වෝ මා උපච්චගා"**

"උතුම් අවස්ථාව ඔබලා ඉක්ම නොයාවා ''

**ධම්මපදය**





ගසක ප්‍රාණවත්ව තිබූ කොළයක් කලකට පසු පැහැය වෙනස් වී වේළුණු දුඹුරු පැහැයක් සහිතව දිස්වේ. ප්‍රාණවත්ව තිබූ කොළයේ දිරාගිය අවස්ථාව ද අර වේලිච්ච කොළය, එහෙම නැත්නම් ප්‍රාණවත් කොළය එතැනම නැතිවී දිරාගිය අවස්ථාව අමුතුවෙන් හට ගත්තේ ද ?

සෑම කොළයක් ම දිරා නොයයි. කොළ පැහැති කාලයේදීම අවශ්‍ය නම් පුච්චා දැමිය හැක. තරුණ මනුස්ස ශරීරයත්, ඊට පසු කලෙක දිස්වන වයස්ගත ශරීරයටත් එසේම ගලපාගන්න. එසේනම් කොතැනදී ද හරියටම බිඳුණේ. ඒක සොයන්න යන්න එපා. ඒක කවදාවත් ප්‍රත්‍යක්ෂ කරන්න බැරි වේවි. ඒ නමුත් මේ දෙය ප්‍රත්‍යක්ෂ කළ හැක. කොළපාට අවස්ථාව ඒකාන්තයෙන්ම නැති වූ බව, දිරාගිය අවස්ථාවත් ඒකාන්තයෙන් නැති වූ බව. ඒ ඒ අවස්ථා හටගත් අවස්ථාවන් බව ප්‍රත්‍යක්ෂ කළ හැක.

නවසීවථික භාවනාවේ බුදුරජාණන් වහන්සේ මළ සිරුරක විවිධ අවස්ථා දක්වන්නෙ එක කාරණයක් තමයි ඒ ඒ අවස්ථා නැති වන බව දැක්වීමට, ඒ ඒ රූප ස්වභාවයෝ අස්ථි, නහර, මස්, ආදී අවස්ථා නැති වන බව දැක්වීමට, එය ඒත්තු ගැන්වීමට. මේකට කාලය පටලවා ගන්න අවශ්‍ය නෑ. කාලය පටලවා ගත්ත නිසයි, රූපයේ ක්ෂණ භංග වැදගත් කියලා හිතූ නිසයි, අර බුදුරජාණන් වහන්සේ පෙන්වපු අනිත්‍යතාව මදි වුණේ. කායානුපස්සනාව විශ්වාසයෙන් වඩන්න බැරිවුනේ. කායානුපස්සනාවේ ඔක්කොම තියෙන්නෙ ලොකු අරමුණු නේ. දෙතිස් කුණපය, ඉරියව්, මළමිණී, හුස්ම, සතර මහාභූත ආදියනේ.

නැවත මතක් කරන්න වෙන්නේ අනිත්‍ය සංඥාව ඔබ නොදන්න කම නෙවෙයි ප්‍රධාන ප්‍රශ්නේ. ඒක භාවිතා බහුලීකෘත නැති එක. වඩපු ටික අමතක වෙලා යන එක.

ඒකයි මරණානුස්මෘතිය වඩලත් නිවන් දකින්න පුළුවන් කියලා බුදු හිමියන් කිව්වේ.

**''ඒකධම්මෝ, භික්ඛවේ, භාවිතෝ බහුලීකතෝ ඒකන්ත නිබ්බිදාය විරාගාය නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. කතමෝ ඒකධම්මෝ? මරණස්සති.''**

අංගුත්තරනිකාය - ඒකකනිපාතය - ඒකධම්ම වර්ගය

''මහණෙනි, එක්ධර්මයක් භාවිත බහුලීකෘත කළවිට ඒකාන්තයෙන් කළකිරීම විරාගාය නිරෝධය සන්සිඳීම විශිෂ්ටඥාණය අවබෝධය නිවන පිණිස වේ. කුමක්ද එම එක්ධර්මය? එනම් මරණානුස්මෘතියයි.''

අලව්නුවර හිටිය පේශකාර දියණිය නිවන් දැක්කා මරණානුස්මෘතිය වඩලා. නාම-රූප ගැන ගොඩක් දැනගෙන හිටියා කියලා හිතන්න අමාරුයි.

මේ රූප ගැන, ඒවගේම රූපයේ අනිත්‍යතාව සම්බන්ධව, බොහොම වැදගත් කරුණු සමුදායක් තියෙනවා පාඨකයන් දැනුවත් විය යුතු. සමහර කාරණා ටිකක් අභිධර්මය උනන්දු වන අභිධර්ම පිටකයේ එන කාරණා කොහොමද තේරුම් ගන්නේ කියලා විමසිලිමත්වන අයට වැදගත් වේවි. අනික් අයට කවදහරි අභිධර්මය ඉගෙන ගන්නකොට ප්‍රයෝජනවත් වේවි. නමුත් අනිත්‍යතාවය සම්බන්ධව ඉතාම වැදගත් කාරණයක් ඉදිරියටයි එන්නේ. එකේ මර්මස්ථානය ගැන. එක මගහැර ගන්න එපා.

රූපවල ආයුකාලය ගැන කල්පනා කරනකොට ඊට සම්බන්ධ වන විශේෂ රූප ස්වභාවයක් තියෙනවා. ඒකට කීවේ රූප ජීවිත ඉන්ද්‍රිය කියලා. සත්ත්ව ශරීරවල කර්මය





හා සම්බන්ධ රූපවල දකින්න පුළුවන් ලක්ෂණයක් මෙයින් නිරූපනය වෙනව.

ධර්මසංගණියේ මෙහෙමයි ඒකේ අර්ථ දැක්වීම.

**"තේසං රූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං''** කියලයි.

මේ (කර්මජ) රූපි ධර්මයන්ගේ ආයුෂයක්, තැබීමක්, යෑමක්, වත්තනයක්, පැවතීමක්, ජීවයක්, කියලයි අර්ථ දැක්වෙන්නේ

කර්මජ නොවන ඍතුසමුට්ඨාන (ඍතුජ), ආහරජ, චිත්තසමුට්ඨාන (චිත්තජ), රූපවලට සම්බන්ධව මේ රූප ආකාරය දක්වලා නැහැ. පට්ඨානයේ නය ක්‍රමවලින් එය පැහැදිලි වෙනවා. කර්මජ හා කර්මජ නොවන රූපයන් අතර මූල වෙනසක් තිබිය යුතු බවට මෙයින් ගම්‍ය වෙනවා. විවිධ කර්ම ශක්තීන්වලින් ඉපදුණු විවිධ සත්වයන්ගේ මේ කර්මජ රූපවල ආයුෂය විවිධත්වයක් තිබිය යුතුයි කියලයි බැලූ බැල්මට පෙනෙන්නේ.

ඇයි මේ කර්මජ රූපවලට විතරක් ජීවිත ඉන්ද්‍රිය කියලා දෙයක් අර්ථ දැක්වෙන්නේ. අනෙක් රූපවල පැවැත්මක් නැද්ද ඒවා සම්බන්ධව ආයුෂයක් නැත්ද?

කර්මජ හා කර්මජ නොවන රූපවල මූලික වෙනස්කමක් මෙයින් පෙන්නුම් කරනවා. බාහිර පරිසරයේ ජලය, වාතය, පාෂාණ වැනි රූප ගැන කල්පනා කරන කොට ඒවායේ නිශ්චිත වපසරියක් දක්වන්න බෑ. දැන් කර්මජ රූප සැලකුවාම අතීත කර්ම ශක්තියෙන් ඒවායේ වපසරිය යම් මට්ටමකට තීරණය වෙනවා. වපසරිය කියලා අදහස් කළේ අවකාශය පුරා පැතිර යන විශාලත්වයයි. බාහිර පරිසරයේ

රූප පද්ධති සළකා ගන්නා ආකාර අනුව ඒ ඒ සත්ත්වයා අවධානය යොමුකරන වපසරිය අනුවයි ඒවා ගැන දැනුවත් වෙන්නේ. කෙනෙක් ශාකයක සෛලයකට අවධානය යොමු කරන කොට තව කෙනෙක් සෛලය ඇතුලේ කුඩා පෙදෙසක කොළ පැහැයට අවධානය යොමු කරාවි. මෙයින් අදහස් කළේ රූපය සිතින් හදාගත්තා කියන එක නෙමෙයි. අවශ්‍යතාවය අනුව ඒ ඒ පුද්ගලයා විසින් ඒ රූපවල මායිම් සළකා ගත යුතු වෙනවා කියලයි.

නමුත් ප්‍රධාන කාරණය තමයි බාහිර පරිසර රූපවල කාලය අනුව දිශානතියක් පෙන්නුම් නොකරන බව. ඒ කථාව මෙහෙම තේරුම් ගන්න. දැන් සත්ව ශරීරයක් වයස්ගත වෙනවා පෙනෙන කොට ඒක සංකල්පයක් නොවෙයි නේ. ඇස්වල, කන්වල අනෙකුත් ඉන්ද්‍රියන්ගේ පරිපාකයක් පෙන්නුම් කරනවා. වයසක මනුස්සයකුගේ ශරීරයක් ළමා ශරීරයක් බවට පරිවර්තනය කරන්න බෑ.

හැබැයි වතුර අයිස් කරන්නත් පුළුවන්. අයිස් වලින් වතුර හදන්නත් පුළුවන්. ඒ වගේම අයිස් රත්කරලා වතුර හදතැකි. ජල වාෂ්ප ඝනීභවනය කරළත් වතුර හදන්න පුළුවන්.

මේත් එක්කම මේ කාරණාවලට සම්බන්ධව තේරුම් ගන්න පුළුවන් විශේෂ රූපයක් තියෙනවා ඒ තමයි ජරතා රූපය.

පාලියේ මෙහෙමයි එහි අර්ථදැක්වීම

**"කතමං තං රූපං, රූපස්ස ජරතා ?**

**යා රූපස්ස ජරා, ජීරණතා, ඛන්ඩිච්චං, පාලිච්චං, වලිත්තතවා, ආයුනෝසංහානි, ඉන්ද්‍රියානං පරිපාකෝ, ඉදං තං රූපං රූපස්ස ජරතා ''**





"කුමක්ද මේ රූපයාගේ (ශරීරයේ) ජරතාව ?

යම් මෙම රූපයෙහි (ශරීරයෙහි) ජරාබවක්, ජීරණය වූ බවක්, කැඩුණු බවක්, පැහුණු බවක් (කෙස් ආදිය) සම රැලි වැටීමක්, ආයුස ගෙවීයාමක්, ඉන්ද්‍රියන්ගේ පැසුණු බවක්, මෙයයි රූපයේ ජරාව. ''

මේ ජරතා රූපය ගැන කථාකරන කොට සමහරෙක් කල්පනා කරන්න පුළුවන් අර රූපවල ක්‍ෂණ භංග ගැන කල්පනා කරලා උත්පාදයත් භංගයත් අතර ජරතාව කියලා. හැම රූපයකම සෑම විටම විද්‍යමානවන දෙයක් වගේ.

නමුත් එවිට මානසික ධර්මවලට ඒවායේ ලක්ෂණයක් ලෙස නාමස්ස ජරතා කියලා චෛතසිකයක් ඇතුල් කරන්න වෙනවා. එහෙම එකක් බුදුරජාණන් වහන්සේ දක්වල නෑ. අනිත් එක මේ සත්ව ශරීර සම්බන්ධව විතරයි ජරතා රූපය ගැන ඉහත නිර්වචනය තුළ තියෙන්නේ. ශාක ගැන සඳහනක් නෑ. අද පර්යේෂණ මගින් පෙන්වල තියෙනවා ගස් වයසට යනවා වගේ පෙනුනාට ශාක සෛල විකසනයවන වේගය කාලයත් සමග අඩුවක් පෙන්නුම් කරන්නෑ කියල. විශාල ගස්වල වැඩීම නවතින්නේ සමහරවිට එතරම් උඩට ජලය ඇදීයාමේ අපහසුතා නිසා. වෙනත් භෞතික බාධක නිසා.

ගසක පලතුරක් ඉදුනාම මනුස්සයන්ට හොඳ වුනාට පණුවාට වැදගත් වෙන්නේ පලතුරු කුණු වුනාමයි. අපට ජරාව මෙන් පෙනෙන දෙය පණුවට ආරම්භයක්. නමුත් කර්මජ රූපවලට එහෙම දෘෂ්ටි කෝණය අනුව නෙමෙයි පරිපාකය පැනවෙන්නේ. තමන්ගේ ඇස දුර්වල වෙලා නම් මොන දෘෂ්ටි කෝණයෙන් බැලුවත් ඔබ වයසට ගිහිල්ලා. ඒක පුද්ගල අනුබද්ධයි. එකයි බුදු රජාණන් වහන්සේ විශේෂයෙන් ඒවාට අධ්‍යාත්මික රූප කියලා හැඳින්වූයේ.

රූප ජීවිතින්ද්‍රිය අර්ථ දක්වද්දි එහි ආයු කියලා වචනයක් තිබුණා. ජරතා රූපය අර්ථ දැක්වීමේදී එහි ආයුනො සංහානි (ආයුෂයාගේ ගෙවීයාමක්) කියලා තිබුනා. මෙයින් පේනව මේ දෙක අතර යම් සම්බන්ධයක් තියෙන බව.

ඉතින් මනුස්සයෙකුට වයස්ගත ශරීරයක් තියෙන කොට දැනෙන අපහසුව තරුණ කාලෙට වඩා අත්දකින වෙනස පෙනීම දුර්වල වෙලා, ඇසීම දුර්වල වෙලා කය වාරු නැතිවෙලා මේ වෙනස තේරුම් ගන්න බුද්ධිමත් පාඨකයාට වයස ගතවන තෙක් ඉන්න ඕනෑවන එකක් නැහැයි කියලා මම හිතනවා.

බුදුරජාණන් වහන්සේට අවශ්‍යවුනේ ජීවමාන ශරීරයක සැබෑවට දිස්වන මෙම රූප ස්වභාවය ගැන කියන්න නම් අර ජරතාව ගැන අර්ථ දක්වපු විදියෙන් ඇරෙන්න වෙන මොන වචනද පාවිච්චි කරන්න ඕනෑ ?

මේ වගේ සමහර රූප අටුවා ටීකා යුගවල අනවශ්‍ය සියුම් කරණයකට ගියා. බුදු දහමේ රූපවලට වැඩි ගෞරවයක් දෙන්න වෙන්න ඇති. ඊටපස්සේ මෑත යුගයේ ඒවාට අනුගත වෙලා සම්පාදනය වෙච්ච අභිධර්ම ග්‍රන්ථවලින් ඉදිරිපත් වුණු න්‍යායන් නිසයි ගොඩක් පටලැවිලි තියෙන්නේ. ඒවා සම්පාදනය කළේ ගුණවත් ස්වාමීන් වහන්සේලා. සියයට අනූවක් හොඳ දේවල් තියෙනකොට සියයට දහයක් වැරදි අර්ථකථනයක් තිබුණොත් ඒකත් හරි ඇති කියලයි හිතෙන්නේ.

සෛද්ධාන්තිකව විතරක් නෙමෙයි ප්‍රායෝගික පැත්තෙන් කල්පනා කරන කොටයි ගැටළු මතුවෙන්නේ. රූප අනවශ්‍ය ලෙස සියුම් කළාම ප්‍රායෝගික විපස්සනා අර්ථය නැති වෙනවා. සමහර දෙනෙක් අභිධර්ම පිටකය දිහා වපර ඇහින්





බලන්නේ ප්‍රතික්ෂේප කරන්නේ නැත්නම් පරිශීලනයෙන් බැහැර වෙන්නට මේ කාරණ බලපාලා තියෙනවා. අභිධර්ම පිටකයේ නෙවෙයි ගැටළුව සමහර පසුකාලීන අර්ථකථනයන් නිසයි ගැටළුව. මීට අමතරව සමහර කෙනෙක් තමන්ට තේරුම් ගන්න අමාරු නිසා අභිධර්මය විවේචනය කරනවා. හරියට නරියා මිදි තිත්තයි කිව්වා වාගේ.

**පැරණියි කියා හැමදේ හොඳ නොවන්නේ**
**අලුතෙන් කියූ සැම නරකම නොවන්නේ**
**සත්පුරුෂයා විමසාබලා අර්ථය භජනය කළ යුත්තේ**
**මෝඩයාගෙ බුද්ධිය අන් අය මත ගැතිවන්නේ**

මේ කීවේ මහා කවි කාලිදාසයන්. හරිම ආකාරය තියෙන්නේ කාළාම සූත්‍රයේ.

මේ ජරතා රූපය ඒ වගේම අනෙකුත් සියළු උපාදාය රූපත් සතර මහාභූත ඇසුරු කරගෙනයි හටගන්නේ. සතර මහාභූත නිශ්‍රය කරගෙනයි. උපාදාය කියලා මෙතන කිව්වේ උපාදානය එහෙම නෙමෙයි. ඇසුරු කරගෙන පාදක කරගෙන යන අර්ථයයි. පෙර පරමාර්ථ ගැන කිව්වා වගේ මේ ජරතා රූපය පැහැදිලි කරන්න සියුම් හරි කාලයක් පටලවා ගන්න අවශ්‍ය නෑ.

ශරීරයක තද ස්වභාවයෝ විද්‍යමාන නොවුයේ නම් ඊළඟට රූපවල බැඳීමක් ආපෝ ලෙසින්, පිම්බෙන ගතියත් වායෝ ලෙසින්, උණුසුමක් තේජෝ ලෙසින්, විද්‍යමාන නොවුයේ නම් ඒ මත පිහිටන ස්ත්‍රී පුරුෂ බවක් වත් ජරාවට ගිය ආකාරයක්වත් පෙන්නුම් නොකරනු ඇත. සතර මහාභූත ගත්තොත් ඒවා එකිනෙකට ප්‍රත්‍යය වෙලයි හටගත්තේ.

ඒ ඒ ආකාර වූ සතර මහාභූත පද්ධතිවල විකලත්වයෙන් ඒ මත පිහිටි උපාදාය රූපවල වෙනසක් පැනවෙනවා. ඒකයි පටිසම්භිදාවේ උදයවය ඤාණය ගැන කියනකොට විපරිණාමය වෙනස්වීම දකිනකොට වය දකිනවා කියලා තියෙන්නේ. පටිසම්භිදාවේ උදයවය ඤාණයෙ තියෙන්නෙ හේතු ඵල න්‍යායක්. එහෙම නැතුව මේ විදියට නෙමෙයි '' ඉස්සෙල්ලා සිත හෝ රූපය නැතිවුනා. අලුත් සිතක්හෝ රූපයක් හටගත්තා. ඒ සිතත් රූපත් නැතිවුනා. මෙම ක්‍රියාවලිය නුවණින් දකිනවා ''

යමෙක් රූප කලාප භංගයට යන අවස්ථාව රූපයේ ජරාව කියලා ගත්තොත්, එතකොට ඒ ජරාව සතර මහාභූතයන්ගේ උපාදාය රූපයක් නෙවෙයි. කාලයේ උපාදාය රූපයක් වෙනවා. හටගත් යමක් **වෙනස්වන බව ජරාව නෙමෙයි. එතනට වඩාත් ගැළපෙන්නෙ ''ඨිතස්ස අඤ්ඤතත්තං''** කියන කාරණයයි.

සතිපට්ඨාන සූත්‍රයේ සමුදය ධම්මානුපස්සී යන පාඨවල සමුදය කියන වචනයෙන් උදාපත්වීම විතරක් නෙමෙයි හේතු සමායෝගයෙන්, හේතූන්ගේ සහයෝගයෙන්, උපදින බවයි අඟවන්නේ.

අභිධර්මයේ පළමුවන කුසල සිත අර්ථ දක්වන වෙලාවේ ධර්මසංගණියේ සඳහන් වෙන්නේ ඒ සිත උප්පජ්ජති කියලා නෙවෙයි උප්පන්නං කියලා. අනෙක් සිත්වලටත් මෙහෙමයි. සිතක් ගැන කථාකරනකොට ඒ සිත උප්පජ්ජති කීවාට ගැටළුවක් නෑ. නමුත් යම්කිසි ප්‍රායෝගික අර්ථයක් නිසයි එහෙම උප්පන්නං කියලා යෙදුවේ. ඉපදෙමින් යනවා නැතිවෙමින් යනවා කියන එකයි, සමුදය වය කියන කාරණයෙයි අර්ථ බේදයක් තියෙනවා. මේක අනිත්‍යතාව සම්බන්ධයෙන් අතිශයින් වැදගත් කරුණක්.





යමක ප්‍රකරණයේ චිත්ත යමකයේ සිතක උපදින අවස්ථාව උප්පාදක්ඛණය කියලත් භංගයට යන අවස්ථාව භංගක්ඛණය ලෙසත් දෙයාකාරයක් දක්වනවා. එහි සඳහන් වෙනවා උපදින අවස්ථාවෙත් සිත උප්පන්නං කියලා, භංගවෙන අවස්ථාවෙත් සිත උප්පන්නං කියලා. භංගවෙන අවස්ථාව උපදින අවස්ථාව නෙවෙයි. උපදින අවස්ථාව භංගවෙන අවස්ථාව නෙවෙයි කියලත් දැක්වෙනවා.

එතකොට උප්පන්නං කියන්නේ හටගෙන ඉපදිලා විද්‍යමානවන, වර්තමානයේ ප්‍රත්‍යයෙන් හටගෙන, දැන් තියෙන, කියන අර්ථයයි. අන්න ඒ උප්පන්න භාවය තමයි නැතිවෙන්නේ. අස්ථයට යන්නේ. අනිත්‍ය සංඥාවට අරමුණ වෙන්නේ උප්පන්න භාවයයි.

හිසරදය ගැන කීව කථාවෙත් මේ හිසරදය ගැන මතක් කරනකොට එය අතීතයේ ඉපදී තිබුණු ඒ උප්පන්න බවයි අරමුණු වෙන්නේ. ඒ උප්පන්න කියන කාරණය අතීතයට දාල හිතන කොට. දැකපු දේදුන්නක් ගැන කල්පනා කරන කොට අරමුණු වෙන්නේ ඒ තිබුණු බවයි. දැන් ඒ දේදුන්න බලං ඉඳිද්දි නැතිවෙනවා දකින්න බෑ. මේ වෙද්දි කොහොමත් නැතිවෙලා නිසා.

පුංචි ප්‍රස්ථාරයක් ඇඳලා පෙන්නුවෙත් මානසික ධර්මයක් ගැන. ගනිමු ලෝභ සහගත සිතක් ගැන.



A කියන අවස්ථාවෙන්, එම ලක්‍ෂයෙන් දැක්වූයේ ලෝභයේ එක්තරා මට්ටමක්. ලෝභයේ මූලික හේතු කිහිපයක් වශයෙන් එය සමඟ හටගත් ස්පර්ශය, විඤ්ඤාණය, මෝහය දක්වලා තියෙන්නේ. A උප්පන්න මට්ටම කියලා ගත්තාම ප්‍රස්ථාරයේ අනික් ලක්‍ෂ කිසිවක් නෑ. B කියන්නේ තවත් අවස්ථාවක්. B අවස්ථාවේ එහි හේතු A මට්ටමට වඩා තරමක් වෙනස්. හැබැයි ආකාරය එකමයි. අකුසලමයි. සාමාන්‍යයෙන් හිතෙන්නේ (A),(B) දක්වා ක්‍රමයෙන් අඩුවෙනවා කියලා.

මේ ප්‍රස්ථාරය ඔබව නොමඟ යවනවා. මේ ධර්ම 4ට ප්‍රස්ථාර 4ක් ඇන්දොත්




(A) හටගත්තේ කොහොමද කියලා ඇහුවොත් ප්‍රධාන වශයෙන් අර සහජාත හේතු මුල්වෙලා කියලයි කියන්න ඕනා.





(B) හටගත්තේ කොහොමද කියලා ඇහුවත් ඒ වෙලාවේ ඊට අනුරූප තරමක් වෙනස් වෙච්ච සහජාත හේතු මුල්වෙලා. තව උපකාරක ධර්මයන් තියෙනවා. මෙතනදි කීපයක් විතරයි ගත්තේ. එහෙම නැතුව (A) ක්‍රමයෙන් අඩුවෙලා (B) හටගත්තා කීවොත්, (A) මට්ටමක් සියුම්ව සිතෙන් අල්ලගත්ත බවක්, සියුම් මඤ්ඤනාවක් එතන තියෙනවා.

මෙතන තියෙන්නෙ හේතුඵල දර්ශනය.

මෙතන කාලය කන්නයි තියෙන්නේ.

කාලය ඉවත්කරන්න තියෙන්නේ අනිත්‍ය සංඥාවෙන්.

මනුස්ස ශරීරයක් සැළකුවොත් එහි කර්මජ, සංතුජ, ආහාරජ, චිත්තජ රූප එකවිට දිස්වෙනවා. සමහර රූප හටගනමින් තියෙනවා. සමහර රූප දුර්වල වෙමින් තියෙන්න පුළුවන්. නමුත් සැවොම ඉපදුණු අවස්ථාවකයි තියෙන්නේ. **උප්පන්න භාවය සළකාගෙන මුළු ශරීරයම ඒකත්වයෙන් විදර්ශකයාට ග්‍රහණය කරන්න පුළුවන්.** මොන අවස්ථාවක් ගත්තත් (any state) ඒ අවස්ථාව අස්ථයට යනවා කියන කාරණය ප්‍රත්‍යක්‍ෂ කරන්න පුළුවන්. අර යනවා කියපු වචනය ඔස්සේ ගිහින් කාලය පටලවා ගන්න එපා. ගින්දර නිවිලා යනවා කීවාම කොහෙටද ගියේ කියලා අහන්න බැනේ. හේතුඵල සම්බන්ධය අනුව එය එතනම නැතිවුණා.

මේ විදියට ඕනෑම රූපයක් පුටුවක්, ගෙයක් අවශ්‍ය නම් මහ පොළොවම අනිත්‍ය ලෙස දකින්න පුළුවන්. කෙළෙස් හටගත්තේ යම් රූපයක් යම් ආකාරයකට පිඩු කරලාද, අරමුණු කරගෙනද, ඒ විදියටම ඒ රූප පිඩුවම එකවර අනිත්‍ය ලෙස මෙනෙහි කරගන්න පුළුවන්.

ලොකු රූපයක් සත්‍ය වශයෙන් නෑ. ඒවා සම්මුති කියලා, ඒ නිසා ඒවා අනිත්‍ය නොවෙයි කියලා දෘෂ්ටියකට ආවොත් හරිම අවාසනාවක්.

ඛණ භංග කොයි මට්ටමින් සියුම් වුනත් සමුදය වය දකින්න මේ විදියට කිසි බාධාවක් නෑ. සමුදය වය කියන්නේ යමක් යම් අවස්ථාවක හේතුන්ගෙන් විද්‍යාමාන වීමත් ඒ අදාළ හේතු නැතිවීමෙන් එය විද්‍යමාන නොවීමත්. අවස්ථාව කීවාම කෙනෙකුට හරි අර්ථය හිතට නොඑන්න පුළුවන් (state) කියන ඉංග්‍රීසි වචනය වඩාත් ගැළපෙනවා. එහෙම නැත්නම් කාලය නවතා ශරීරයේ ගත් ඡායාරූපයක් කියලා හිතාගන්න.

රූපවල විපරිණාමය වෙන්නේ පුදුම විදියකට. සාමාන්‍ය සම්ප්‍රදායට අනුව හිතෙන්නේ තියෙන රූප භංග වෙලා අලුත් රූප පරම්පරා හැදෙන කොට අපට දිස්වන රූපවල විපරිණාමය, වෙනස්කම් පෙන්නුම් කරනවා කියලා. ගසක ප්‍රාණවත්ව තිබූ කොළයක් වේලිලා දිරායන කොට වගේ.

රූප ප්‍රවෘත්ති ක්‍රමය සළකන කොට අටුවා ටීකාවල මුල් බැසගත් අදහසක් තමයි විශේෂයෙන් බාහිර පාරිසරික රූප සැළකුවාම ඨිතියට පැමිණි තේජෝ ධාතුවෙන් යාබද රූප කලාප ගොඩනගනවා කියන එක.

ඒ කිව්වේ ශුද්ධ අෂ්ටක සියුම් රූප කලාපයක් ගැන කල්පනා කරලා, එහි සතරමහා භූතයෙන් එකක් වන තේජෝ ස්වභාවයෙන් එය ඨිතියට එනම් උප්පාදක්ඛණය ඉක්ම ගියාට පස්සේ යාබදව රූප කලාප ගොඩනගනවා කියලා. මෙ කියන්නේ විශ්වයේම බහුතරයක් රූප හැදෙන හැටි.





මේක රූප සටහනකින් දැක්වුවොත්




අවකාශයේ පරිමාවක් තුළ මේ රූප ඇන්දට මේවා ගති ස්වභාව වශයෙන් හිතාගන්න එක හොඳයි. දැන් මේ කථාකරන්නේ ගස් ගල් පාෂාණවල සියුම් රූප ස්වභාවයන් ගැන.

හැබැයි පට්ඨාන නය ක්‍රමය අනුව තියෙන්නේ වෙන ක්‍රමයක්. ඒ පට්ඨානයේ තියෙන ක්‍රමය තේරුම් ගත්තොත් බාහිර පාරිසරික රූපවලට ඇයි ජීවිතින්ද්‍රියක්, ඇයි ඒවාට ආයුෂයක් කියලා පනවන්නේ නැත්තේ කියන කාරණයට යම් ඉඟියක් ලැබේවි. බාහිර පරිසරයේ රූප ගත්තහම වර්තමානයේම හටගෙන වර්තමානයේම බිඳීයන විපස්සනාවකට මග පෑදේවි.

හරි ක්‍රමය කියන්න ඉස්සර වෙලා තියෙන ක්‍රමයේ වැරැද්ද කියලා ඉන්න වෙනවා. එතකොට සම්ප්‍රදායට පහරක් වදිනවා. සම්ප්‍රදාය අල්ලාගෙන නම් ඉන්නේ තරහත් යාවි. ත්‍රිපිටකයේ බේරගන්නවාද සම්ප්‍රදාය බේරගන්නවද කියලා තමයි තෝරාගන්න තියෙන්නෙ.

පට්ඨානප්‍රකරණයේ උතුසමුට්ඨාන සතර මහාභූත රූප පිළිබඳ සැකැස්මක් නොයෙක් තැන්වල දැක්වෙනවා. ඍතුජ කියන්නේත් මේකටමයි. ගස් ගල් පාෂාණවල තියෙන රූප බාහිර සතර මහාභූත ලෙසයි පට්ඨානයේ දක්වා තියෙන්නෙ. ඍතුජ කියලා නෙමෙයි. සත්ව ශරීර වලයි උතුජ රූප. මේ වෙනස ඉදිරියේදි පැහැදිලි වේවි.

මේ ඍතුජ හෝ ඍතුජ නොවන සතර මහාභූතයන් බාහිර තේජෝ ධාතුවකින් යම් ප්‍රත්‍යයක් ලබන බව පට්ඨානයේ කිසිම තැනෙක නෑ. ඨීතියට පැමිණ තේජෝ ධාතුව රූප කලාප උපදවන්නේ නම් එම තේජෝ ධාතුව පූරේජාත ප්‍රත්‍යයෙන් අභිනව රූපකලාපයේ සතර මහාභූතයන්ට ප්‍රත්‍යය විය යුතුයි. නමුත් පූරේජාත ප්‍රත්‍යයේ ප්‍රත්‍යයොත්පන්න ලෙස කිසිවිටකත් රූප ධර්ම සඳහන් වෙන්නෙ නැහැ. පච්චනීක වාරවල (පට්ඨානයේ) උතුසමුට්ඨාන රූප පූරේජාත ප්‍රත්‍යය නොලබන ධර්ම ලෙස දක්වා තිබීමෙන් කාරණය තව දුරටත් නිශ්චිතයි.

මුල් කලාපයේ තේජෝ ධාතුව එය මගින් නිපදවන රූප කලාපයේ සතර මහාභූතවලට අවම වශයෙන් අත්ථි, නිස්සය ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය විය යුතුය. නමුත් එළෙසද දක්වා නැහැ. සෑම විටම පට්ඨානයේ එක් මහාභූතයක් ඉතිරි තුනට, දෙකක් දෙකකට ලෙසින් මහාභූත කලාපයක අභ්‍යන්තර වශයෙන් පමණක් අන්තර් සබඳතා දක්වා ඇත. තේජෝ ධාතුව යාබද රූපකලාපයක් නිපදවනුයේ නම් එක් ධාතුවක් ධාතු සතරකට ලෙස ප්‍රත්‍ය ආකාරය දැක්විය යුතුයි. රූප කලාප දෙකේ පඨවි ආදිය දෙකක් ලෙස සළකන්නේ නම් තේජෝ ධාතුව ධාතු හතකට අත්ථි ප්‍රත්‍යයෙන් උපකාර විය යුතුය. එසේද පට්ඨානයේ දක්වා නැත.





මෙලෙස රූප කලාපයක තේජෝ ධාතුව, අත්ථි අවිගත, පුරේජාත, නිස්සය, වැනි ප්‍රත්‍යයන්ගෙන් යාබද රූප කලාපයකට උපදීමට හෝ පැවැත්මට උපකාර නොකරන බව පට්ඨාන නය ක්‍රමයට අනුව පැහැදිලිය.

රූප කලාපයක ඇති ප්‍රධානම හරයක් වනුයේ පඨවි ධාතුවයි. එය උපකාර නොවි තේජෝ ධාතුවෙන් පමණක් රූප උපදී යැයි සිතා ගැනීමද අසීරුය. තේජෝ ධාතුවේ එවන් පුදුම සහගත බලයක් ඇතැයි සිතාගැනීමට අසීරුය.

මේ නිසා උතුසමුට්ඨාන යන්නෙහි අරුත නැවත විවරණය කළ යුතු බවයි පෙනෙන්නේ.

අපට නම් පෙනෙන්නේ මෙහෙම ආකෘතියක්. සරල උදාහරණයක් ගනිමු.

හාල්, මුට්ටියකට දමා ගිනි දමා රත්කිරීමෙන් බත හැදෙනවා. හාල්වල තිබුණු රූප කලාප ගින්නෙන් පැමිණි තේජෝධාතු උත්සන්න රූප කලාප සමග සම්බන්ධ වී අභිනව බත්වල ස්වභාවය ගන්නා රූප සැකැස්මක් හැදෙනවා. හාල් නැතිවිට රස්නයෙන් පමණක් බත් සෑදෙන්නේ නෑ. හාල් තිබුනද බාහිර රස්නය නැතිනම් එවිටත් බතක් නොසෑදේ. මෙයින් ගම්‍ය වනුයේ හාල්වල සතර මහාභූතත් ගින්නෙහි සතර මහාභූතත් යම් ආකාරයකට සම්බන්ධවී, එකතු වී අභිනව රූප පද්ධතියක් සෑදුණු බවයි. තේජෝ ධාතුවෙන් පමණක් රූප සකස්වේ යයි ගැනීම හාල් නැතිව ගින්නෙන් බත් හැදෙනවා කීවා වගේ.

යෝජිත ක්‍රමය අනුව උතුසමුට්ඨාන ලෙස අදහස් වන්නේ යම්කිසි සතර මහාභූත පරිසරයක, පද්ධතියක බාහිර තේජෝ අධික කලාපයකින් සිදුකරන වෙනසයි.

මෙය සහජාතව සිදුවන ක්‍රියාවක්. අභිනව පද්ධතියේ සතර මහාභූත එකිනෙකට ප්‍රත්‍යවෙමින් එකවර නැගී සිටී.

## රූප සටහන




බත් ඇටයේ සියුම් ආකාරය

සරල අදහසක් දෙන්නට ඉහත ආකාරය දක්වන ලදී. සියුම් රූප කලාප සම්බන්ධ වන ආකාරය මීට වඩා සංකීර්ණ විය හැකිය.





මේ ක්‍රමයට පුරේජාත ප්‍රත්‍යය අදාළ වන්නේ නැත. 1 හා 2 රූප කලාපවලින් 3 කලාපයට පුරේජාත හෝ අත්ථි ආදි ප්‍රත්‍යයවලින් උපකාර කළේ නැත.

එක්තරා ආකාරයකට 1 හා 2 හි එක්වීමෙන්ම 3 සැදුණු බව පෙනේ. නමුත් හාල්වල අවට පරිසරයේ රස්නයෙහි ඇතිවූ වෙනස මූලික වී බත් හටගත් නිසා බත් උතුසමුට්ඨාන රූපයක් ලෙස හැඳින්විය හැක.

ධර්මසංගණී අටුවාවේ රූප ප්‍රකීර්ණක කාණ්ඩයේ වළාකුළු සකස් වීම උතුජ රූපයකට උදාහරණ ලෙස දක්වා ඇත. අහසෙහි ජලවාෂ්ප සිසිලනයෙන් මෙය සිදුවේ.

රූප කලාප සම්බන්ධ වීම මෙන්ම විඛණ්ඩනය වීම ඔස්සේද අභිනව රූප විද්‍යමාන වීමේ ක්‍රියාවලිය පට්ඨාන නය ක්‍රමයට විරුද්ධ නැත.




විඛණ්ඩනය

මෙසේ රූප කලාප සම්බන්ධවීම අභිනව රූප කලාප උදාපත්වීමත් රූප කලාප විඛණ්ඩනය වී නව රූප කලාප උදාවීමත් තමයි ලෝකයේ බහුල වශයෙන් පේන්න තියෙන්නේ. සූර්ය රශ්මි ධාරා විවිධ සතර මහාභූත පද්ධති විනිවද යනකොට අලුත් රූප පද්ධති සැදෙනවා. සමහර රසායන ද්‍රව්‍ය එකතුකරන කොට නව සංයෝග සැදෙනවා. ඒ හැම අවස්ථාවන් උතුසමුට්ඨාන කියන්න බෑ. ඒ වගේ

නව සංයෝග සෑදෙන්න නම් තියෙන බන්ධන කැඩිලා අලුත් බන්ධන සකස් විය යුතුයි. ඒවගේ අවස්ථාවල සතර මහාභූතයෝම සම ලෙස අලුත් පද්ධතිය උත්පාදයට හවුල් බවයි පෙනෙන්නේ. ශාක වලට පෝෂක ද්‍රව්‍ය ජලය ලැබෙනකොට එක එක වෙනස්කම් සිද්ධ වෙනවා. එතනත් රූප පද්ධති සම්බන්ධ වීමයි දිස්වෙන්නේ. ශාක පත්‍රයක සූර්ය තාපයෙන් වෙන වෙනස කල්පනා කළත් එතනත් සම්බන්ධ වීමක්. සූර්යතාපය කිච්චත් පට්ඨානයට අනුව සතර මහාභූත පද්ධතියක්.

මෙලෙස උෂ්ණත්වය සමග නැගීසිටින හෙවත් උතු සමුට්ඨාන යන්නෙහි අරුත ඨිතිය පැමිණි තේජෝ ධාතුව රූප උපදවන බව නොවේ යැයි වටහා ගත යුතු.

මෙලෙසම චිත්තසමුට්ඨාන යන්නෙහි අරුත සිතෙන්ම තනිකරම රූප උපදවනවා නොව රූපයක මූලාරම්භයට යම් සිතක උපත මුල්වනවා යනුයි. යම්කිසි ශාරීරික රූප පද්ධතියක් ඇති තැනකම යම් සිතක ඉපැද්ම මුල්වී සිතක ශක්තිය උපකාර වී අභිනව රූප ආකාර බිහිවේ. එවිට එය සිත සමඟ නැගි සිටි රූප කලාපයක් ලෙස හැඳින්විය හැක. සිතෙන්ම රූප සාදනවා නම් අරූප ලෝකයේ ජනිතවන කාමාවචර සිතිවිලි වලිනුත් රූප සෑදෙනු ඇති. නමුත් එසේ නොවේ. එමනිසා සිතත් සමඟ නැගී සිටින සතර මහාභූත කලාප සඳහා පෙර පැවතුනාවූ රූප පද්ධතියක අවශ්‍යතාවය බලවත්ව පෙනේ. නමුත් පෙර පැවතුනාවූ රූපය අභිනව කලාපයේ පුරේජාත ලෙස උපකාර කළා යැයි සැළකිය නොහැක.

පෙර පැවති කලාපයම විකෘතියකට ලක්වි අලුත් චිත්තජ කලාපයක් සැකසුණු නිසයි. නමුත් මූල හේතුව වූයේ එම රූපයේ සතර මහාභූතය.





දිනක් භික්ෂුවක් රූප හටගන්නා මූලික හේතුව බුදු රජුන්ගෙන් විචාළේය. දුර ළග, හීන ප්‍රණීත, අධ්‍යාත්මික බාහිර ආදි වශයෙන් රූපස්කන්ධය අර්ථ දක්වා ඇතිවිට ඇසූ පැනයට පිළිතුරු දෙමින් තථාගතයන් වහන්සේ මෙසේ වදාළා.

**"චත්තාරෝ ඛෝ භික්ඛු මහාභූතා හේතු චත්තාරෝ මහාභූතා පච්චයෝ රූපක්ඛන්ධස්ස පඤ්ඤාපනාය"**

පුණ්ණමා සූත්‍රය- සංයුක්ත නිකාය - ස්කන්ධ වර්ගය

''මහණ සතර මහාභූත හේතුවයි සතර මහාභූත ප්‍රත්‍යයයි රූපස්කන්ධයේ පැනවීමට (හටගැනීමට) ''

පෙර සඳහන් නය ක්‍රමය, මේ දේශනාව සමග ගැළපෙන බවයි පෙනෙන්නේ.

එම භූත එකිනෙකට සහජාත, නිස්සය, අත්ථි, අවිගත ආදි ප්‍රත්‍යවලින් උපකාර කරගනිමින් නැගීසිටි. සිත විසින් කරනු ලැබුයේ තිබූ පද්ධතිය නව ආකාරයකට, විකෘතියකට පත්කිරීමය. සිත නව වෙනසකට මූලාරම්භය සැපයුවේය. එනිසා සිතත් සමග නැගී සිටි අර්ථයෙන් චිත්තසමුට්ඨාන (චිත්ත+සමග+උට්ඨාන) වඩාත් ගැළපේ. සිතෙන්ම ජනිත කළ අර්ථයෙන් චිත්තජ යන වචනය එතරම් නොගැළපේ. ආස්වාස ප්‍රාස්වාස චිත්තසමුට්ඨාන රූපයක් වූයේ කෙසේදැයි මෙවිට සරලව තේරුම් ගත හැකි වනු ඇත. නැතහොත් බාහිර පරිසරයේ වායුන් (ඔක්සිජන්, නයිට්‍රජන් ආදී) කෙසේ සිතින් ජනනය කළේ දැයි පටලැවිල්ලක් වනු ඇත.

දෙවියන්ගේ නම් පරිපූර්ණ රූප කයම ප්‍රතිසන්ධියේදී පහළවේ. මේවා කම්මසමුට්ඨාන රූපය. එම පරිසරයේ

තිබුනාවූ සතර මහාභූතද උපකාරව ඒවා එක්තරා විකෘතියකට පත්ව ඒවායේ පෙර ස්වභාවය සහමුලින්ම වෙනස්වී නව අභිනව දිව්‍යමය ශරීරය සැකසෙන බවයි පෙනෙන්නේ. මෙලෙස පරිසරයේ රූප සමග සම්බන්ධයක් ඇති නිසාම දෙවියා පමණක් නොව දිව්‍ය ලෝකයක්ද පැනවෙනවා.

පට්ඨාන නය ක්‍රමය අනුව පෙනියන තවත් වැදගත් කරුණක් රූප කලාප අතර එනම් අන්තර් කලාපීයව සම්බන්ධයක් නැති බවයි. පසුකාලිනව ඉදිරිපත් වූ ශුද්ධ අෂ්ටක රූප කලාප ආකෘතියට අනුව කුඩාම ඒකකය එය වන අතර ඒවා අතර අවකාශය පැතිර පවති.




එවිට ලී කැබැල්ලක් ගෙන දෙපසට ඇද්දොත් එය එක්වරම වෙන් නොවන්නේ මන්දැයි ගැටළුවක් පැනනගී. රූප කලාප අතර කුඩා වුවත් පැතිර ඇත්තේ අවකාශය නම් ඇද්ද සැණින් වෙන් විය යුතුය.








ඒ නිසා පද්ධති වශයෙන් රූප කලාප තේරුම් ගතයුතු බවයි පෙනෙන්නෙ. ''රූපස්ස බන්ධනත්තං'' (රූපයාගේ බන්ධනය) ලෙස අර්ථ දක්වා තිබූ ආපෝ ධාතු ස්වභාවය අංශු මාත්‍ර වශයෙන් නොව පද්ධති වශයෙන් තේරුම් ගතයුතු බවයි මෙයින් ගම්‍ය වෙන්නේ.

**දැන් කියන්න යන්නේ විඤ්ඤාණවාදය ගැනයි.**

විඤ්ඤාණවාදයට අනුව ඔය රූපගැන ප්‍රශ්න මුකුත් නෑ. රූප කලාප, ශුද්ධ අෂ්ටක ඒවායේ උත්පාදය භංගය කොහොමද දකින්නේ කියලා එන ප්‍රශ්න මුකුත් නෑ. පට්ඨානය ගැන ටිකකට කලින් තිබ්බ කථාව කියෙව්වා නම් විඤ්ඤාණවාදියෙක් කියාවි පිස්සු විකාර ඕවා වැඩක් නෑ කියලා.

මේ රූපය ඔක්කොම මායාවක් නේ. මායූපමඤ්ච විඤ්ඤාණං කියලනෙ දේශනා වෙලා තියෙන්නේ. ඒ කියන්නේ විඤ්ඤාණය මායාවක් වගේ කියලා.

හැබැයි එතනම පොඩි ගැටළුවක් තියෙනවා. රූපය මායාවක් කියලා නොවෙයි තියෙන්නේ. විඤ්ඤාණය මායාවක් වගේ කියලා. රූපය පෙණ පිඩුවකටයි උපමා කළේ. ඒ ගාථාවෙම ඊළඟ එක ගත්තොත් වේදනාව දිය බුබුළක්ද? වහා නැතිවෙන ස්වභාවය නිසයි වේදනාව දිය බුබුළක් වගේ කියලා දේශනා වුනේ.

විදර්ශනා ඥාණ තියෙන වෙලාවට, යථාභූත ඥාණය තියෙන වෙලාවට, ඒ සිතුත් මායාවක්ද? විඤ්ඤාණය මායාවක් කියලා යමෙකුට සිතෙනවා නම් ඒ සිතීමත් මායාවක්ද? නැත්නම් කුසලයක්ද?

සමහර අත්දකින දේවල් එහෙම නැත්නම් දේශනාවේ ඇසෙන දේවල් සියළු දේට අනුරූප කරන්න යද්දි පරිස්සමින්.

පටිච්චසමුප්පාද දේශනාවේ තියෙනවා ''විඤ්ඤාණ පච්චයා නාමරූපං'' කියලා. එහෙම තියෙනකොට විඤ්ඤාණ යම් තැනකද එතන නාමරූප තියෙන්න ඕනෑ කියලා ගත්තොත්. එහෙම අරගෙන ඒ නිසා අරූප ලෝකයෙත් සියුම් රූප තියෙන්න ඕනා. ඇයි පටිච්ච සමුප්පාදයේ අගට තියෙනවා (ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්දස්ස සමුදයෝ හොති) මෙලෙස සියළු දුක් රැසෙහි හටගැන්ම වෙයි කියලා.

හැබැයි ඒකේ ඊළග එක බැලුවොත් නාම රූප පච්චයා සළායතනං. නාම - රූප ඇතිවිට එතන සළායතන තියෙන්න ඕන. එවිට අරූප ලෝකේත් ඇස් කන් තියෙනවද ? අරූපයේ නෙමෙයි මේ ලෝකෙත් අන්ධයෝ බිහිරෝ ඉන්නවනේ.

දේශපාලනඥයෝ වංචා කරලා අහුවුනාම ඔක්කොම දේශපාලනඥයෝ හොරු කියන එක වැරදියි.

ඒ වගේ ධර්මනානත්වය අවස්ථා නානත්වය ධර්ම විග්‍රහයෙදි සැළකිල්ලට ගත යුතුයි.

විඤ්ඤාණය කියලා එකම නම තිබුනට කාමාවචර විඤ්ඤාණය වගේ නෙමෙයි අරූපාවචර විඤ්ඤාණය කියලා පිළිගන්න වෙනවා.

එක දවසක් ස්වාමීන් වහන්සේ නමක් කරන ධර්ම විග්‍රහයක් මම අහගෙන හිටියා. එක පාරටම ස්වාමීන් වහන්සේ කිව්වා වේදනාව කියන්නේ සංකල්පයක් කියා. මේ ස්වාමීන් වහන්සේ විදේශික ස්වාමීන් වහන්සේ නමක්. උන්වහන්සේ විඤ්ඤාණවාදයට නැඹුරු කෙනෙක්ද කියල මම දන්නේ නෑ. ඒකට නැඹුරු වෙච්ච අය ඇසුරුකරලා තිබුන බව නම් දන්නවා.





නැවතත් මතක් කරන්න වෙනවා මේ ස්වාමීන් වහන්සේලා බොහොම ගුණවත් සිල්වත් අය. ඒ අයව අවඥාවට ලක් කරල පින් කැමති ඔබ පව් පුරවා ගන්න එපා.

ඉතින් මම අහගෙන හිටියා ඇයි මේ ස්වාමීන් වහන්සේ වේදනාව සංකල්පයක් කීවේ කියලා දැනගන්න. ඒ කියමනෙන් එකපාරටම අදහස් වෙන්නේ වේදනාව සත්‍ය වශයෙන් නෑ, හුදු සංකල්පයක්. රහත් වුනාම ජීවත්වෙද්දිත් වේදනාව නිරෝධයි වගේ කාරණා. ඊළගට ස්වාමීන් වහන්සේ උද්ධෘත කළා මධුපිණ්ඩික සූත්‍රයේ තියෙන පාඨයක්.

**"ඵස්සපඤ්ඤත්තියා සති වේදනා පඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති "**

මෙය වචනයෙන් වචනයට පරිවර්තනය කළොත් මෙහෙමයි.

"ස්පර්ෂ පැනවීමක් ඇති විට වේදනා පැනවීමක් පනවන්නේ යැයි යන කරුණ වේ "

පඤ්ඤත්ති කියන වචනයෙන් අදහස් වෙන්නේ හුදු සංකල්පයක් කියලයි ඒ හිමියන් අදහස් කළේ.

මේ සූත්‍ර පාඨයේ කුමක් නිසා. " ස්පර්ශය නිසා වේදනාව හටගන්නේ යැයි " කෙළින්ම නොකියා "ස්පර්ශය යැයි පැනවීමක් ඇති විට වේදනා පැනවීමක් පනවන්නේ යන කාරණය වේ" ලෙස සඳහන් වූයේ මන්ද?

ඒක භාෂාව යොදාගන්නා ආකාරයක්.

''තණ්හාව නිසා දුක හටගනී'' කියන වැකියම ''තණ්හාව නිසා දුක හටගන්නවා යැයි සළකනු ලැබේ'' ලෙසින් කීවිට එතන සියුම් අර්ථ බේදයක් දැක්වෙනවා.

“අර සළකනු ලැබේ” යැයි කියූ අමතර කොටසින් බොහෝ පිරිසක් එවන් හැඟීමක සිටිනවා කියන අමතර අර්ථයක් ගෙන දෙනවා. සළකනු ලැබේ වෙනුවට පනවනු ලැබේ කියා තිබුණොත් තවත් අර්ථයක්. කොයි ආකාරයට වුනත් තණ්හාව නිසා දුක් හටගනි යන අර්ථය පසුව යෙදූ වචන නිසා නිශේධනය වූයේ නෑ.

මෙ පඤ්ඤත්ති කියන වචනය තේරුම් කරන්න ඉස්සෙල්ලා සාමාන්‍ය පාඨකයාට විඤ්ඤාණවාදය ගැන තේරුම් ගන්න තව කාරණයක් කියන්නම්.

මේ බුද්ධ වචනය බලන්න.

“**කායේ වා භික්ඛවේ සති, කායසඤ්චේතනා හේතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං** ’’

අංගුත්තර නිකාය - චතුක්ක නිපාතය - චේතනා සූත්‍රය.

විඤ්ඤාණවාදයට නැඹුරුයි කියා සැළකෙන ස්වාමින් වහන්සේ නමක් මේ සූත්‍ර පාඨය අර්ථ ගන්වන්නේ මෙහෙමයි.

“මහණෙනි කය ඇතැයි සිතාගත් විට, කය අනුව ගිය චේතනා හේතුවෙන් සුව දුක් උපදි”

නමුත් පාලි පාඨයේ තියෙන්නේ පැහැදිලිවම ‘‘කයක් ඇතිවිට කියලා’’. ‘‘කයක් ඇතැයි සිතාගත් විට’’ කියලා නෙමෙයි. ඊට අනුරූප පාලි වචනයක් තිබුණේ නෑ.

ඒ වචනයෙන් ධර්ම විග්‍රහය සම්පූර්ණයෙන්ම වෙනස් වෙනවා.

දැන් බලමු පඤ්ඤත්ති ගැන.





අභිධර්මයේ මෑත කාලීන පොත් කියවපු පාඨකයෝ දන්නවා ඇති විද්‍යමාන, විද්‍යමාන නොවන දෑ විස්තර කරන්න ඒපොත්වල යොදන වචන දෙකක් තියෙනව.

පරමාර්ථ හා පඤ්ඤත්ති කියලා.

පඤ්ඤත්ති කියන එකට සම්මුති කියලා ඒ පොත්වල අර්ථ දෙනවා.

‘‘**පරමාර්ථ කියන්නේ සැබෑවට විද්‍යාමාන වන දෑ**

**පඤ්ඤත්ති කියන්නේ සැබෑවට විද්‍යාමාන නොවන දෑ**’’ කියලා අර්ථ දෙනවා.

පඤ්ඤත්ති කියන පාලි වචනය ත්‍රිපිටකයේ විවිධ අර්ථ වලින් දක්වලා තියෙනවා. පරමාර්ථ වචනය වැඩිය නැති වුනාට පඤ්ඤත්ති වචනය ත්‍රිපිටකයේ නිතර යෙදෙනවා.

‘‘**සේනාසනං පඤ්ඤත්තං**’’ කීවාම සෙනසුන් පනවල කියන අදහසයි. ආගන්තුක සංඝයා වෙනුවෙන් සේනාසනය සකස් කරළා කියන එකයි.

“**පුබ්බා කෝටි න පඤ්ඤායති**” කීවාම සංසාරෙ මුලක් නොපැනවේ කියන අදහසයි. දක්නට නොලැබෙයි කියන එකයි. සසර මුලක් නැති නිසා.

‘‘**දානං, භික්ඛවේ පණ්ඩිත පඤ්ඤත්තං** ” කීවාම මහණෙනි දානය පණ්ඩිතයන් විසින් පනවන ලද්දක්.

මෙයින් අදහස් කළේ දානය කියන වචනයට පණ්ඩිතයන් නිර්වචනයක් දුන්නා නෙවෙයි. දානය කියලා සිද්ධ වන ක්‍රියාවලිය හොඳ දෙයක් කියලා පණ්ඩිතයන් නිගමනය කරළා එය ලෝකයාට පැවසුවා කියන එකයි.

**'' පුබ්බේ ච අහං ඒතරහි ච දුක්ඛඤ්චේ ව පඤ්ඤාපේමි දුක්ඛ නිරෝධඤ්ච"**

"මම පෙරත් අදත්, දුකත් දුකෙහි නිරෝධයක්ම පනවන්නේ යැයි" කියලයි එතැන බුදුන් වහන්සේ කීවේ.

තමන් වහන්සේ අවබෝධ කොට ප්‍රකාශ කරනවා. විවරණය කරනවා කියන අදහස එතන තියෙනවා. සමාජයක් ඉදිරියේ දක්වනවා කියලත් කියන්න පුළුවන්

අභිධර්ම පිටකයේ නම් ධර්මසංගිණියේ

අංක 1315 ඡේද අංකය යටතේ ''කතමේ ධම්මා පඤ්ඤත්ති'' කියලා මොනවද පඤ්ඤත්ති කියන්නේ කියලා පැහැදිලිව දක්වල තියෙනව.

නම්කිරීම්, නිර්වචනයන්, ව්‍යවහාරයන්, සළකාගැනීම් වගේ අර්ථ දීලා තියෙනවා.

**''ඒතස්සපි බෝ, භික්ඛවේ වේභාරස්ස පබ්බතස්ස අඤ්ඤව සමඤ්ඤා අහෝසි අඤ්ඤා පඤ්ඤත්ති. ''**

ඉසිගිලි සූත්‍රය - මජ්ඣිම නිකාය

**'' මහණෙනි අර වේභාර පර්වතයට එකල වෙන අයුරකින් හැඳින්වූයේ. වෙනපැනවීමක් තිබුනේ. ''**

මෙතන පඤ්ඤත්ති වචනයෙන් ව්‍යවහාර කළා, හැඳින්වූවා, කියන අර්ථය ගෙන දෙනවා.

සත්‍ය දේත් වචනවලින් පනවනවා අසත්‍යදේත් වචනවලින් ප්‍රකාශ කරනවා. අර දුක්ඛඤ්චේව පඤ්ඤාපෙමි කියන කොට සත්‍යයක් ගැනයි.





සූත්‍රවල සමහර තැනක හමුවෙනවා අන්‍ය තීර්ථකයන් පනවන දේවල් ගැන, ඒවා ගැන භාග්‍යවතුන් වහන්සේ සඳහන් කරනවා ''ඔවුන් පනවන්නේ අසත්‍යයක්''කියලා.

කොයි අතට බැලුවත් පඤ්ඤත්ති කියන පදයේ තනිව ගත් විට හුදු සංකල්පයක් හෝ අසත්‍යයක් කියන අර්ථයක් නෑ. මේ වචනයෙන් අසත්‍ය දෙය එහෙම නැත්නම් සත්‍යවශයෙන් නැති නමුත් තියෙනවා වගේ පෙනෙන දේවල් ගැන කියවෙනවා කියලා අර්ථයක් දුන්නේ අටුවා ටීකා වල. විශේෂයෙන් ටීකා යුගයේදි.

මෙතන පුදුමයට කාරණය තමයි මේ විඤ්ඤාණවාදින් අර අටුවා ටීකා සම්ප්‍රදායේ ආපු පඤ්ඤත්ති කථාව ණයට ගත්ත එක. මොකද විඤ්ඤාණවාදයට බරවෙච්ච උදවිය අටුවා ටීකා ගණන් ගන්න අය නෙවෙයි. එළිපිට නොකීවත් හදවතින් ප්‍රතික්ෂේප කරනවා. ඒ අය සූත්‍ර පිටකය තමයි වැඩි බර දෙන්නේ. සාපේක්ෂව ගත්තම එයිනුත් ශ්‍රාවක භාසිත තමයි දේශනාවලදි උද්ධෘත කරන්නේ.

මේ පරමාර්ථ පඤ්ඤත්ති කියන වචන දෙක තරම් අද කාලෙ අවභාවිතා වන වෙන වචන දෙකක් නෑ. හරියටම කිව්වොත් අධිභාවිතා වෙනවා කියලයි කියන්න වෙන්නේ.

අටුවා ටීකාවල පඤ්ඤත්ති කියන වචනය නාමපඤ්ඤත්ති කියලා, හරි අර්ථයෙනුත් යොදනවා. නමුත් ප්‍රසිද්ධ අනෙක් අර්ථය. සිංහලෙන් සම්මුති කීවාම සමහර අය අදහස් කරනවා කිසි අර්ථයක් නැති හුදු වචන මාත්‍රයක් කියලා. ජන සමාජයේ පොදුවේ එකගත්වයක් ඇතිවෙච්ච ව්‍යවහාරයක් කියලා සමහරෙකුට වැටහෙනවා නම් ගැටළුවක් නෑ.

පඤ්ඤත්ති කියන වචනය සැබෑවට නැති දෑ සඳහා අටුවා ටීකාවල යොදන්න ගත්ත හැටි දැනගත්තොත් පාඨකයින් මවිතයට පත්වේවි.

අභිධර්මයේ තියෙන කෘති හතෙන් එකක් තමයි පුග්ගලපඤ්ඤත්තිප්‍රකරණය. මේ කෘතියේ නමේ තියෙන පඤ්ඤත්ති කියන වචනයට අර්ථ කථනයක් දෙන අතරෙ අටුවාවේ සඳහන් වෙනවා එහි ප්‍රභේද දෙකක්.

අටුවාචාරීන් වහන්සේ අදහස් කළා ගස් ගල් යාන වාහන ගෙවල් ආදියත්, දෙවියා මිනිසා ආදි ලෙසින්වන සත්වයොත්, සත්‍ය වශයෙන් නැත කියා. එම සත්‍ය වශයෙන් නැතයි කියා අදහස් කළ දේවල් ගැන සමාජයේ කථාවෙද්දි ඒ ඒ ජන සමාජවල මිනිස්සු යොදන පනවන යම් නාමකරණයක් වේද ඒකට කීවා අවිද්‍යමාන පඤ්ඤත්ති කියලා.

රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ වගේ සත්‍යවශයෙන් විද්‍යමානවන ධර්මයන් හැඳින්වීමට යොදන යම් නාමකරණයක්වේද එය විද්‍යමාන පඤ්ඤත්ති කියලා අර්ථ කථනය කළා. කුසල අකුසල වගේ වචන මේවා විද්‍යමාන පඤ්ඤත්ති කියලයි හැඳින්වූයේ. එතකොට විද්‍යමාන දේට කළ නාමකරණය විද්‍යමාන පැනවීම්. විද්‍යමාන පඤ්ඤත්ති.

මෙතන රූප කියලා ගත්තේ සියුම් රූප විය යුතුයි. ගෙවල් දොරවල් නැතෙයි කියලා අදහස් කළ නිසා.

සමාජයේ දක්නට ලැබෙන නාමකරණය පිළිබඳ නාමකරණයක් තමයි මේ සිද්ධ කළේ.

ගෙවල් දොරවල් නැතෙයි කීම එක කාරණයක්. ගෙවල් දොරවල් කියන වචන යොදලා කරන කථාව තව කාරණයක්.

පසුකාලීන විශේෂයෙන් ටීකා යුගයේදි ගෙවල් දොරවල්වලට කෙළින්ම අවිද්‍යමාන පඤ්ඤත්ති කියලා





යොදන්න ගත්ත බවක් පේනවා. පසුව අවිද්‍යමාන කියන කොටස ලොප්වෙලා කෙලින්ම පඤ්ඤත්ති කියලා යෙදුණා.

මේ කථාව සරලව කීවොත් මෙහෙමයි.

දැන් හරකා කියන වචනය ගත්තොත් මේ වචනය ගැන අපට මෙහෙම අර්ථකථනය කරන්න පුළුවන්. මේක සතෙකුට යොදන වචනයක්, සිංහල භාෂාවේ වචනයක්, නාම පදයක් ආදි වශයෙන්. ඒ හරක් ගොවිපළක මිනිහෙක් හරකා ගාල් කළා කියලා කාටහරි කියන්න ඕනෑ වුනාම නාම පදය ගාල් කරා, සිංහල භාෂාවේ වචනය ගාල්කරා කියලා කියන්නේ නැනේ.

ඒ වගේ පටලැවිල්ලක් මෙතන වුනේ.

ඒ විදියට බැලුවොත් පරමාර්ථවලටත් පඤ්ඤත්ති කියලා කියන්න වෙනවා. ඇයි පරමාර්ථවල නාමකරණයට කීවේ විද්‍යාමාන පඤ්ඤත්ති කියලනේ. අද කාලේ පරමාර්ථයට විරුද්ධ අර්ථය දෙන වචනයක් ලෙසින් පඤ්ඤත්ති සම්මුති කියන පදය ආවේ මෙහෙමයි.

පැනවීම් යොදාගෙන සත්‍යදේ ගැනත් කියනවා. හරියට බුදු රජාණන් වහන්සේ දුක්ඛ සත්‍යය පැනෙව්වා වාගේ. අසත්‍ය දේත් පනවනවා අන්‍ය තීර්ථකයෝ ලෝකේ මැව්ව මහා බ්‍රහ්මයා ගැන කියනවා වාගේ.

පැනවීම් කියන්නේ භාෂා ව්‍යවහාර. එකට සත්‍යය අසත්‍ය බේදයක් නෑ.

කුසලය අකුසලයට ප්‍රතිපක්ෂ වගේ පරමාර්ථය පඤ්ඤත්තියට ප්‍රතිපක්ෂ නෑ.

මේ පඤ්ඤත්ති කියන වචන අවිද්‍යමාන දෑ සඳහා යොදන එක වැරදියි කියලා අභිධර්මයට මූලටීකා ලියූ ආනන්ද තෙරුන්වහන්සේ ධම්මසංගණි මූලටීකාවේ පිටුගණනක විස්තරයක් කරලා තියෙනවා. එහෙම අර්ථයක් දුන්නොත් ලොකු අවුලක් වෙනවා කියලා උන්වහන්සේ තේරුම් ගත්ත බවක් පෙනෙනවා. නමුත් ඒ අදහස සමප්‍රදායේ එතරම් සැළකිල්ලට ගත් බවක් පේන්න නැහැ.

ඉතින් මෙහෙම කොපිකරන්න ගිහිල්ලා විඤ්ඤාණවාදයේදි පැටලීමක් වුනා. සාමාන්‍යයෙන් අභිධර්ම පිටකය විඤ්ඤාණවාදින් රුචි කරන්නෑ. බුද්ධ කාලයෙන් ශතවර්ෂ කිහිපයකට පසු විශේෂයෙන් මහායානිකයන් අතර විඤ්ඤාණවාදී අදහස් බහුලයි. විඤ්ඤාණවාදින් හැමෝම එකවිදිය නෙමෙයි. ප්‍රධාන ආකාර කීපයක් මෙහෙමයි.

1- රූපය යනු සිතින් මවාගත් දෙයකි. සත්‍යවශයෙන් නැත .
2- සත්‍ය අවබෝධය ලැබුවිට රූප අහෝසිවේ.
3- ඇස කන ආදි රූප සිත සමග පහළවී සිත සමඟ බිඳී යයි
4- මව, පියා, බුදුහිමියන් හඳුනාගන්න බව, පරිකල්පනයක් පමණය. එහි මෝහයක් පවතී.

මේසයක් පුටුවක් කෝප්පයක් වැනි බාහිර පරිසරයේ වස්තුවක් පෙන්වා ඒවා සිත තුළ තිබෙන බව විඤ්ඤාණවාදීන් කියයි. එසේත් නැත්නම් සිතේ පරිකල්පනයක් පමණක් බව අසන්නට ලැබේ. සතර මහාභූත යනු සංකල්පයක් යැයි සමහරවිට අහන්නට ලැබේ. සිහිනයකදි දකින දේවල් සැබෑවට නැතුවාක් මෙන් සාමාන්‍ය ජීවිතයේ අත්දකින දේද බොරුවක් හෝ මුළාවක් ලෙසත් පවසති. දැනෙන සියළු දේ





බොරුවක් යැයි විටෙක පවසත්. ඔවුනට අනුව වයස්ගතවීම මරණය සිතේ පරිකල්පනයන්ය.

බුදුරජාණන් වහන්සේ ස්කන්ධ සතරක් නොව ස්කන්ධ පහක් අර්ථ දැක්වූ සේක. රූපස්කන්ධය ගැන නොයෙක් වචන යොදා එය ප්‍රභේද කොට නන් අයුරින් ත්‍රිපිටකය තුළ දේශනාවේ. සාමාන්‍යයෙන් අසත්‍ය දෙයක් බොහෝ කොට විස්තර කිරීමෙන් වැඩක් නැත. බොහෝ කොට ප්‍රභේද කිරීමෙන් වැඩක් නැත. සර්ව බලධාරි දෙවි කෙනෙක් නැතැයි දේශනා කළාට පසු ඒ දෙවියාගේ ශරිර ලක්ෂණ ඒ දිව්‍ය ලෝකේ විස්තර කීමෙන් තේරුමක් නැත.

සත්‍ය වශයෙන් රූපයක් විද්‍යමාන නොවන්නේ නම් එහි හටගැනීම නැතිවීමක් ද නොපැනවේ. රූප ගැන සිතු සිතිවිලිවල පමණක් හටගැනීමක් නැතිවීමක් පැනවේ. හඳේ හාවෙක් නැතැයි කීවාට පසු හාවාගේ උපතක්, මරණයක් ගැන පනවන්නට දෙයක් නැත. රූපය සැබෑවට නැත්නම් රූපය දුකක් ද නොවේ. දුකෙහි හටගැනීම රූප සංකල්පනාවල හටගැනීම පමණක් වේ.

බාහිර පරිසරයේ යම් වස්තූන් ගැන වඩාහොඳින් අවධානය යොමු කරන විට ඒවා ගැන වඩාත් දැනුවත් බවක් ඇතිවේ. එය හොඳින් ස්පර්ශ වනවිටද දැනුවත් බව ප්‍රබල වේ. මෙතනදි මතුවන්නේ මානසික ධර්ම එකිනෙක අතර අන්තර් සම්බන්ධයයි. මෙවන් අවස්ථා නුනුවණින් ගත්තොත් අරමුණු වූ රූපය විඤ්ඤාණය නිසා ගොඩනැගුනාක් මෙන් පෙනේ. ඇත්තෙන්ම කිවයුතුවන්නේ රූපාරම්මණය නිසා විඤ්ඤාණය හටගත් බවක් මිස ඒ විඤ්ඤාණය නිසා ඒ අරමුණු වූ රූපය පවතින බවක් නොවේ.

බුදුහිමියන් දේශනා කළේ ඇසත් රූපත් නිසා චක්ඛුවිඤ්ඤාණය හටගන්නා බවය. ඇසත් චක්ඛු විඤ්ඤාණයත් නිසා රූප හටගන්නා බවක් දේශනා කළේ නැත.

සාමාන්‍ය කෙනෙකුගෙත් අන්ධ පුද්ගලයෙකුගෙත් වෙනස කුමක්ද? ඇස කන ආදි නොයෙකුත් රූප සිතේ මැවීමක් නම් ඤානදර්ශනය පහළ වූ විට රූප අහෝසි වෙත් නම් රහත් වූ විට ඇස් පෙනීම නැතිවනු ඇත. මෙසේ ඇතිවිට අන්ධ පුද්ගලයා ඇස් පෙනීම ලබාගැනීමට කළයුතු වන්නේ අවිද්‍යාව වැඩිකරගැනීමයි.

පෙර විඤ්ඤාණවාදය ගැන පහදා දීමට උද්ධෘත කළ සූත්‍රයේ "කායේ වා භික්ඛවේ සති" යන්න ''මහණෙනි කය ඇතැයි සිතාගත්විට'' ලෙස පරිවර්තනය කිරීමට තුඩුදුන් කරුණක් ඒ සූත්‍රයේම පසුව තිබේ.

**"අවිජ්යාත්වේව අසේස විරාග නිරෝධො සෝ කායේ න හෝති......."**

අවිද්‍යාවේ අනවශේෂ ප්‍රහණයෙන් එම කය නොවෙත්....

ඒ නිසා අවිද්‍යාව ඇතිවිටයි කය ඇති සේ සිතෙන්නේ යැයි ආපස්සට කල්පනා කළ හැක.

නිවනේ ආකාර දෙකක් තිබේ. සඋපදිශේෂ හා අනුපාදිශේෂ නිබ්බාන ධාතුවයි.

එක්කෝ බුදුන් වහන්සේ ඉහත පාඨයෙන් අදහස් කළේ අනුපාදිශේෂ නිවන් ධාතුවයි. එසේ නැත්නම් අර දෘෂ්ටි ගත පුද්ගලයා සිතන ආකාරයේ කයක් නැති බවයි. නිත්‍ය සුඛ කයක් නැති බවයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම වූ කයක් ඇති බවයි.





සංයුක්ත නිකායෙ ස්කන්ධ වර්ගයෙ පුප්ඵ සූත්‍රයෙන් මේ ගැන හොඳ අදහසක් ගන්න පුළුවන්.

දිනක් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවරදී භික්ෂූන් අමතා මෙහෙම ප්‍රකාශ කලා.

"මහණෙනි මම ලෝකයා සමග විවාද නොකරමි. ලෝකයාම මා සමග විවාද කරයි. මහණෙනි ධර්මවාදි තෙම ලෝකයේ කිසිවකු සමග විවාද නොකරයි. යමක් මහණෙනි ලෝකයේ පණ්ඩිතයන් විසින් නැතයයි සම්මතද, මමත් එය නැතයයි කියමි. යමක් මහණෙනි ලෝකයේ පණ්ඩිතයන් විසින් ඇතයයි සම්මතද මමත් එය ඇත යයි කියමි.

කුමක්ද මහණෙනි ලෝකයේ පණ්ඩිතයන් විසින් නැතයයි සම්මත මමත් නැත යයි කියන්නේ? නිත්‍ය ස්ථිරසාර සාස්වත වෙනස් නොවන රූපයක් මහණෙනි පණ්ඩිතයන් විසින් නැත යයි සම්මතයි, මමත් එය නැත යයි කියමි. නිත්‍ය ස්ථිරසාර සාස්වත වෙනස් නොවන වේදනාවක් --- සංඥාවක් ---- සංස්කාරයක් --- නිත්‍ය ස්ථිරසාර සාස්වත වෙනස් නොවන විඤ්ඤාණයක් මහණෙනි පණ්ඩිතයන් විසින් නැත යයි සම්මතයි මමත් එය නැතැයයි කියමි.

කුමක්ද මහණෙනි ලෝකේ පණ්ඩිතයන් විසින් ඇතයයි සළකන මමත් ඇත යයි කියන්නේ? අනිත්‍ය වූ දුක්වූ වෙනස්වන රූපයක් ලෝකයේ පණ්ඩිතයන් විසින් ඇත යයි සම්මතයි, මමත් එය ඇත යයි කියමි. අනිත්‍ය වූ දුක්වූ වෙනස්වන වේදනාවක් -- සංඥාවක් -- සංස්කාරයක් --- අනිත්‍ය වූ දුක්වූ වෙනස්වන ධර්මතාවයෙන් යුත් විඤ්ඤාණයක් ලෝකයේ පණ්ඩිතයන් විසින් ඇතයයි සම්මතයි. මමත් එය ඇතයයි කියමි "

මහණෙනි, මෙයයි ලෝකේ පණ්ඩිතයන් විසින් ඇතයයි සළකන මමත් ඇත යයි කියූ දෙය.

මහණෙනි, ලොව, ලෝකයට අයත් ධර්ම ඇත. එය තථාගතයන් වහන්සේ අවබෝධ කරයි. මනාව දැනගනියි. අවබෝධ කොට මනාව දැන, කියයි ,දේශනා කරයි, පනවයි, පිහිටුවයි, විවරණය කරයි, බෙදා දක්වයි, මතුකර පෙන්වයි.

කුමක්ද මහණෙනි, තථාගතයන් වහන්සේ අවබෝධ කරන මනාව දැනගන්නා, අවබෝධ කොට මනාව දැන, කියන, දේශනා කරන, පනවන, පිහිටුවන, විවරණය කරන, බෙදා දක්වන, මතුකර පෙන්වන ලොව ලෝකයට අයත් ධර්මය ?

රූපය මහණෙනි, ලොව, ලෝකයට අයත් ධර්මයක්. එය තථගතයන් වහන්සේ අවබෝධ කරයි. මනාව දැනගනියි. අවබෝධ කොට මනාව දැන, කියයි ,දේශනා කරයි, පනවයි, පිහිටුවයි, විවරණය කරයි, බෙදා දක්වයි, මතුකර පෙන්වයි.

යමෙක් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් කියන කල්හි, දේශනා කරන කල්හි, පනවන කල්හි, පිහිටුවන කල්හි, විවරණය කරන කල්හි, බෙදා දක්වන කල්හි, මතුකර පෙන්වන කල්හි දැන නොගනී නම් නොදකී නම් මහණෙනි, අන්ධ වූ ඇස් නැති නොදන්නා නොදක්නා බාල එම පෘථග්ජනයා ගැන මම කුමක් කරන්නද.

වේදනාව මහණෙනි, ලොව ලෝකයට අයත් ධර්මයක්.- -පෙ---සංඥාව---පෙ---සංස්කාර---පෙ--විඤ්ඤාණය මහණෙනි, ලොව ලෝකයට අයත් ධර්මයක්. එය තථාගතයන් වහන්සේ අවබෝධ කරයි. මනාව දැනගනියි. අවබෝධ කොට මනාව දැන, කියයි ,දේශනා කරයි, පනවයි, පිහිටුවයි, විවරණය කරයි, බෙදා දක්වයි, මතුකර පෙන්වයි.





යමෙක් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් කියන කල්හි ,දේශනා කරන කල්හි, පනවන කල්හි, පිහිටුවන කල්හි, විවරණය කරන කල්හි, බෙදා දක්වන කල්හි, මතුකර පෙන්වන කල්හි දැන නොගනී නම් නොදකී නම් මහණෙනි, අන්ධ වූ ඇස් නැති නොදන්නා නොදක්නා බාල පෘථග්ජනයා ගැන මම කුමක් කරන්නද.

මහණෙනි, දියෙහි හටගත් දියෙහි වැඩුනු උපුල් මලක් හෝ පියුමක් හෝ හෙළපියුමක් හෝ දියෙන් නැගී දියෙහි නොගැටී යම් සේ සිටුනේද, මහණෙනි, එළෙසින් තථාගත තෙම ලොව උපන්නේ ලොවෙහි වැඩුනේ ලෝකය අබිබවා ලෝකයා හා නොගැලී වාසය කරයි.”

-----------------------------------------------------------

විඤ්ඤාණවාදයට බැසගත්තොත් මේ නිසා බොහෝ විට ශරීරය අමතක වනු ඇත. කායානුපස්සනාව මග හැරී යනු ඇත. වයස්ගත සිරුරක ස්වභාවය තරුණ කාලයට වඩා වෙනස් බව නොතේරෙයි. අනාගතයේ ඇති සැබෑ අවධානම මගහැරිය හැක.

**ඇස කන ආදි රූප සිත සමග පහළ වී සිත සමග බිඳී යයිද?**

ඇස, කන මෙන් නොවේ. කන, දිව මෙන් නොවේ. මිනිසෙකුගේ ඇස තිරිසනෙකුගේ ඇස මෙන් නොවේ. සමහර තිරිසනුන්ට අවට පෙනෙනුයේ කළු සුදු ලෙසය. මිනිසෙකුට මෙන් එක බැල්මෙන්ම අවට වස්තූන්, ඒවා අතර පරතරයන් වස්තූන්ගේ විවිධත්වය තිරිසනාට නොදැනේ. ඇසේ විවිධත්වය මේ සදහා බලපෑවේය. විවිධ වර්ණ පරාසයන් සිතට ග්‍රහණය කරදීමේ හැකියාව ඇසමත

තීරණය වේ. මේ කීවේ චක්ඛුවිඤ්ඤාණය ඇසමත රඳා පවතින බවයි.

නමුත් චක්ඛුවිඤ්ඤාණයේ වෙනස්කම් නිසා ඇසේ වෙනස්කම් හටනොගනී.

ලේ මස්වල උපකාරයෙනුත් ඇසේ පැවැත්මට සුදුසු ප්‍රශස්ත උණුසුමකුත් පීඩනයකුත් කරන කොටය ඇස පවතිනුයේ. හටගනුයේ. පෙර කරන ලද කර්මයද ඇසේ හටගැනීමට දායක වේ. කෙටියෙන් කීවොත් සතර මහාභූතත් කර්ම ශක්තියත් නිසාය ඇස හටගනුයේ.

ඇස පෙර කරනලද කර්මය හා සම්බන්ධ බවට භාග්‍යවතුන් වහන්සේ මෙසේ පැවසූහ.

**"කතඤ්ච, භික්ඛවේ, පුරාණ කම්මං, චක්ඛුං භික්ඛවේ පුරාණ කම්මං අභිසඞකතං අභිසඤ්චේතයිතං..."**

''කුමක්ද මහණෙනි පෙර කර්මය? ඇස මහණෙනි පෙර කර්මයක් (පෙර කර්මයෙන් සකස් වූවක්) ''

ඇස පිළිබඳ අප දැනුවත් වීමට චක්ඛුවිඤ්ඤාණය එක්තරා අයුරකින් ඉවහල් වේ. උදෑසන අවදිවන විට අවට වස්තූන් බොඳවී පෙනුනොත් හෝ වයස්ගතවන විට අවට නොපෙනීයන විට තම අවධානය යොමු වන්නේ ඇස කෙරෙහිය. පරිසරයේ වස්තූන්හි දෝෂයක් නොව ඇසෙහි ප්‍රශ්නයක් ඇතිබව වැටහී යයි. මෙවිට අරමුණු වූයේ ඇසයි. බිය වූයේ ඇස ගැනයි. මේ දැනුවත් වීම වූයේ මනෝවිඤ්ඤාණ අවස්ථාවේදිය. ඇසේ ස්වභාවය ගැන දැනුවත් වූයේ ඇස පාදකව හටගත්තාවූ දැනුවත්කම් සැසඳීමෙනි. චක්ඛුවිඤ්ඤාණ සැසඳීමෙනි.





ඇස ගැන දැනුවත්වීමට උපකාරිවූ සාධක ඇස සකස් වීමට හේතුවූ ඍජු සාධක නොවේ. මෙම වෙනස වටහා නොගැනීම නිසා සමහරෙක් චක්ඛුවිඤ්ඤාණය සමඟම ඇස හටගනී, යන මතයකට ආයේය. ඇසේ අනිත්‍යතාවය පැහැදිලි කිරීමේ පහසු ක්‍රමයක් ලෙසද මෙම සාවද්‍ය මතය භාවිතා වේ. එනම් පෙනීම පවතින විට ඇස පැනවෙන බවක් පෙනීම නැතිවී යන විට ඇස නැතිවන බවත්ය.

මෙලෙසට කන, නාසය, දිව, කය, මන යන අනෙකුත් ආයතනයන්ගේ අනිත්‍යතාවය සාවද්‍ය ක්‍රමයක් ඔස්සේ පැහැදිලි කෙරෙන බව පෙනෙන්නට තිබේ. මෙලෙස විඤ්ඤාණය සමගම සියළු රූප හටගන්නා බවත් එය සමගම බිඳී යන බවටත් මතයක් ගොඩනැගිණි. සියලු ධර්මයෝ එක් සිතක් පවතින කාලයක් පමණක් පවතින බවට සදොස් මතයක් ගොඩ නැගුණි. මෙවන් මිථ්‍යා මතයක් තුන්වන ධර්ම සංගායනාවට පෙරාතුවත් තිබූ බව කථාවත්ථුප්‍රකරණයේ එන ඛණික කථාවෙන් පෙනේ.

"ඒක චිත්තක්ඛණිකා සබ්බේ ධම්මාති ? ආමන්තා. චිත්තේ මහා පඨවි සණ්ඨාති, මහා සමුද්දො සණ්ඨාති..."

එහිදි මොග්ගලිපුත්තතිස්ස තෙරුන්වහන්සේ සියලු ධර්මයෝ එක් චිත්තක්ෂණයක් පමණක් පවත්නේදැයි ප්‍රශ්න කොට එසේ වන්නේ නම් මහපොළොව මහා සමුද්‍රය ආදි රූපමය දේවල් සිතේ පිහිටා ඇත්දැයි ප්‍රශ්න කරයි.

පරවාදීන්ගේ අදහස වූයේ සිතට අරමුණු වන දේ සිත සමග බිඳී යායුතු බවයි. සිතත් සමග බිඳී යාමට නම් සිත සමග සම්ප්‍රයුක්ත විය යුතු නොවේදැයි ඒත්තු ගැන්වීමට එසේ ප්‍රශ්න කළේය.

නැවතත් උන්වහන්සේ මෙසේ ප්‍රශ්න කරයි.

ඇස නැමති ආයතනය චක්ඛු විඤ්ඤාණ සමග එක්ව හටගනී ද?

එසේය (පරවාදි පක්‍ෂය)

ඉන්පසු තෙරුණ් වහන්සේ මැදුම්සඟියෙ එන සැරියුත් හිමියන් වදාළ කරුණක් උපුටා දක්වමින් කාරණය වඩාත් පැහැදිලි කරදෙයි.

සැරියුත් හිමියන් මෙසේ කියා තිබෙනවා නේද?

"ඇවැත්නි, අධ්‍යාත්මික ඇස බිඳී නැතිවිට, බාහිර රූපය අභිමුඛයට නොපැමිණෙත්ද අදාළ වූ මනසිකාරයක් නොවෙත්ද, ඒතාක් අනුරූප වූ විඤ්ඤාණයේ පහළ වීම නොවේ. . . . . . . . ඇවැත්නි. අධ්‍යාත්මික ඇසද බිඳී නැති විට, බාහිර රූපත් අභිමුඛයට පැමිණෙත්ද, අදාළ වූ මනසිකාරයන් වේද, එලෙසින් අනුරූප වූ විඤ්ඤාණයේ පහළ වීම වෙති."

මෙලෙස සූත්‍රයක් ඇත්තේ නොවේද? "එසේනම් ඇස, චක්ඛුවිඤ්ඤාණය සමඟ එක්ව හටගනී යයි" නොකිව යුතුමය.

චක්ඛුවිඤ්ඤාණය නැතිවිට ඇස පැවතුණු බව ඉහත සූත්‍ර පාඨයෙන් පැහැදිලිය. අභිධර්මයට අනුව නම් මෙහි කිවයුත්තක් නැත. ඇස කන ආදි පංච ඉන්ද්‍රියන් පෙර ජාතව පසුව ජනිත වන චක්ඛුවිඤ්ඤාණයට සෝතවිඤ්ඤාණය ආදියට ප්‍රත්‍යය වන බව පැහැදිලිව දක්වා ඇති බැවිනි.





**මව, පියා ඒ ඒ පුද්ගලයින් හඳුනාගැනීම වැරදිද?**

එකම දෙයක් කෙරෙහි විවිධ පුද්ගලයන්ට විවිධ හැඟීම් පහළ වෙනවා. ඒ ඒ අය ලබා ඇති අත්දැකීම් අනුව මතකය අනුවද යමක් හෝ යම් පුද්ගලයෙක් මුණගැසුනුවිට පහළ වන හැඟීම් විවිධයි. එකම පුද්ගලයා කෙරෙහි කෙනෙක් තම ගුරුවරයා ලෙස හඳුනා ගනී. තව කෙනෙක් තම පුත්‍රයා ලෙස හඳුනාගනී.

එකම ලේ මස් ගොඩක් විවිධ අයුරින් හඳුනාගැනීම වැරදියි නේද?

මේ කථාව විදර්ශනාවට හොඳයි වගේ පෙනුනට කවුරුහරි මෙහෙම ඇහුවොත් එතකොට භික්ෂුවක් තම ආචර්යවරයා හඳුනාගන්න එක. අතීතයේ රහතන් වහන්සේලා බුදු හිමියන් දකින විට හඳුනාගෙන ගරු බුහුමන් නොකළේද කියලා?

මේ කෘතිය තුළ තිබූ විවරණය ඔස්සේ ඔබට පැහැදිලි ඇති දෘෂ්ටි ගතිකව හඳුනා ගැනීමයි වැරදි. දෘෂ්ටි ගතික නොවී හඳුනාගන්නා ආකාරයක් තියෙන්න ඕනා. මේ හඳුනා ගැනීම තමන් අතින් දාගත්තා කියලා හිතෙන්නේ අතීත අත්දැකීම් හරියට ත්‍රිලක්ෂණයට නැංවූයේ නැති නිසා.

අතීත සළායතන අත්දැකීම්වල කරකැවිලි වර්තමාන මොහොතට බලපාන ආකාරය මේ සංඥා විවිධත්වයට එක්තරා හේතුවක් වුනා. ඒ අතීත අවස්ථාවල අත්දැකපු රූප, ශබ්ද, ගන්ධ ආදිය ගත්තහම ඒවා කාටවත් අයිති නැති ස්වභාවධර්මයෝ. අතීත චක්ඛුවිඤ්ඤාණ සෝතවිඤ්ඤාණ ආදිය හටගන්න පාදක වූ ඇස් කන් ආදියත්, සතර

මහාභූතයන් මත පිහිටලා හටගත් ඒවා. විවිධ ආහාරවලින් විවිධ කර්ම ශක්තින්ගෙන් හටගත් ඒවා. ඉතින් ඒ ඇසත් රූපත්, කණත් ශබ්දත්.... ආදිය නිසා හටගත් අත්දැකීම්වල ඔබට ආවේණික බවක් නෑ. දැන් ඒ කරකැවිලි ප්‍රත්‍යවෙලා, උපනිශ්‍රය වෙලා වර්තමානයේ එළඹසිටින කාගේහරි ශාරීරික රූපයකුත් අරමුණු වෙලා, සිතක් පහළ වෙනකොට එතනදි හටගන්නා සංඥාවත් , අර මව, පියා ආදිය ලෙසින් හඳුනාග න්න බව, අන්න එහි ඔබට ආවේණික බවක් නෑ. ඒකත් ස්වභාව ධර්මයක්.

විඤ්ඤාණවාදයට නැඹුරු වෙච්ච උදවිය නිතර කියන කථාවක් තියෙනව. මේ සියළු දේ බොරුවක් සියළු දේ අතහැරිය යුතුයි. සියළු දෘෂ්ටි අතහැරිය යුතුයි. කුසලයත් අතහරින්න ඕනෑ කියලා. කුසලය අතහරින්න කියනකොට මේ කාරණය අමතක කරන්න එපා. දක්‍ෂ විදර්ශනා යෝගියෙක් සම්මා දෘෂ්ටිය, විදර්ශනා ඤාණ, කුසල සිතිවිලි ඒවා අල්ලාගන්නේ නෑ තමයි. හැබැයි ඒවා වඩනවා. අකුසලය නම් අල්ලාගන්නෙත් නෑ. වඩන්නෙත් නෑ. ඒ අකුසලය ප්‍රහාණය කරනවා. අතහැරීම කරන්නේ පුද්ගලයෙක් නොවෙයිනේ. සිත හටගත්ත වේලාවක සිත තුළ සිද්ධ වන දෙයක් නේ. අන්න ඒ සිතටත් කියන්නේ කුසල සිතක් කියලා.

ඉතින් මේ කෘතිය තුළ විඤ්ඤාණවාදය ගැන කථා කළා බෙදුම්වාදය ගැන කථා කලා. නමුත් මට අවශ්‍ය වුනේ ඒවා ගැන කියලා දෙන්නම නෙමෙයි.





අනිත්‍ය ස්වභාවය ගැන අනාත්ම ස්වභාවය ගැන විදර්ශනා කළ යුතු නොකළ යුතු ආකාරයක් ගැන පාඨකයන්ට යම් අවබෝධයක් ලබාදෙන්න. ස්වල්ප වශයෙන් හරි අනිත්‍ය මෙනෙහි කිරීම බොහොම වටිනවා කියලා කියන්න. අනිත්‍යතාවය මෙනෙහි කිරීම ආත්ම විශ්වාසයෙන් යුතුව ඒ පිළිබඳ වටිනාකමක් දීලා කරන්න පුළුවන් වෙනවා නම් එයයි අපේක්ෂා කළේ.

සක්මන් කරමින් ජීවිතයේ අත්දකින කායික මානසික දේවල් අනිත්‍ය ලෙස මෙනෙහි කරන්න පුළුවන්. බුද්ධ වන්දනා කරනකොට අනිත්‍යතාවය ඉස්මතු වන ගාථා සජ්ජායනා කරමිනුත් පුළුවන්. ජීවිතයේ අනිත්‍යතාවය ගැන අනිත් අයත් එක්ක නිතර කථාකරන්න. අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්මය දේශනා කරන්න. භාවනාවට ඉඳගෙන අනිත්‍යය මෙනෙහි කරන්න පුළුවන්. සිත සමාධි කර කර අනිත්‍යය මෙනෙහි කරන්න පුළුවන්. අනිත්‍යතාව ගැන සූත්‍ර දේශනා කියවන්න. හටගැනීම නැතිවීම ස්වභාව කොට ඇති ධර්මයන් ගැන කියවෙන අභිධර්ම පිටකය හදාරන්න පුළුවන්.

හරියටම පාර තියෙන්නේ සතර සතිපට්ඨාන දේශනාවේ. ඊට අනුකූලව අනිත්‍ය ගැන සිහි කරන්නත් පුළුවන්. සිහිය පවත්වනවා කියන්නේ බොහෝ දෙනෙක් හිතාගෙන ඉන්න එක නම් නෙමෙයි. වර්තමානයේ වෙන දේවල් බලන් ඉන්න එකම නෙවෙයි. සිහිය ගැන සරල විස්තරයක් අන්තර්ජාලයේ තියෙනවා.

ඉතින් පිංවතුනි මේ මට්ටමට ධර්මය දැනගත්තට පස්සෙ තමන්ගේ දියුණුවට බාධාවන්නේ ප්‍රධාන වශයෙන් එක කාරණයක්.

ඒක තමයි ප්‍රමාදය.

**''නාහං භික්ඛවේ අඤ්ඤං ඒකධම්මම්පි සමනුපස්සාමි යේන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති. උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවේ පමාදෝ''**

අංගුත්තර නිකාය -- ඒකක නිපාතය

'' මහණෙනි නූපන්නාවූ අකුසල ධර්මයන්ගේ ඉපැද්මටත් උපන්නාවූ කුසල ධර්මයන්ගේ පරිහානියටත් මේ ප්‍රමාදය තරම් තවත් කාරණයක් නොදකිමි. ''

ඒකියන්නේ කුසලය දියුණු කිරිම පසුවට කල් දැම්මොත්, පස්සෙ කරනවා කියලා හිටියොත් මෙ උතුම් අවස්ථාව මඟ හැරෙන්න පුළුවන්.

සත්ධර්මය තවමත් ජීවමානයි. ත්‍රිපිටක ධර්මය තුළ උතුම් ප්‍රතිපදාව මනාව දේශනාවෙලා තියෙනවා. අප්‍රමාදව කුසල් දහම් සම්පාදනය කරගනිත්වා.

තෙරුවන් සරණයි





# අධෝ ලිපි

## 1 : යමක සූත්‍රයේ සරල පරිවර්තනය

මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සැවත් නුවර සමීපයේ ජේතවන නම් වූ අනේපිඩු සිටුගේ ආරාමයේ වැඩ වෙසෙති.

එකල්හි යමක නම් භික්ෂුවකට "රහත් මහණ කය බිඳීයාමෙන් සිඳේද වැනසේද මරණින් මතු නොවේද ඒ ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද දහමක් මම දනිමියි '' මෙබඳු පාප දෘෂ්ටියක් උපන්නේය.

බොහෝ භික්ෂූහු යමක නම් මහණට මෙවන් පාප දෘෂ්ටියක් උපන්නේ යැයි ඇසූහ : යම්සේ රහත් මහණ කය බිඳීමෙන් සිඳේද, වැනසේද, මරණින් මතු නොවේද භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ දේශනා කරන ලදැයි ලෙසිනි.

ඉක්බිති එම භික්ෂූහු යමක භික්ෂුව යම් තැනකද එතැනට එළඹ ඔහු සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා සිදු කොට එක් පසෙක ඉඳගත්හ. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් යමක තෙරුන්ට මෙසේ කිහ. ඇත්තද මේ යමකය ඔබට මේ ආකාරයේ පාප දෘෂ්ටියක් උපන්නේද? " යම්සේ භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්මයට අනුව රහතන් වහන්සේ කය බිඳීමෙන් සිඳේ වැනසේ මරණින් මතු නොවේ යැයි. ''

එසේය ඇවැත්නි. යම් සේ භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන ලද ධර්මය දක්නේ ද (ඊට අනුව) රහතන් වහන්සේ කය බිඳීමෙන් සිඳීයයි, විනාශවෙයි, මරණයෙන් මතු නොවේ.

ඇවැත්නි, යමකය එසේ කියන්න එපා. භාග්‍යවතුන් වහන්සේ අබ්බවා කියන්න එපා. භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා කීම හොඳ දෙයක් නෙමෙයි. භාග්‍යවතුන් වහන්සේ '' රහතන් වහන්සේ කය බිඳීමෙන් සිඳේ වැනසේ. මරණයෙන් මතු නොවේ යැයි '' කියා නැහැ.

එළෙසද එම භික්ෂූහු විසින් යමක හිමියන්ට කියන කල්හි එළෙසින්ම එම පාප දෘෂ්ටිය තදින් අල්ලාගෙන '' භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය යම් සේ මම දනීද ඊට අනුව රහත් මහණ කය බිඳී මරණින් මතු නොවේ. වැනසේ යයි ම කියයි. ''

යම් කලෙක ආයුස්මත් යමක තෙම එම පාප දෘෂ්ටියෙන් ගලවා ගන්නට එම භික්ෂුන්ට නොහැකි වූයේද ඔවුන් සැරියුත් ස්වාමීන් වහන්සේ වෙත පැමිණියහ. පැමිණ ආයුස්මත් සැරියුත් හිමියන්ට මෙලෙස කීහ. ඇවැත්නි, සාරිපුත්තයනි, යමක යැයි නම් ඇති භික්ෂුවකට මෙවන් පාප දෘෂ්ටියක් ඉපදිලා යම් සේ භාග්‍යවතුන් වහන්සේ දෙසන ලද ධර්මය මම දනීද ඊට අනුව රහතන් වහන්සේ කය බිඳීමෙන් සිඳේ වැනසේ, මරණයෙන් මතු නොවේ කියලා. ඉතින් ආයුෂ්මත් සැරියුත් හිමියන් යමක භික්ෂුවට අනුකම්පාවෙන් එම භික්ෂුව වෙත වැඩියොත් හොඳයි. නිහඬ බවින් සැරියුත් හිමියන් එය ඉවසූහ.

ඉක්බිති සැරියුත් තෙරණුවෝ හවස් වරුවෙහි සමවතින් නැගී සිටියේ යම් තැනක යමක තෙමවේද එතනට එළඹුනේය. එළඹ පිළිසඳර කථා නිමකොට එක්පසෙක හුන්නේය. එක්පසෙක සිටි සැරියුත් හිමියන් අයුස්මත් යමකගෙන් මෙසේ විචාළේය. ඇත්තද මේ ඔබට යමකය මෙවන් පාප දෘෂ්ටයක් ඉපදුනාද ? ''යම් සේ භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ ධර්මය මම දනිද ඊට අනුව ඛීණ





ආස්‍රව භික්ෂුව කය බිඳීමෙන් සිඳී වැනසේ මරණින් මතු නොවේ කියා.''

ඇවැත්නි "යම්සේ රහත් මහණ කය බිඳීමෙන් සිඳේද වැනසේද, මරණින් මතු නොවේද, භාග්‍යවතුන් වහන්සේ එසේ දේශනා කරන ලද ධර්මය මම දනිමි "

ඇවැත්නි යමකය කුමක්ද හැඟෙන්නේ?" රූපය (ශරීරය) නිත්‍ය ද අනිත්‍ය ද?

අනිත්‍යයි ඇවැත්නි

යමක් අනිත්‍යද එය දුකක් ද සැපක් ද?

දුකක් ඇවැත්නි

යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස්වන (විපරිණාම) ස්වභාව ඇත්නම් එය මගේය, එය මම වෙමි, එය මගේ ආත්මය යැයි දක්නට සුදුසුද ?

නැතමය ඇවැත්නි

වේදනා -සංඥා, සංස්කාර, විඤ්ඤාණය නිත්‍ය ද අනිත්‍යද? අනිත්‍යයි ඇවැත්නි

යමක් වනාහි අනිත්‍ය නම් එය දුකක්ද සැපක්ද?

දුකක් ඇවැත්නි

යමක් අනිත්‍ය, දුක් පෙරළෙන ස්වභාව ඇත්නම් එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මය යැයි දක්නට සුදුසුද?

නැතමය ස්වාමීනි

එබැවින් ඇවැත්නි යමකය අතීත අනාගත වර්තමානවූ අධ්‍යාත්මික හෝ බාහිර හෝ ඕලාරික හෝ සියුම් හෝ

හීන හෝ ප්‍රණීත හෝ යම් රූපයක් ඇත්ද දුර හෝ ළග හෝ යම් රූපයක් ඇත්ද ඒ සියලු රූප " ඒවා මගේ නෙමෙයි, එය මම නොවෙමි, එය මාගේ ආත්මය නොවේ යැයි තත්වාකාරයෙන් මනා නුවණින් දත යුතුයි. යම්කිසි වේදනාවක් --පෙ--සංඥාවක් --පෙ-- සංස්කාරයක් --පෙ- -යම්කිසි අතීත අනාගත වර්තමාන අධ්‍යාත්මික හෝ බාහිර ඕලාරික හෝ සියුම් හීන හෝ ප්‍රණීත දුර හෝ ළග යම් දැනීමක් (විඤ්ඤාණයක්) වේද ඒ සියල්ල "ඒ මාගේ නෙවෙයි, ඒ මම නොවෙමි, එය මගේ ආත්මය නොවේ " යැයි තත්වාකාරයෙන් මනා නුවණින් දතයුතු.

ඇවැත්නි එසේ දකින ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි කළකිරෙයි. වේදනාවෙහි කළකිරෙයි, සංඥාවෙහි කළකිරෙයි, සංස්කාර කෙරෙහි කළකිරෙයි, විඤ්ඤාණයෙහි කළකිරෙයි. කළකිරුනේ නොඇලෙයි නොඇලුනේ මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යැයි ඤාණය වෙයි. ජාතිය ක්‍ෂය විය. බ්‍රහ්මචරියාව වැස නිමවන ලදි. කළයුතු දේ කරණ ලදි. අර්ථය පිණිස අනෙකක් නැතැයි නන් අයුරින් දැනගනී.

"ඇවැත්නි යමකයෙනි කෙලෙසද හිතන්නේ, රූපය තථාගතයන් (රහතන් වහන්සේ) කියා දක්නෙහිද ? ''

නැතමය ස්වාමීනි.

"වේදනාව-සංඥාව-සංඛාර-විඤ්ඤාණය තථාගතයන් යැයි දක්නෙහිද ? ''

නැත ස්වාමීනි.

''රූපයෙහි රහතන් වහන්සේ ඇතැයි හැඟෙන්නෙහිද? ''

නැත ස්වාමීනි.

''රූපයෙන් පරිබාහිරව රහතන් වහන්සේ ඇතැයි හැඟෙන්නෙහිද''





නැත ස්වාමීනි

''වේදනාවෙහි -- පෙ -- වේදනාවෙන් පරිබාහිරව -- සංඥාවෙහි -- සංඥාවෙන් පරිබාහිරව -- සංස්කාරයෙහි -- සංස්කාරයෙන් පරිබාහිරව -- විඤ්ඤාණයෙහි -- විඤ්ඤාණයෙන් පරිබාහිරව රහතන් වහන්සේ දක්නෙහිද? ''

නැත ස්වාමීනි.

''ඇවැත්නි යමකයිනි... රූපය, වේදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාණය (මේ සියල්ල) රහතන් වහන්සේ යැයි දක්නෙහිද ? ''

නැත ස්වාමීනි.

''ඇවත්නි යමකයිනි කුමක් හැඟෙන්නේද? රූප නොවන වේදනා නොවන සංඥා නොවූ, සංස්කාර නොවූ විඤ්ඤාණ නොවූ යමක් රහතන් වහන්සේ යැයි දක්නෙහිද? ''

නැතමය ඇවැත්නි

ඇවැත්නි යමකය කෙළෙස හැඟෙත්ද? රූප වේදනා සංඥා, සංස්කාර විඤ්ඤාණය රහතන් වහන්සේ යැයි දක්නෙහි ද?

නැතමය ඇවැත්නි.

මෙහිලා ඔබට ඇවැත්නි, යමකය දුටුදැහැමියෙම (ඇස්පනාපිටම) සත්‍ය වශයෙන් ස්ථිරසාර වශයෙන් රහතන් වහන්සේ විද්‍යාමාන නොවන කල්හි "යම්සේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය දන්නේද ඒ අනුව ඛීණ ආස්‍රව භික්ෂුව කය බිඳීමෙන් සිඳේද වැනසේද, මරණයින් මතු නොවේ." යැයි, ඔබගේ කීම සුදුසුද?

ඇවැත්නි සාරිපුත්තය පෙර මනාව නොදකින කල්හි එවන් පාප දෘෂ්ටියක් මා කෙරෙහි වූයේය. ආයුෂ්මත් සැරියුත්

තෙම ගේ මෙම ධර්ම දේශනනාව අසා එම පාප දෘෂ්ටිගතය මා කෙරෙන් පහව ගියේය. මා විසින් ධර්මයද අවබෝධ කරන ලද්දේය.

ඉදින් ඇවැත්නි යමක ඔබගෙන් මෙලෙස ඇසුවොත් "යම් ඒ රහතන් වහන්සේ කෙනෙක් වේද ඔහු කය බිඳී මරණයින් මතු කුමක් වෙත්ද? මෙසේ ඇසුවොත් යමකය ඔබ කුමක් කියන්නෙහිද?

ඉදින් මගෙන් ඇවැත්නි මෙහෙම ඇසුවොත්. '' යම් ඒ රහතන් වහන්සේ කෙනෙක් වේද ඔහුට කය බිඳී මරණයින් කුමක් වන්නේද යි කියා ? එලෙස ඇසුවොත් මම මෙසේ ප්‍රකාශ කරන්නෙමි. '' රූපය ඇවැත්නි අනිත්‍යයයි. යමක් අනිත්‍යද එය දුකයි, යමක් දුකද එය නිරුද්ධ විය. අස්ථයට ගියේ යැයි. එලෙස ඇසුවොත් එසේ කියන්නෙමි.

ඇවැත්නි යමක හොඳයි, බොහොම හොඳයි.

ඇවැත්නි යමකට ඔබට උපමාවක් කියන්නම් මේ අර්ථය තවත් ප්‍රකට කරගැනිමට.

ඇවැත්නි යමකය ආඪ්‍ය වූ මහත් ධන ඇති මහත් භෝග ඇති ආරක්ෂා සම්පන්න වු ගෘහපතියෙක් හෝ ගෘහපති පුතෙක් හෝ වේද, ඉදින් ඔහුගේ අනර්ථය කැමති අයහපත කැමති නිදහස නොකැමති දිවි තොර කරනු කැමති කිසියම් පුරුෂයෙක් උපදනේය. ඔහුට මෙබදු සිතක් වන්නේය. '' මේ ගෘහපති තෙම හෝ ගෘහපති පුත්‍රයා ආඪ්‍යය. මහත් ධන ඇත්තේය. මහත් භෝග ඇත්තේය. ආරක්ෂා සම්පන්නය. මැඩ දිවි තොර කරන්නට පහසු නොවේ. මම ඇතැළට පිවිස දවි තොර කරන්නෙම් නම් මැනවයි ''යැයි. හෙතෙම ගෘහපති තෙම හෝ ගෘහපති පුත්‍රයා වෙත එළඹ මෙසේ





කියන්නේය. '' හිමියනි ඔබට උපස්ථාන කරන්නට කැමති '' යැයි . ඒ ගෘහපති තෙම හෝ ගෘහපති පුත්‍රයා ඔහු ලවා උපස්ථාන කරවා ගන්නේය.

හෙතෙම පළමු නැගී සිටින්නේය. පසුව නිදන්නේය. කටයුතු හොයා බලා කරන්නේ, ප්‍රිය වදන් කියනුයේ මනාප ලෙස හැසිරෙන්නේය. ඔහුව ගෘහපති තෙම මිතුරෙකු ලෙස අදහන්නේය. සහෘදයෙකු ලෙස අදහන්නේය. ඔහු කෙරෙහි විශ්වාසයට පැමිණෙන්නේය. ඇවැත්නි යම් කලෙක ඒ පුරුෂයාට '' මේ ගෘහපති තෙම තමා කෙරෙහි ඉතා විස්වාස ඇත්තේ යැයි'' අදහස් වන්නේද එකල්හි ඔහු තනිවූ විටක තියුණු සැතකින් දිවි තොර කරන්නේය.

කුමක්ද හිතෙන්නෙ ඇවැත්නි යමකය , යම් කලෙක ඒ පුරුෂයා ගෘහපති තෙම වෙත එළඹ මෙසේ කීවේද, '' හිමියනි ඔබට උපස්ථාන කරන්නට කැමති '' යැයි එකල්හිද ඔහු වධකයෙකුමය. වධකවූ ම ඔහු මාගේ වධකයා යැයි නොදත්තේය. යම් කලෙක ඔහු පළමු නැගී සිටිමින් පසුව නිදමින් කටයුතු හොයා බලා කරමින්, ප්‍රිය වදන් කියනුයේ මනාප ලෙස හැසිරුනේද එකල්හිද ඔහු වධකයෙකුමය. වධකවූ ම ඔහු මාගේ වධකයා යැයි නොදත්තේය. යම් කලෙක ඔහු තනිවූ විටක තියුණු සැතකින් දිවි තොර කලේද එකල්හිද ඔහු වධකයෙකුමය. වධකයකුම වූ ඔහු මාගේ වධකයා යැයි නොදත්තේ නොවේද,

එසේය ඇවැත්නි.

මෙළෙසම ඇවැත්නි , ආර්යයන් නොදකින අර්ය ධර්මයෙහි දක්‍ෂ නොවූ, ආර්ය ධර්මයෙහි නොහික්මුනු සත්පුරුෂයන් නොදකින සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ නොවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනු අශ්‍රුතවත් සාමාන්‍ය

මිනිසුන් රූපය ආත්මය ලෙස දකී. . . (විසි ආකාර සක්කාය දිට්ඨිය). ඔහු රූපය අනිත්‍යයැයි අනිත්‍ය වූ රූපය, තතු සේ නොදනියි. වේදනාව අනිත්‍යයැයි අනිත්‍ය වූ වේදනාව, තතු සේ නොදනියි. සංඥව අනිත්‍යයැයි අනිත්‍ය වූ සංඥව , තතු සේ නොදනියි. සංස්කාර අනිත්‍යයැයි අනිත්‍ය වූ සංස්කාර, තතු සේ නොදනියි. විඤ්ඤාණය අනිත්‍යයැයි අනිත්‍ය වූ විඤ්ඤාණය , තතු සේ නොදනියි.

දුක් වූ රූපය දුක් වූ රූපය යැයි තතු සේ නොදනියි. දුක් වූ වේදනාව දුක් වූ වේදනාව යැයි තතු සේ නොදනියි. දුක් වූ සංඥව දුක් වූ සංඥව යැයි තතු සේ නොදනියි. දුක් වූ සංස්කාර දුක් වූ සංස්කාර යැයි තතු සේ නොදනියි. දුක් වූ විඤ්ඤාණය දුක් වූ විඤ්ඤාණය යැයි තතු සේ නොදනියි.

අනාත්ම වූ රූපය අනාත්ම වූ රූපයයැයි තතු සේ නොදනියි.-----පෙ-----

සකස්වූ(සංඛතං) රූපය සකස් වූ රූපයයැයි තතු සේ නොදනියි.-----පෙ-----

වධක වූ රූපය වධක වූ රූපය යැයි තතු සේ නොදනියි.-----පෙ---- වධක වූ විඤ්ඤාණය වධක වූ විඤ්ඤාණය යැයි තතු සේ නොදනියි.

ඔහු රූපයට එළඹෙයි, අල්ලාගනියි, තමන් යැයි තදින් පිහිටයි. වේදනාවට එළඹෙයි, අල්ලාගනියි, තමන් යැයි තදින් පිහිටයි. සංඥාවට එළඹෙයි අල්ලාගනියි තමන් යැයි තදින් පිහිටයි. ---- සංස්කාරයට--- විඤ්ඤාණයට ---- ඔහු එළඹුනාවූ, අල්ලාගත්තාවූ, මෙම පංච උපාදානස්කන්ධයෝ දීර්ග කාලයක් අහිත පිණිස දුකපිණිස පවති .





ඇවැත්නි, ආර්යයන් දකින අර්ධ ධර්මයෙහි දක්‍ෂ වූ, ආර්ය ධර්මයෙහි හික්මුනු සත්පුරුෂයන් දකින සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි හික්මුනු ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා රූපය ආත්මය ලෙස නොදකී....... (විසි ආකාර සක්කාය දිට්ඨිය නොව). ඔහු රූපය අනිත්‍යයැයි අනිත්‍ය වූ රූපය, තතු සේ දනියි. වේදනාව අනිත්‍යයැයි අනිත්‍ය වූ වේදනාව, තතු සේ දනියි. සංඥව අනිත්‍යයැයි අනිත්‍ය වූ සංඥව, තතු සේ දනියි. සංස්කාර අනිත්‍යයැයි අනිත්‍ය වූ සංස්කාර, තතු සේ දනියි. විඤ්ඤාණය අනිත්‍ය යැයි අනිත්‍ය වූ විඤ්ඤාණය, තතු සේ දනියි.

දුක් වූ රූපය දුක් වූ රූපයයැයි තතු සේ දනියි. දුක් වූ වේදනාව දුක් වූ වේදනාවයැයි තතු සේ දනියි. -----පෙ---

අනාත්ම වූ රූපය අනාත්ම වූ රූපයයැයි තතු සේ දනියි.-----පෙ----

සකස් වූ රූපය සකස් වූ රූපයයැයි තතු සේ දනියි.-----පෙ----

වධක වූ රූපය වධක වූ රූපයයැයි තතු සේ දනියි.-----පෙ---- වධක වූ විඤ්ඤාණය වධක වූ විඤ්ඤාණය යැයි තතු සේ දනියි.

ඔහු රූපයට නොඑළඹෙයි, අල්ලා නොගනියි, තමන් යැයි තදින් නොපිහිටයි. වේදනාවට නොඑළඹෙයි අල්ලා නොග නියි තමන් යැයි තදින් නොපිහිටයි. සංඥාවට නොඑළඹෙයි අල්ලා නොගනියි තමන් යැයි තදින් නොපිහිටයි. ---සංස්කාරයට--- විඤ්ඤාණයට ---- ඔහු නොඑළඹුනාවූ අල්ලා නොගත්තාවූ පංචඋපාදානස්කන්ධයෝ දීර්ග කාලයක් හිත සුව පිණිස පවතී.

## 2. නාම ධර්ම සහ සතර අරූප ස්කන්ධයන්

නාම - රූප වලින් නාම යන්නෙන් මෙම කෘතිය තුළ බොහෝවිට අදහස් කරන්නේ සතර අරූප ස්කන්ධයන්ය, වේදනා සංඥා සංස්කාර විඤ්ඤාණ යන ස්කන්ධ සතරයි. සමහර සූත්‍රවල නාම යනුවෙන් ඵස්ස, වේදනා, සංඥා, මනසිකාර, චේතනා කියන ධර්ම පහ සඳහන් වෙනවා. අභිධර්ම පිටකය තුළ නාම කියන කුලකයට සතර අරූප ස්කන්ධත් සංග්‍රහ කරනවා. සමහර සූත්‍ර පාඨවලිනුත් නාම යන්නෙන් විඤ්ඤාණයත් ඇතුළත් කළ බව පෙනෙනවා.

**''නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සෝ ''  කලහ විවාද සූත්‍රය -- සුත්ත නිපාතය**

"නාමයත් රූපයත් නිසා ස්පර්ෂය වෙතියි."

ස්පර්ෂය හටගැනීමට විඤ්ඤාණයත් ප්‍රබල හේතුවක් බැවින් මෙතැන්හි විඤ්ඤාණය නාම යටතේ සංග්‍රහ වූ බවයි පෙනෙන්නෙ.

**"අච්ඡෙච්ඡි තණ්හා ඉධ නාම - රූපේ"**

**'' මේ නාම රූපය කෙරෙහි තණ්හාව දුරු කළ ''**

සුත්ත නිපාතය  --  නිග්‍රෝදකප්ප සූත්‍රය

මෙතැනදි නාම හා රූපයන් කෙරෙහි තණ්හාව දුරුකළ රහතන් වහන්සේ කෙනෙක් ගැනයි කියවුනේ. ඵස්ස, වේදනා ආදි මානසික ධර්ම පහට පමණක් තණ්හාව දුරුකිරීමක් නොගැළපේ.





**අංගුත්තර නිකායේ නවක නිපාතයේ සමිද්ධි සූත්‍රයේ:**

කුමක් අරබයා සංකල්ප විතර්කයෝ උපදින්නේ දැයි සැරියුත් හිමියන් සමිද්ධි හිමියන්ගෙන් විමසූ විට

**(නාමරූපාරම්මණා භන්තේ,)**  ''නාම - රූප අරමුණු කොට යැයි''  පිළිතුරු දුනි. සංකල්ප විතර්ක උපදිනුයේ පංචස්කන්ධයම අරමුණු කොට බැවින් එකල භික්ෂූන් කෙටි ව්‍යවහාරයක් ලෙස ඒ සඳහා නාම  - රූප වචනය යෙදූ බව පෙනේ.

නමුත් පටිච්චසමුප්පාද දේශනයේදි ප්‍රත්‍ය සම්බන්ධය දැක්වීම උදෙසා, විඤ්ඤාණය, නාම ධර්මවලින් වෙන්කොට දැක්විය යුතු විය.

නාම  - රූප ලෙස ද්විධාකරණය පැනවෙන්නේ නාම ධර්ම ආරම්මණයක් ග්‍රහණය කිරීමත් රූප ධර්ම ආරම්මණයකින් තොරව හටගැනීමත් මුල්කොට බව පෙනේ. එසේ ඇතිවිට ආරම්මණ ග්‍රහණයේ මූලිකයාවන විඤ්ඤාණය නාම යන කුලකයට සංග්‍රහ කිරීම වඩාත් උචිතය. එනම් ආරම්මණයට නැමෙන අර්ථයෙනි.

ධර්මවල නාමකරණයට හේතුවූ විවිධත්වය පැනවෙනුයේ ඵස්ස, වේදනා, සංඥා, මනසිකාර, චේතනා යන ධර්මයන්ගෙන් යැයි සැළකීමද උචිත නොවේ.

කෘතිය තුළ පෙර සදහන් කළ පරිදි ව්‍යවහාර නානත්වය, සංඥානානත්වය, මත බවත් සංඥානානත්වය ධාතු නානත්වය මත බවත් දේශිතය.

උදාහරණයක් ලෙස ඇස පිහිටි තැනට මිනිසුන් මස නොකියා ඇස යයි කියනුයේ චක්ඛු ධාතුවේ විශේෂිත කෘත්‍ය නිසාය. ලෝකයේ භාවිතා වන විවිධ වචන දිස්වනුයේ කායික මානසික ධර්මවල විවිධත්වය නිසාය. ඉහත ධර්ම පහ නිසා පමණක් නොවේ.

3 : valagamba.net අන්තර්ජාල වෙබ් අඩවියෙ අභිධර්මය නොවන අභිධර්මය කෘතිය තුළින් තවදුරටත් කරුණු සොයාගත හැක.

**4 : ඒතං මම සූත්‍රය --සංයුක්ත නිකාය -- දිට්ඨි වර්ගය**

සැවැත්නුවර නිධානයි. මහණෙනි, කුමක් ඇති කල්හි, කුමක් ඇසුරු කොට, කුමකට බැසගෙන '' මෙය මාගේය, මෙය මම වෙමි , මෙය මාගේ ආත්මය '' යැයි දක්නේද ?

භාග්‍යවතුන් වහන්ස, අපට ධර්මය ඔබ වහන්සේ මුල් කොටයි තියෙන්නෙ ........

මහණෙනි, රූපය ඇති කල්හි, රූපය ඇසුරුකොට (උපාදාය), රූපයෙහි බැසගෙන (අභිනිවිස්ස) ''මෙය මාගේය, මෙය මම වෙමි , මෙය මාගේ ආත්මය '' යැයි දකියි. වේදනාව ඇති කල්හි, වේදනාව ඇසුරු කොට, වේදනාවෙහි බැසගෙන '' මෙය මාගේය, මෙය මම වෙමි , මෙය මාගේ ආත්මය '' යැයි දකියි. සංඥාව ඇතිවිට --- පෙ-- සංස්කාර ඇතිවිට --පෙ-- විඤ්ඤාණය ඇති කල්හි, විඤ්ඤාණය ඇසුරු කොට, විඤ්ඤාණයෙහි බැසගෙන '' මෙය මාගේය, මෙය මම වෙමි , මෙය මාගේ ආත්මය '' යැයි දකියි.

කුමක්ද හැඟෙන්නෙ, මහණෙනි රූපය නිත්‍යද අනිත්‍යද ?

අනිත්‍යයි ස්වාමීනි.





යමක් අනිත්‍ය නම් එය දුකක්ද සැපක්ද ?

දුකක් ස්වාමීනි.

යමක් අනිත්‍යද දුකද වෙනස්වන සුළුද එය ඇසුරු නොකොට '' මෙය මාගේය, මෙය මම වෙමි , මෙය මාගේ ආත්මය '' යැයි දැක්මක්වේද ?

නැතමය ස්වාමීනි.

වේදනා --පෙ-- සංඥා --පෙ-- සංස්කාර --පෙ-- විඤ්ඤාණය නිත්‍යද අනිත්‍යද?

අනිත්‍යයි ස්වාමීනි.

යමක් අනිත්‍ය නම් එය දුකක්ද සැපක්ද ?

දුකක් ස්වාමීනි.

යමක් අනිත්‍යද දුකද වෙනස්වනසුළුද එය ඇසුරු නොකොට '' මෙය මාගේය, මෙය මම වෙමි , මෙය මාගේ ආත්මය '' යැයි දැක්මක්වේද?

නැතමය ස්වාමීනි.

මහණෙනි එසේ දකින ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි කළකිරෙයි. වේදනාවෙහි කළකිරෙයි, සංඥාවෙහි කළකිරෙයි, සංස්කාර කෙරෙහි කළකිරෙයි, විඤ්ඤාණයෙහි කළකිරෙයි. කළකිරුනේ නොඇලෙයි නොඇලුනේ මිදෙයි. මිදුණු කල්හි මිදුණේයැයි ඤාණය වෙයි. ජාතිය ක්‍ෂය විය. බ්‍රහ්මචරියාව වැස නිමවන ලදි. කළයුතු දේ කරණ ලදි. අර්ථය පිණිස අනෙකක් නැතැයි නත් අයුරින් දැනගනී.

මෙම සූත්‍ර පෙළෙහිම දැක්වෙනුයේ නොයෙකුත් මිථ්‍යා දෘෂ්ටි, පංචස්කන්ධය ඇසුරු කොට එය අල්ලාගෙන එහි බැසගෙන හටගන්නා බවයි. අටුවා අර්ථකතනයට අනුගත

වෙමින් '' උපාදාය හා අභිනිවිස්ස '' පද දෙක '' නිසා සහ ප්‍රත්‍යයෙන් '' ලෙස බුද්ධ ජයන්ති ත්‍රිපිටක පරිවර්තනය තුළ සඳහන් වී ඇත. අභිනිවිස්ස යන පාලි පදයෙ අර්ථය බැසගෙන වැදගෙන යනුයි. දෘෂ්ටිසහගත සිතකට එළඹෙන ආරම්මණය ගැනයි මේ කියවෙන්නෙ. සහජාත ධර්මයන් නොවෙයි.

**5 : විභජ්ජවාදය**

අංගුත්තර නිකායෙ තික නිපාතයෙ කථාවස්ථු නම් සූත්‍රයෙහි කථාකිරීමේ ආකාර කිහිපයක් දැක්වේ.

යම් පුද්ගලයෙකුගෙන් ප්‍රශ්නයක් විචාරන ලදුව ඒකාන්ත වශයෙන් පිළිතුරු දියයුත්තෙහි බෙදාදක්වා කියන්නේ නම් එය සුදුසු නොවන බවත් බෙදාදක්වා කිව යුත්තෙහි ඒකාන්ත වශයෙන් කීමද සුදුසු නොවන බවත් දැක්වේ.

'' ------ඒකංස බ්‍යාකරණීයං පඤ්හං න ඒකංසේන බ්‍යාකරෝති, විභජ්ජ බ්‍යාකරණීයං පඤ්හං න විභජ්ජ බ්‍යාකරෝති, පටිපුච්ඡාබ්‍යාකරණීයං පඤ්හං න පටිපුච්ඡා බ්‍යාකරෝති,------ඒවං සන්තායං භික්ඛවේ පුග්ගලෝ අකච්ඡෝ හෝති. ''

මේ නිසා බුදුදහම ඒකාන්ත වශයෙන් විභජ්ජවාදයක් යැයි කිව නොහැක.

6. ආරම්මණ විභාගය පිළිබඳ කරුණු සමුදායක් valagamba.net වෙබ් අඩවියේ අභිධර්මය හා විපස්සනාව මැයෙන් වන වීඩියෝ දේශනා වල අඩංගුයි.





7 : පරමාර්ථ වචනය ත්‍රිපිටකය හා පැරණි ග්‍රන්ථවල යෙදුනු ආකාරය.

**ආරද්ධවිරියො පරමත්ථපත්තියා අලීනචිත්තො අකුසීතවුත්ති ,**

**දළ්හනික්කමො ථාමබලුප්පන්නො ඒකෝ චරේ ඛග්ගවිසාණකප්පෝ**

සුත්ත නිපාතය -- ඛග්ගවිසාණ සූත්‍රය

(පරමාර්ථයට පැමිණීමට ඇරඹූ වීරිය ඇති කුසීත නොවූ නෙහෙකිලුනු සිතැතිව බලසම්පන්නව දෘඪලෙස නික්මුනු කගවේනෙක් මෙන් එකලාව හැසිරෙන්නේය )

**පඤ්චන්නං ඛන්ධානං නිරොධො පරමත්ථං නිබ්බානන්ති පස්සන්තෝ සම්මත්තනියාමං ඔක්කමති.**

(පංචස්කන්ධයාගේ නූපදීම පරමාර්ථ නිවන යැයි දකින්නේ සම්මත්තනියාමයට බැසගනී.)

**පටිසම්භිදාමග්ගපාළි**